NAOSL

# ප්‍රතිභා

## பிரதிபா PRATHIBHA




විද්‍යුත් සඟරාව

இ-சஞ்சிகை

E-MAGAZINE

**2023**

ජනවාරි ஜனவரி JANUARY



# ප්‍රතිභා
# ப்ரதிபா Prathibha












*Prathibha*
*Volume 2*
**2023**
*JANUARY*

**Hon. Chief Patron**
**Mr. W. P. C. Wickramaratne**
**Auditor General**

**Advisor**
**Mr. S. M. D. S. Sudeesh Rohitha**
**Deputy Auditor General**

**Editor**
**Mrs. M. K. G. Yanika Nandasena**



ISSN 2961-5224

# ජාතික විගණන කාර්යාල පුස්තකාල කමිටුව - 2022/2023

| | | | |
|---|---|---|---|
| 1. | එස්. එම්. ඩී. එස්. සුදීෂ් රෝහිත මයා<br>නියෝජ්‍ය විගණකාධිපති | - | සභාපති |
| 2. | එල්. සමුදිකා ජයරත්න මිය<br>නියෝජ්‍ය විගණකාධිපති | - | සාමාජික |
| 3. | එච්. එම්. යූ. එස්. ඒ. විජේකෝන් මයා<br>සහකාර විගණකාධිපති | - | සාමාජික |
| 4. | ඊ. ඩී. ආශා එල්. එදිරිසිංහ මිය<br>ගණකාධිකාරී | - | සාමාජික |
| 5. | එස්. සංගීති කොඩිප්පිලි මිය<br>විගණන අධිකාරී | - | සාමාජික |
| 6. | ආර්. පී. එස්. රාජපක්ෂ මයා<br>පරිපාලන නිලධාරී | - | සාමාජික |
| 7. | බී. අයි. නදීපිකා පෙරේරා මිය<br>විගණන පරීක්ෂක | - | සාමාජික |
| 8. | ඩබ්. කේ. ඩී. නිරෝෂනී ජයසුන්දර මිය<br>විගණන පරීක්ෂක | - | සාමාජික |
| 9. | එම්. කේ. ජී. යානිකා නන්දසේන මිය<br>පුස්තකාලයාධිපතිනී | - | ලේකම් |

# විගණකාධිපතිතුමාගේ පණිවිඩය



විවිධ ක්ෂේත්‍ර පිළිබඳව දැනුම ඇති පාර්ශවයන් විසින් එකී දැනුම හුවමාරු කරගැනීම එම පුද්ගලයන්ගේ මෙන්ම ආයතනයේ සංවර්ධනයට බලපාන බව මාගේ විශ්වාසයයි. ඒ අනුව යමින් ජාතික විගණන කාර්යාලයේ පුස්තකාල කමිටුව විසින් වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන ‘‘ප්‍රතිභා’’ විද්‍යුත් සඟරාව පිළිබඳව මා තුළ ඇත්තේ ඉහළ පිළිගැනීමකි .විශේෂයෙන්ම ලිපි ද්‍රව්‍යවල මෙන්ම මුදල් හිඟයක් පවතින මෙම කාල වකවානුව තුළ මෙවැනි විද්‍යුත් සඟරාවක් සකස්කර පලකිරීම සුවිශේෂී කටයුත්තක් ලෙස සලකනු ලබන අතර ඒ මඟින් රාජ්‍ය විගණනයට අදාළ විෂය කරුණු මෙන්ම මානව සංවර්ධනයට අදාළ දැනුම බෙදා හදා ගැනීමට උපකාරීවේජාතික විගණන . කාර්යාලයේ සේවය කරන සෑම ක්ෂේත්‍රයකම නිළධාරීන්ට කිසිම බේදයකින් තොරව තම දැනුම සහ හැකියාවන් ඉදිරිපත් කිරීමට ‘‘ප්‍රතිභා’’ විද්‍යුත් සඟරාව හොද තෝතැන්නක් වීමද විශේෂයෙන්ම සතුටට කරුණකි මෙම.‘‘ප්‍රතිභා’’ සඟරාවට විවිධ ලිපි ඉදිරිපත් කරන ලෙස පොදුවේ සියලුම නිළධාරීන්ගෙන් ඉල්ලා සිටිමින් මෙම සඟරාව වසරින් වසර දියුණුවෙන් දියුණුවට පත්වේවායි පතමි.

**ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**

**විගණකාධිපති**

## පුස්තකාල කමිටුවේ සභාපතිතුමන්ගේ පණිවිඩය



ජාතික විගණන කාර්යාල පුස්තකාලය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රතිභා විද්‍යුත් සඟරාවේ දෙවන කලාපය සඳහා මා සුබ පැතුම් එක් කරන්නේ හද පිරි සතුටිනි. මෙවැනි සාහිත්‍ය කටයුතු ආයතනයේ කාර්ය මණ්ඩලය සතු නිර්මානශීලී ලිවීමේ හැකියාව ඔප් නැංවීමට දායක වන අතර ම පුස්තකාලය හා පාඨකයා අතර අවියෝජනීය බැඳීම ඉහළ නැංවීමට ද හේතු වේ. ලිවීමේ කුසලතා වර්ධනය හේතුවෙන් වෙනත් නිර්මාණාත්මක හැකියාවන්ද ඉස්මතු වේ. ඔබ වැඩි වැඩියෙන් ලියන විට ඔබට සිතීමට සිහින දැකීමට සහ අදහස් ගැන මෙනෙහි කිරීමට ඇති හැකියාව වැඩි දියුණු වේ. මේවා ඔබේ ජීවිතයට වැදගත් වන කලා කුසලතා ද වේ.

වර්ථමානයේ වැඩිම ආර්ථික වටිනාකමක් ඇති ලෙස සලකන තොරතුරු / දත්ත ආදිය ගබඩා වන සම්පත් මධ්‍යස්ථානයක් ලෙස පුස්තකාලයේ වැදගත්කම අවධාරණය කිරීමට මෙන් ම එය නව දිශානතියකට හැරවීමටද මෙවැනි නිර්මාණ උපකාරී වේ. එසේම සංකීර්ණ කාර්ය බහුල කාර්යාලීය දිවි පෙවෙතක පවතින ඒකාකාරී සේම වෙහෙසකාරී ස්වභාවය සමනය කර ගැනීමටද මෙවැනි නිර්මාණශීලී කෘති පරිශීලනය කිරීම හා ඒ සඳහා සක්‍රීයව දායක වීම මනා පිටුවහලක් වනු ඇත.
පුස්තකාල කමිටුවේ එක් කාර්යයක් වශයෙන් ප්‍රතිභා විද්‍යුත් සඟරාවේ දෙවන කලාපයද මෙසේ ඔබ වෙත ගෙන ඒමට ලැබීම ඉමහත් සතුටට කරුණකි. මෙම විද්‍යුත් සඟරාව ඉදිරි වර්ෂවලදීද අඛණ්ඩව ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂිත හෙයින් ඒ සඳහා ඔබ සැමගේ සහයෝගය නිර්මාණශීලී දායකත්වය සහ යෝජනා ලැබෙනු ඇතැයි අපි උදක් ම විශ්වාසය පළ කරමු.

ප්‍රතිභා විද්‍යුත් සඟරාවේ දෙවන කලාපය සාර්ථක කර ගැනීමට අනුශාසක දායකත්වය දැක්වූ ගරු විගණකාධිපතිතුමාටද අපගේ ආරාධනාව පිළිගෙන සඟරාවේ පලකිරීම සඳහා විශේෂාංග ලිපි ලබා දුන් කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සරත් විජේසූරිය මහතාට හා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස මහතාට බෙහෙවින් ස්තූතිවන්ත වෙමු. අවසාන වශයෙන් මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට අනුපමේය මෙහෙවරක් කළ ජාතික විගණන කාර්යාලයේ පුස්තකාලයාධිපතිනියටද මෙම සඟරාව සඳහා නන් අයුරින් දායකත්වය සැපයූ සියලු පාර්ශවයන්ටද අපගේ ප්‍රසාදය පල කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමු.

ස්තූතියි!

**එස්. එම්. ඩී. එස්. සුදීෂ් රෝහිත**
**නියෝජ්‍ය විගණකාධිපති**
**(සභාපති - පුස්තකාල කමිටුව)**

# <u>සංස්කාරකගේ සටහන</u>



ඉලෙක්ට්‍රොනික තාක්ෂණයේ සහ සන්නිවේදන විද්‍යාවේ දියුණුවත් සමග බුද්ධිමතා හෝ උගතා යනු පොත් හා ලේඛන විශාල ප්‍රමාණයක් අතර සැරිසරන්නා යන පැරණි අදහසට සංශෝධන එකතු වෙමින් පවතී. අද වනවිට දැනුම ලබාගත හැකි මාර්ග ගනණ වැඩිය. එයින් පහසුවෙන්ම දැනුම තොරතුරු ලබාගත හැකි මාර්ගයක් ලෙස අන්තර්ජාලය ප්‍රමුඛ ස්ථානයක් ගනී. අතීතයේ බෝහෝ පොත්පත් සහ සඟරා කඩදාසිවල මුද්‍රනය කරනු ලැබුවත් ඉලෙක්ට්‍රොනික තාක්ෂණයේ සහ සන්නිවේදන විද්‍යාවේ දියුණුවත් සමග පොත් සහ සඟරා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්කිරීම අතිශයින් ජනප්‍රිය රැල්ලක් බවට පත් වී තිබේ. ඊට ප්‍රධාන හේතුව වී ඇත්තේ කඩදාසි මිල අධික වීමයි. අනෙත් කරුණ ස්මාට්ෆෝන් භාවිතයයි. නූතනයේ ස්මාට්ෆෝන් සහ ටැබ්ලට් වල කියවීමට සුදුසු ආකාරයට ආලෝකය සහ පසුබිම සකසාදෙන ඇප්ලිකේෂන් පැමිණ ඇත. ඇන්ඩ්‍රොයිඩ් සහ ඇපල් ඇප්ස් වශයෙන්ද පොත් කියවන ස්ටෝර්‍රු දැන් කරලියට පැමිණ තිබේ.

වර්තමාන පුස්තකාල හා තොරතුරු සේවා මධ්‍යස්ථානද සම්ප්‍රදායික සේවාවන්ගෙන් ඔබ්බට ගොස් පාඨකයින්ගේ දැනුම හා කුසලතා ප්‍රවර්ධනය කිරීම සඳහා නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගනී. එවන් පසුබිමක ජාතික විගණන කාර්යාල පුස්තකාලය පුස්තකාල හා තොරතුරු සේවා මධ්‍යස්ථානයක් ලෙස වැඩි දියුණු කිරීමේ යෝජනාවලිය යටතේ ''ප්‍රතිභා'' විද්‍යුත් සඟරාවේ දෙවන කලාපය ඔබ වෙත ගෙන එන්නේ ජාතික විගණන කාර්යාල කාර්ය මණ්ඩලයේ නිර්මාණාත්මක ලිවීමේ කුසලතා ප්‍රවර්ධනය කිරීමේ මුලික පරමාර්ථයෙනි.

මෙම කර්තව්‍ය සාර්ථකව නිම කිරීමට මග පෙන්වූ ගරු විගණකාධිපතිතුමන්ටත්, උපදේශකත්වය ලබා දුන් පුස්තකාල කමිටුවේ සභාපතිතුමන්ටත් මාගේ හද පිරි ප්‍රණාමය පුදකර සිටිමි. විශේෂාංග ලිපි ලබා දුන් කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සරත් විජේසූරිය මහතාට හා ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස මහතාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. එසේම ''ප්‍රතිභා'' විද්‍යුත් සඟරාව සඳහා නිර්මාණ දායකත්වය සැපයු ජාතික විගණන කාර්යාල කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ටත් පුස්තකාල කමිටුවේ ගෞරවනීය සාමාජිකයින්ටත් බෙහෙවින් කෘතඥ වෙමි. අවසාන වශයෙන් පූර්වයේ පුස්තකාලය භාරව සිටි විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපතිතුමන්ටත්, වර්තමානයේ පුස්තකාලය භාර පාලන අංශයේ අධ්‍යක්ෂතුමන්ටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමි .

**එම්. කේ. ශිවෝන් යානිකා නන්දසේන**
**වරලත් පුස්කාලයාධිපතිනී**
**(ලේකම් - පුස්තකාල කමිටුව)**

<u>පිටු පෙළ ගැස්ම</u>

**පිටු අංක**

## විශේෂාංග ලිපිය


කියවීමේ චමත්කාරය - මහාචාර්ය සරත් විජේසූරිය 9-12

ස්වදේශ ආර්ථික සංවර්ධනයට හා කළමනාකරණයට අදාළ තොරතුරු නාම භාවිතය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණය - ආචාර්ය ආර්.ඩී. ආනන්ද තිස්ස 13-21


## විෂයානුබද්ධ ලිපි


රාජ්‍ය විගණනය සහ පුද්ගල බද්ධ විමර්ශනය - එස්. එම්. ඩී. එස්. සුදීෂ් රෝහිත 22-25

විගනණයේ දී අවදානම් හදුනා ගැනීම සහ තක්සේරු කිරීම - ඉන්දික සමන්ත 26-30

ප්‍රජා සහභාගිත්ව විගණනය - ජී. ඒ. එම්. අයි. ගුණරත්න 31-33

ශ්‍රී ලංකා ආර්ථික අර්බුදයේ හෙලිනොකළ යථාර්ථය - එච්.එම්.රණසිංහ බණ්ඩාර 34-42

පනතෙන් බලගැන්වෙන ජාතික විගණනය - කාංචනා ලියනආරච්චි 43-45


## දැනුමට ලිපි


විවේචනාත්මක චින්තනය) Critical Thinking) අපගේ ජීවිතයට වැදගත් වන්නේ ඇයි?
- එම්.එන් .අබේසිරි 46-50

ජාතික රතුදත්ත ලේඛනය (National Red List ) - පී.කේ .කන්දෙගෙදර මිය 51-52

පරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය (EIA – Environmental Impact Assessment)
- එම්. ඩී. එච්. මුණසිංහ 53-54

"ශ්‍රම වාසනා අරමුදල" මගින් කම්කරු ජනතාවට සුබසාධනය සැලසෙනවාද ?
- පසන් මනෝහර 55-57

තොරතුරු කළමනාකරණයේ වැදගත්කම - ගිවෝන් යානිකා නන්දසේන 58-68

தேசிய கணக்காய்வும் பொது மக்களின் எதிர்பார்ப்பும - மாஹிர் அசனார 69-72

2018ஆம் ஆண்டின் 19ஆம் இலக்க தேசிய கணக்காய்வுச் சட்டமும் அரசியலமைப்பின் 20ஆம் திருத்தத்தின் பின்னரான அதன் நிலையும - மாஹிர் அசனார 73-80

Enjoy Your Kopi Luwak - D.M.J.P. Kumari 81

## කෙටි කතා


පස් අවුරුදු නිවාඩුව - ඩයනා නිරෝෂනී 82-84


## කවි


කවි සිතුවිලි 86-119


## ඇමුණුම්


ජාතික විගණන කාර්යාලයේ ඉතිහාසය 120-121

මහාචාර්ය සරත් විජේසූරිය

# කියවීමේ චමත්කාරය

### සාහිත්‍ය කියවීම

සාහිත්‍ය කියවන්නේ කුමට ද? සාහිත්‍ය කියවීමේ ප්‍රතිලාභ කවරේ ද?

මේ ප්‍රශ්න දෙක 'හඬ නොනැගෙන ලෙස' බොහෝ තන්හි ඇසෙන බව නොරහසකි.

සාහිත්‍ය කියවන්නේ කුමටද? යන පැනය මතු කරන්නේම ඉන් කිසිම ප්‍රතිලාභයක් නැත යන අදහසෙහි පිහිටා ය. ඇත්ත වශයෙන්ම සාහිත්‍ය කියවීමෙන් 'අතට හෝ සාක්කුවට' ලැබෙන ප්‍රතිලාභයක් නැත. එසේ මුත් සාහිත්‍ය කියවීමේ පුරුද්ද ඇති පුද්ගලයා ජීවනයේ ගැටලුවලට ඔරොත්තු දෙන්නට සමත් - අභියෝගවලදී උපේක්ෂාවෙන් තමන් මුහුණ දෙන නේක විධ ගැටලු විසඳා ගන්නට හෝ ඒවා විඳ දරා ගන්නට සමත් පුද්ගලයෙකු බව පිළිගැනේ. මේ වූ කලී තරමක් සංකීර්ණ කාරණාවකි. ආහාරයක රසය දැනෙනවා ලෙස දැනෙන කරුණක් ද නොවේ.

මේ කෙටි ලිපියෙන් අදහස් කරන්නේ ඉහත ප්‍රශ්නවලට පිළිතුරු දීමට නොව, ඒ ප්‍රශ්න මතුවෙන අවකාශයට අදාළ තත්වයක් ගැන කරුණු දැක්වීම ය.

සාහිත්‍ය කෘතියක් කියවීම යනු මානසික ශ්‍රමයක් වැය කළ යුතු කටයුත්තකි. මානසික ශ්‍රමයක් වැය කිරීම යනු "අභෞතික ප්‍රතිලාභයක්" උරුම වන්නාවූ කටයුත්තකි. මෙහිදී වැදගත් කාරණාවක් වන්නේ මානසික ශ්‍රමයක් වැය කිරීමට පාඨකයා කියවන කෘතිය ඔහුට 'උත්තේජනයක්' සැපයියීමට සමත් වීම ය. සාහිත්‍ය කෘතියක් ඒ උත්තේජනය සපයන්නේ කෙලෙසින් ද?

සාහිත්‍ය කෘතියක් අර්ථවත් විය යුතුවා මෙන්ම රසවත් විය යුතුය.

මේ වැදගත් පාඩම මාර්ටින් වික්‍රමසිංහ අදින් අවුරුදු අසූවකට පමණ පෙර අපට ඉගැන්වූ බව සඳහන් කරනු කැමැත්තෙමි. ඒ ගම්පෙරළිය නවකතාවෙනි.

1924 දී පළ කළ ගැහැනියක් කෘතියේ සිටම ඔහු භාෂාවේ ප්‍රකාශන ශක්තිය ගැන අවධානය යොමු කර – අභ්‍යාස කරමින් 1944 වන විට සිය රචනා ශෛලිය හැඩ ගස්වා ගත් අන්දම හඳුනා ගැනීමට පුළුවන.

පාඨකයා කැමැත්තේ කතුවරයා කියන දෑ අසා සිටින්නට නොවන බවත්, පාඨකයා කැමැත්තේ යමක් සිදු වුණ අන්දම දැකීමට බවත් වික්‍රමසිංහ පෙන්වා දී දුන් අන්දම අපූරුය. ඒ සඳහා කථනය වෙනුවට රූපණයට නිර්මාණකරුවා වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් බව වික්‍රමසිංහ ඉගෙන ගෙන පාඨක සමාජයට ඉගැන්වී ය.

වික්‍රමසිංහ ස්වකීය අත්දැකීම් ප්‍රතිනිර්මාණය පිණිස ඔහුගේ පරිකල්පන ශක්තියෙන් එක් කළ රූපණ විධි ගණනාවක් අද අපට නිරීක්ෂණය කළ හැකිය. එපමණක් නොව, සාහිත්‍ය කෘතියක් නියමාකාරව රසවිඳීමේ දී ද රූපණය ගැන සංවේදී විය යුතු අන්දම වික්‍රමසිංහ පෙන්වා දී ඇත. පැරණි සම්භාව්‍ය ග්‍රන්ථ කිහිපයක් කියවීමට මඟ පෙන්වීමක් ලෙස වික්‍රමසිංහයන් 1941 දී පළ කර තිබෙන **'විචාර ලිපි'** නමැති කුඩා පොත, 'කියවීම හා ආස්වාදනය' විෂයෙහි සිය පරිචය විදහා දක්වන්නකි. සාහිත්‍ය රස විඳීමේ දී පාඨකයා සිතින් මවා ගැනීමක නිමග්න වීම හෙවත් ස්වකීය පරිකල්පන ශක්තිය අවධි කර ගැනීමක නිරුත්සාහකව නිමග්න වේ. මේ වූ කලී කෘතියට මනසින් බැඳීමය. සැබවින්ම එය කෘතියේ සාර්ථක ලක්ෂණයක් හෙවත් කෘතිය පාඨකයාට ලබා දෙන උත්තේජනයට ද අදාළ කාරණාවකි.

### මගේ සාහිත්‍ය කියවීම

මා විරාගය නවකතාව මුළින්ම කියවූයේ සාමාන්‍ය පෙළ පන්තියේ දී ය. එහි නිරූපිත අරවින්ද සහ සරෝජිනී යන චරිත දෙක මගේ මනසේ චිත්‍රණය වූයේ මගේ ඥාති සහෝදරියක හා ඇය ආදරය කළ පුද්ගලයා ඔස්සේ ය. ඉතා සුන්දර තැනැත්තියක වූ ඒ ඥාති සහෝදරිය ඉගෙනීමෙහි දක්ෂ ය. ඇය උසස් පෙළ හදාරන කාලයේ දී ගමේ විසූ නොතාරිස්ගේ ලියන්නෙකුට ආදරය කළේ ය. ඔහුත් හරිම කඩවසම් පුද්ගලයෙකි. මෙහි සඳහන් කළ ඥාති සහෝදරිය පේරාදෙණියට විශ්ව විද්‍යාලයට ඇතුළත්ව උපාධියක් ලබා ගත්තා ය. ඇය පේරාදෙණියේ ඉගෙන ගන්නා කාලයේ ද පෙම් සබඳතාව නොබිඳී පැවතිණි. එහෙත් උපාධිය ලබා පැමිණි ඇය අත්විඳින්නේ කණගාටුදායක අත්දැකීමකි. අර තරුණයා ඇයට පවසන්නේ මා ඔබට නොගැළපෙන බවයි. මගේ ඥාති සහෝදරිය ඒ අදහස පිළිගන්නේ ම නැත. එහෙත් සිදු වන්නේ පුදුම දෙයකි. ලියන්නා උන් හිටි ගමන් අතුරුදන් වේ. ඔහු කිසියම් දවසක තමා සොයා ඒවියයි අපගේ ඥාති සහෝදරිය බලා සිටිය ද ඔහු ආවේම නැත. ඇයට විවාහයක් කර දීමට ඇගේ දෙමාපියන්ට නොහැකි විය. විරාගයේ සරෝජිනී ලෙස අදටත් මගේ මනසේ මැවෙන්නේ මෙහි සඳහන් කළ ඥාති සහෝදරියයි.

විරාගය චිත්‍රපටය නැරඹූ බොහෝ අයගේ මනසේ දැන් සිටින්නේ ශ්‍රීයාණි අමරසේන වුව මට නම් අදටත් ඇය සරෝජිනී නොවේ. එපමණක් නොව ඒ ඥාති සහෝදරිය අත්හැර දමා පළා ගිය පුද්ගලයා මගේ මනසේ චිත්‍රණය වී සිටින අරවින්ද ය. විරාගය චිත්‍රපටයේ අරවින්දගේ චරිතය නිරූපණය කළ සනත් ගුණතිලක මගේ මනසේ චිත්‍රණය වී සිටින අරවින්ද නොවේ. මගේ මනසේ චිත්‍රණය වී සිටින සරෝජනී සහ අරවින්ද ගැන කියන්නට බොහෝ දේ මගේ මතකයෙහි ඇත. මා අත්විඳි අත්දැකීම් සැබවින්ම විරාගය නවකතාව පසුකාලීනව කියවීමෙන් ද වඩ වඩාත් ප්‍රබල විය.

මා විශ්වාස කරන්නේ වික්‍රමසිංහගේ රූපණ විධික්‍රමවල ප්‍රබලත්වය ඊට තුඩු දී ඇති බවයි. එතරම් මැනවින් ඔහු චරිත පාඨක මනසේ සිතුවම් කරන්නට සමත් වූ රචකයෙකි.

### පැරණි ගත්කතුවරු දුටු සැටි

මෙහි ඉහත සඳහන් කළ 'විචාර ලිපි' නම් කෘතියෙහි වික්‍රමසිංහ තමන් කියවූ පැරණි සම්භාව්‍ය ග්‍රන්ථවල චරිත නොව ඒ ග්‍රන්ථ රචකයන් ද මනසින් දකින්නට සමත් වේ. ඒ සඳහා ඔහුට අදාළ වී තිබෙන්නේ ඒ ඒ ලේඛකයන්ගේ රචනා ශෛලීන්ය. මතු දැක්වෙන්නේ වික්‍රමසිංහ මනසින් දුටු 'අමාවතුර' ලියූ ගුරුළුගෝමි පඬිතුමන්ගේ ස්වරූපයයි.

**"ගුරුළුගෝමීන්, පිත් වැඩියන්ට හිමි සිහින් කයක් ද, උකුස්සගේ මෙන් තියුණු නෙත් සඟළක් ද, වඩා පුළුල් නොවූත් පටු නොවූත් නළල් තලයක් ද ඇතිව සිටියකු විය යුතු ය යනු අමාවතුර කියවන කල මගේ සිතට නැඟෙන හැඟීමකි."**

මේ නිගමනයට එළඹෙන්නට වික්‍රමසිංහයන් පෙළඹී තිබෙන්නේ ගුරුළුගෝමීන්ගේ රචනා ශෛලියට ආවේණික ගුණයකි. ඔහු ඒ ගැන සඳහන් කරන්නේ මෙසේය.

**"ඇඳ පැලඳ සැරසුණ ඇතැම් රුවැති කාන්තාවකගේ ඇඳුමෙහි නොසැලකිල්ලෙන් හෝ ඉන්මන් කමින් හෝ ලිහිල්ව ගිය රෙදි පොටක්, රැළි බුරුලක්, සමහර විට විනීතයෙකුගේ සියුම් නෙත් සඟළට අසු වන්නාක් මෙන් සිංහල ගද්‍යයෙහි ද නොසැලකිල්ලෙන්, වෙහෙසීමෙන්, ඉක්මන් කමින්, මැළිකමින්, ලියවුණ පදයක්, වැකියක් හෝ වැනුමක්, විචාරකයෙකුට හසු වෙයි. එ වැනි ඇඳ පලුදු පමණක් නොව, ඔප මට්ටම් නොකළ තැන් ද අනෙක් සිංහල ග්‍රන්ථයන්ගෙන් සොයාගත හැකි වුවත් අමාවතුරෙන් සොයා ගැනීම දුෂ්කරය යි හඟේ. තමාගේ ඇඳුමෙහි, පැලඳුමෙහි, රැළි බුරුලක්, ඇද කුදයක් නොතබා නිවැරදි ලෙස ම ඇඳ පැලඳ ගන්නා විනීත කාන්තාවක මෙන් ගුරුළුගෝමීන් ද, මුල සිට අග දක්වා අමාවතුර භාෂාව පරිසමාප්ත ස්වරූපයෙන්ම නිර්මල කොට නිම කළ හ යි හඟේ."**

අමාවතුර කොතරම් සමීපව නැවත නැවත කියවා තිබෙන්නේ ද යන්න පමණක් නොව, එහි ශෛලියට වික්‍රමසිංහ තදින් ආසක්තව සිටින සැටිය ද මේ විවරණයෙන් විශද වේ. එහිම ඵලයක් ලෙසය ඔහු ගුරුළුගෝමීන්ව මනසින් දකින්නේ.

මතු දැක්වෙන්නේ වික්‍රමසිංහ මනසින් දුටු සද්ධර්මරතනාලිය රචනා කළ ධර්මසේන හිමියන්ගේ ස්වරූපයයි.

**"ධර්මසේන ස්ථවිරයන්, ගුරුළුගෝමීන් වැනි සූක්ෂම බුද්ධියෙන් යුක්ත තාර්කිකයකු නොව ලෝකයෙහි ජඩ පක්ෂය වුව උපෙක්ෂාවෙන් ද, හොඳ පැත්ත සිනාවෙන් හා විනෝදයෙන් ද සැලකූ සෙම් වැඩි තරබාරු දේහයකින් යුතු වෘද්ධතර බහුශ්‍රැතයකු වූ හ යි මම සිතමි."**

සද්ධර්ම රතනාවලිය සමීපව කියවන වික්‍රමසිංහ ධර්මසේන හිමියන් සමඟ මනසින් ජීවත් වන්නට සමත් වූ සේය. මතු දැක්වෙන්නේ ඊට නිදසුනකි.

**"සද්ධර්මරතනාවලි කාර ධර්මසේන ස්ථවිරයෝ, ගැමියන් අතරට බැස ඔවුන් හා එක්ව දොඩමින්, සිනා සෙමින් දිවි පෙවත, හිසින් ගත් බරක් මෙන් නොව, හිස සරසනාවක් මෙන් සලකමින් ජීවත් වූ ප්‍රිය වාදියෙකි. උන්වහන්සේ වීදාගම හිමියන් මෙන් 'කමන නැටුම් කෙළි කවට සිනා දා' යන උවදෙස සිහි කරමින් විසූවකු නොව, තමන් කරා පැමිණි උපාසකයන් හා ගැමියන් සමඟ ද කෙළි කවට තෙපුල් තෙපලීමෙන් සන්තෝෂයෙන් විසූවෙක්ය ය යි සිතිමට අනුබල දෙන්නේ සද්ධර්ම රතනාවලියයි සද්ධර්ම රතනාවලියෙහි සුලභ ඇතැම් කියුම් එවැන්නෙකුගේ කටින් මිස, මනුෂ්‍යාත්ම භාවයෙහි දුර්ගුණ ද, සසර දුක් ද නිතර මෙනෙහි කිරීමෙන් කලකිරී කිපුණකුගේ කටින් නම් ගිලිහිය හැකි නොවේ. රත්නාවලිය කියවන විට මට දැනෙනයේ පුස් කොළ පොත්වල සුවඳ නොව, ජීවනයෙහි, විශේෂයෙන් සිංහල ගැමියන්ගේ ජීවනයෙහි සුවඳ යි."**

මේ වූ කලී 'අමාවතුරට' සේම 'සද්ධර්ම රතනාවලියට' මනසින් බැඳීමෙන් – ලේඛකයන්ගේ රචනා ශෛලීන්ට ආසක්ත වීමෙන් උපන් හැඟීම් වේ. මේ හැඟීම් වූ කලී ශාස්ත්‍රීය වශයෙන් හෝ විද්‍යාත්මකව සනාථ කිරීමට නොහැකි ඒවා ය. මේ වික්‍රමසිංහයන්ගේ පරිකල්පන ශක්තියේ ඵලයන්ම වේ. එනමුත් මේ නිරීක්ෂණ ඉතා ප්‍රබලයයි සිතමි. අමාවතුර කියවන විට අප සිත් තුළත් දැන් වික්‍රමසිංහ දුටු ගුරුළුගෝමීන්ව චිත්‍රණය නොවන්නේ ද? සද්ධර්ම රතනාවලිය කියවන විට  වික්‍රමසිංහ දුටු ධර්මසේන හිමියන් චිත්‍රණය නොවන්නේ ද?

### නොව පැරණිය යස තරුණිය

වික්‍රමසිංහයන්ගේ 'යුගාන්තය' පළ වන්නේ 1949 දී ය. ඒ වන විට ඔහුගේ වයස අවුරුදු පනස් නවයකි. වෙනත් අන්දමකට කියනවා නම් තරුණයෙකු නොවේ. අනෙක් අතට ඒ වන විට ලාංකේය සමාජය තුළ 'සදාචාරය' සම්බන්ධ ගතානුගතික අදහස් තදින් පැවති බව ද කිව හැකිය. කෙසේ වෙතත් චරිත නිරූපණයේ දී වික්‍රමසිංහ ගතානුගතිග දෘෂ්ටිවාද කර පින්නා ගෙන නැත. ඔහු තමන් නිරූපණය කරන චරිතවලට උපරිමයෙන්ම අවංක වී තිබේ. නිදසුනක් යුගාන්තයෙන් දැක්වීමට කැමැත්තෙමි.

**"චමරී බටහිර සභ්‍යත්වයෙන් උකහා ගත හැකි හැම අංගයක්ම පුළුන් කැටියක් දිය උරා ගන්නාක් මෙන් උකහා ගත් තරුණියකි. බටහිර සභ්‍යත්වය ඇගේ හාවභාව ලීලා ද කායික ලක්ෂණ ද සකස් කොට සිය ගුණයෙන් තියුණු කරන්නකි. ඇගේ අඟර දඟර හා රූප සෞන්දර්යය ද විනීත පටලය අතරින් අරවින්දට පෙනෙන්නේ**

විශුද්ධ වේෂයකිනි. ගැමියන් පිට ඔපය නමින් හඳුන්වන ඒ විනීත පටලය තොල් අඳුන්, සුවඳ කල්ක, වත්සුණු, දෙබැමට තුඩු දෙන අඳුන්, නිය රංගය, විසිතුරු සුනිඳු දුහුල්, ආචාර විධි, උගැන්ම යන ආදියෙහි සංයෝගයෙන් සැදුණකි. තොලබ බෝතලය තුළ මුදු මොලොක් නිල් එළියෙන් බැබළෙන කණමැදිරියකු සේ විනීත පටලය තුළ බැබළෙන ඇගේ සෞන්දර්යය, කාමාශාව නගන සුවඳ කරඬුවක් වැන්න. ඉතාම හොඳ සුවඳ පැන් බෝතලය නැවත නැවතත් නැහැයට ළං කොට සන්තෝෂවන්නකු මෙන් ඔහු නැවත නැවතත් චමරී සිහි කළේය. පිටු පා ගමන් කරක කල නැටෙන නීලාගේ උකුළු පෙදෙස වැන්නක් ඔහු එංගලන්තයෙහි දී නුදුටුවේ ය. ලංකාවේ ගැහැනුන්ට තරම් පුළුලුකුළු එගෙලන්තයේ ගැහැනුන්ට නැති නිසා ද? තුනී සාරි පට දෙකකුල් හිරවන සේ ඇඳ පාතින් තද කිරීම නිසා ද ඇතැම් සිංහල ගෑනුන්ගේ උකුළු පෙදෙස් පිපිරෙන තරම් පිම්බෙන්නේ? ඇද තද කොට අඳින ලද දුහුල් පට තුළ නැටුණු නීලාගේ උකුළු පෙදෙස සිහි කළ අරවින්දට ලූනු සිවියක් වැනි පටලයක් ඇති බිත්තරය තුළ වැඩෙන ඉස්ගෙඩියා නිතැතින්ම සිහි වි ය. රට තන පටින් බැඳුණු ඇගේ දෙපියයුරු පට හැට්ටය උස්සාගෙන මතු වී සිටි සැටි මතක් කළ අරවින්දගේ දෙනෙත් සෙමින් පියවිණ."

මේ වැනුම ඔස්සේ තරුණ අරවින්දගේ ජීවන ලාලසාව මැනවින් උද්දීප්ත කිරීමට කතුවරයා සමත් ය. නවසිය හතළිස් නවයේ දී, වයස අවුරුදු පනස් නවයක පුද්ගලයෙකු වශයෙන් මේ චරිත නිරූපණයේ දී දක්වන අපූර්වත්වය යනු චරිතයක අභ්‍යන්තර ගති පැවතුම් කුළු ගැන්වීමේ ලා දක්වන සමත්කම පමණක් නොව නිර්භීතකම ද වේ.

වෛද්‍යවරයෙකු බවට පත්ව ලංකාවට පැමිණි අරවින්ද ගමේ ඇවිදින විට තමන්ගෙන් බෙහෙත් ගැනීමට පැමිණි දිළිඳු කාන්තාවකගේ නිවසට යයි. ඒ නිවසට ගොඩ වදින අරවින්ද ලබන අත්දැකීම, වික්‍රමසිංහ නිරූපණය කරන අන්දම රූපණය සම්බන්ධයෙන් ඔහුගේ පරිචය විශද කරයි. එපමණක් නොව ඔහුගේ නිරීක්ෂණ ශක්තිය හා භාෂාවේ ශක්‍යතාවලින් ලබන අගනා ඵලයන් ගැන ද මනාවූ පාඩමක් උගන්වයි.

"හති දමමින් තමාගෙන් බෙහෙත් ගැනීමට ආ ගැහැනියගේ පැල්පතෙහ බරාඳයෙහි සිටි තරුණිය දෙස අරවින්ද බැලුවේ විස්මයෙනි. මනාව වැඩුණු නීරෝගී දේහයක් ඇති ඈ දුටු අරවින්දට සිහි වූයේ එංගලන්තයෙහි වික්ටෝරියා – ඇල්බර්ට් කටුගෙහි දී තමා දුටු ග්‍රීක දෙවඟනකගේ පිළිරුවකි. ඇගේ දෙකපුල් බඳ ද පළ කරන්නේ පිපිරී පිට වන තරම් වන තරුණ මදයකි. ඇගේ නොසිහින් දෙතොල අඳුන් ගාන ලද කලක මෙන් රත් පැහයෙන් තෙත් ය. නැහය උස් ය, තියුණු ය. දෙඇසෙහි නිල ගැඹුරු ය; ඉඟටිය සිහින් ය.

අරවින්ද ඈ දෙස දෙතුන් වරක්ම බැලුවේ මහත් ආසාවකින් මෙන් කුහුලකිනි. ඔහු, තමා දෙස ආසාවෙන් බලනු දුටු තරුණියගේ දෙනෙත් බිමට හැරිණ; යුගත නිතැතින්ම හැට්ට කර දෙසට ගියේ ය. ඈ තමාගේ ළය වඩාත් වැසෙන සේ හැට්ට කර උස්සා පස්සා පැත්තේ කොනින් අල්ලා පහළට ඇද්දා ය."

මේ අවස්ථාව මනසින් නොදකින පාඨකයෙකු නම් සිටිය නොහැකි ය. ඉතා පරිස්සමට – සීරුවට ඔහු දරිද්‍රතාව ඉහවහා ගිය පැල්පතක වසන අසාමාන්‍ය සුන්දර සිරුරකි දකින්නේ. එය වචනයෙන් කියනවා මෙන් නොව පාඨකයාට පෙන්වීම – දකින්නට සැලැස්වීම අසීරු ය. ඒ අසීරු කටයුත්ත වික්‍රමසිංහ මැනවින් සිදු කරයි. පාඨකයාට කියවීමේ උත්තේජනයක් ඇති වන පරිද්දෙන් සිදු කරයි.  එහිදී කතුවරයා යොදා ගන්නා උපමාව මනරම් ය. භාෂාවේ ශක්‍යතා ඉවහල් කර ගන්නේ නිර්ව්‍යාජ අන්දමින්ය.

මේ තරුණියගේ, මවගේ සුව දුක් විමසා බලන ලද අරවින්දට ඒ වේලෙහි ආසාවක් පහළ වන්නේ තරුණියගේ ඇඟ අල්ලා බලන්නටය. ඔහු ඊට අවස්ථාව උදා කර ගන්නා අන්දම අපූරුය.

"තරුණියගේ ඇඟ අල්ලා බැලීමට සිතූ අරවින්ද නළාව ගෙන පළමුව හති දමන ස්ත්‍රියගේ පිටට ද පපුවට ද තබා බැලීය."

අනතුරුව ඔහු ප්‍රශ්නයක් අසයි.

"නළාව තියා දූගේ ඇඟත් බලන්න ද?"

තරුණියගේ මව නොවළහා පවසන්නේ මෙයයි.

"එමලින්, මේ අපේ දොස්තර හාමුදුරුවන්ට කියා ඇඟ බලවා ගනින්."

තරුණියගේ ප්‍රතිචාරය මෙසේය.

"එමලින් සිනාසෙමින් අත දික් කළා ය. රතු දෙතොල් විවරයෙන් පෙනුණු ඇගේ දත් දුටු අරවින්දගේ කුහුල තවත් වැඩි වී ය.

ඇගේ අත අල්ලා බැලූ අරවින්ද අනතුරුව ඇගේ වම් උරයට යටින් නළාව තැබී ය. වැරෙන් හුස්ම ගන්ට වූ ඇගේ ළය හැට්ටය පුපුරවන තරම් වේගයකින් පිම්බෙමින් හැකිළෙයි. අරවින්ද නළාව තද කෙළේ ඈ 'ඌයි කියද්දැ'යි දැන ගනු පිණිස ය. ඇගේ බඳ මෙළෙක් වුව ද ඇඩි ය; මඳක් නළාව තද කිරීමෙන් රිද්දිය හැකි බඳක් ද නොවේ. ඔහු අනතුරුව ඇගේ ළයට නළාව තැබුවේ ඇඩි ආසාවෙනි. පිම්බුණු ලොකු රබර් බෝලයක් උඩ තැබූ කලක මෙන් නළාව ඇගේ ළය එක වර අල්ලා නොගත්තේය."

වික්‍රමසිංහ මේ අවස්ථාව පාඨකයාගේ මනසෙහි අලංකාර සමීප රූපයක් ලෙසින් චිත්‍රණය කරයි. එහි අවශ්‍යතාව කුමක් ද? දරිද්‍රතාව ඉහවහා ගිය මේ පැලේ මේ තරම් නිරෝගී සිරුරකට හිමිකම් කියන තරුණියක වසන්නේ කෙසේද යන්න ඔහු තුළ හටගත් කුකුසය.

තරුණියගේ පියා දිරා ගිය කයක් ද ඇද පලුදුවලින් තොර නොවූ ඉන්ද්‍රියන් ද ඇති ගැමියෙකු බව අරවින්ද දනියි. ඇගේ මවු ලෙඩ වෙන්නට පෙර හොඳ දේහයක් ද රූ සපුවක් ද ඇති ස්ත්‍රියක වූ බව කියන සලකුණු ඈ කෙරෙන් තවම අතුරුදන් වී නැත. එහෙත් පියාගේ එකම කායික ලකුණුදු ඈ නොලැබුවේ කෙසේ ද?

අරවින්ද පසුව දැන ගන්නේ තරුණියගේ මව වතු පාලකයෙකුගේ අනියම් බිරිඳ ලෙස සිටි බව ය.

මෙහිදී අවධාරණය කිරීමට අපේක්ෂා කළේ සිය වියමන අලංකාර කිරීමට වික්‍රමසිංහ අවස්ථා හා සිද්ධි රූපණය කිරීමේ දී මුල් යුගයේ දී විශද කළ සමත්කම ය. මේ සමත්කම වත්මනේ ලියවෙන බොහෝ නවකතාවල දක්නට නැත.

### ආවේග නිරූපණය

චරිත දෙකක් අතර ගැටුමක් කතාවක දී ගෙනහැර දැක්වීමට කතුවරයෙකුට අසීරු නැත. ඒ සඳහා දෙබස් ඉවහල් කර ගන්නට පුළුවන. එහෙත් කිසියම් චරිතයක චිත්තාභ්‍යන්තරයේ කැළඹීම ඒ චරිතයට ආවේණික පරිද්දෙන් පාඨක මනසේ රූපණය පහසු නොවේ.

වික්‍රමසිංහගේ **'කලියුගය'** නවකතාව පළ වන්නේ 1957 දී ය. මේ නවකතාවේ නිරූපිත පියල්ගේ මව සිය මුනුපුරා බලන්නට මාතර හාමිනේ සමග කොළඹ පැමිණ සිටින අවස්ථාවක් මනාව චිත්‍රණය වේ. පියල්ගේ මව වන වැලිගම හාමිනේ මුනුපුරා වඩා ගන්නට හදන විට සාත්තුකාරිය පවසන්නේ, සබන් දා අත් සෝදා ගෙන දරුවා වඩා ගන්නා ලෙසය. ඉන් ඇගේ සිත රිදේ. අනෙක් කාරණාව නම් ඇය ගම සිට එන්නේ මුනුපුරාගේ කටයුතු සිය ඇතින් කිරීමට ය. ඉන් සන්තෝෂ වීමට ය. එහෙත් සියල්ල ඒ වන විට නන්දා සාත්තුකාරියකට පවරා හමාරය. වැලිගම හාමිනේ තමන් මුහුණ දුන් අත් ඇකිම පුතාට; පියල්ට පැවසුව ද ප්‍රතිඵලයක් නැත. ඔහු නන්දාගේ බවහට අවනතව සිටින සේය. ගැමි කතක වන වැලිගම හාමිනේගේ හිතෙහි හට ගන්නා ආවේගය ක්‍රමයෙන් දරුණු වේ. ඇගේ මනසේ සොබාවය කතුවරයා පාඨකයාට දකින්නට සලස්වන අන්දම විශිෂ්ට ය. මේ වැලිගම හාමිනේගේ චිත්තාභ්‍යන්තරයේ හටගෙන වැඩෙන ආවේගය ඇයට දරා ගත නොහැකි තරම්ය.

මේ ගැමි සමාජයක - වියපත් වුණ කාන්තාවකගේ සිතෙහි සොබාවය පවසන සැටිය.

**"නන්දාගේත් ඇගේ පවුලේත් අතීත තොරතුරු පියල්ගේ මවගේ යටි සිතින් මතුව ජාගර සිතට නඟියිඃ තමාට හිමි සැලකිල්ල ආදරය හා කෘතඥතාව නොනැයක වන සාත්තුකාරියට පුදන ලදැයි යනහැඟීමෙන් හටගත් ඊර්ෂ්‍යාව හා සිත් වේදනාව ද නිසා ඇගේ සිත පාතාල ලෝකයක් වී ය. පාතාලයේ අහුමුළුවලින් එබිකන් පාන කුත්සිතයන් මෙන් සැඟවී සිටි ඇගේ පියවි හැඟීම් නඟින්නට වෑයම් කරයි. නන්දාගේ අතීතය පිළිබඳ තොරතුරු ගිනි මල් වැස්සක් මෙන් ඒ පාතාලය එළිය කරමින් නැග  වහ වහා අතුරුදන් වෙයි."**

කතුවරයා වැලිගම හාමිනේගේ පුපුරණ තරම් කෝපයෙන් පිරි මනස පාඨක මනසේ සිතුවම් කිරීමට කථනය හා රූපණය නිසියාකාරව භාවිත කර තිබෙන අන්දම මෙසේ ය. මේ ශිල්ප ක්‍රමයේ දී වික්‍රමසිංහ භාෂාවේ ධ්වනිතාර්ථ ද - කථනයේ රිද්ම රටා ද මනාව සංයෝගය කර ඇති අන්දම ද ඔහුගේ සාර්ථකත්වයට අදාළ බව කිව යුතුය.

**"නන්දා පළමුව විවාහ වූයේ කුලවත් පවුලක උපන් නිවටයෙකු සමඟය. ඔවුන් ජීවත් වූ ගරා වැටුණු ගෙය මඳක් ප්‍රකෘතිමත් කරවන ලද්දේ දෙවන වර නන්දා සමග විවාහ වුණු තම පුතාගේ මුදල් වියදම් කිරීමෙනි. නන්දාගේ පළමුවන සැමියා ඉස්පිරිතාලයක හිගන වාට්ටුවක මළේය."**

**"කොළඹ පදිංචි වූ පසු නන්දාගේ කුලමානයත් අහංකාර කමත් අමුතු වෙසක් ගත්තේය. ගමදී තමාට බෙහෙවින් කීකරුව තමා බැන්නත් කර බාගෙන ඉවසූ නන්දා, කොළඹ පදිංචි වී අවුරුද්දක් ගෙවෙන්ට පෙර අමුතුම ගැහැනියක වූයේ කෙසේ ද? තම පුතා හා විවාහ වූ දවසෙහි පටන් නන්දා තමා රවටන අදහසින් ක්‍රියා කළාය. කපටි හෙර........"**

**"කුලමානය නමැති නමැති දිරූ කඩතුරාවට මුවා වූ නන්දා හා ඇගේ සහෝදරියන් මවත් සටකපට කම් කිරීමෙන් තමන්ගේ දිළිඳුකම සඟවා ගත්හ. එහෙත් තමාටත් තම පුතාටත් නොදැනෙන සේ ඒ දිළිඳුකම ඔවුන්ට සඟවාගත නොහැකි වී ය........කපටි හෙර."**

**"ඈ තම ලේලි කෙරෙහි පැහැදී ඇඩි විශ්වාසයෙන් සිටි කාලයෙහි තමාගේ කුඹුරක් ද අක්කර හතරක පොල් වත්තක් ද තෑගි ඔප්පුවකින් ලේලිට හිමි කළාය. කඹුරු උදුනේ ගින්න වැනි රෝෂයකින් නැන්දම්මාගේ හද දැවෙයි. ඇඩි දිළිඳුකමින් බොහෝ කාලයක් හික්මවනු ලැබූ ඈ තම පුතාත් ලේලිත් සිතින් බැහැර කොට හුදෙකලාව ජීවත් වීමට සිතා ගත්තා ය."**

සැබවින්ම නවකතාකරුවෙකු වශයෙන් වික්‍රමසිංහ, ස්වකීය රචනා ශෛලිය ගොඩ නගා ගත් අන්දම විචාරාත්මකව සලකා බලන විට පෙනී යන්නේ අදටත් ඔහුගෙන් උගත හැකි පාඩම් අපමණ බව ය.

මේ කෙටි විග්‍රහයේ දී අරමුණ වූයේ සාහිත්‍ය කෘතියක් රසවත් වන්නේ කවර ශිල්පීය ක්‍රම නිසා ද යන්න හා කියවීමේ චමත්කාරයට කතුවරයා විසින්  පාඨකයා වෙත ලබා දෙනු ලබන උත්තේජනය කවරාකාර ද යන්න දීම ය.

# ස්වදේශීය ආර්ථික සංවර්ධනයට හා කළමනාකරණයට අදාළ තනතුරු නාම භාවිතය පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණය

**ආචාර්ය ආර්. ඩී. ආනන්ද තිස්ස**

**rdatissa@gmail.com**

ගෞරව ශාස්ත්‍රවේදී, සමාජීය විද්‍යාපති, දර්ශන විශාරද (කැලණිය විශ්වවිද්‍යාලය)
ලේඛකත්ව හා සන්නිවේදන පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)
එෆ්. එල්. ඒ. (ශ්‍රී ලංකා)
සභාපති ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
යක්කල

**හැඳින්වීම**

අනුරාධපුර යුගයේ සිට ස්වදේශීය ආර්ථික සංවර්ධනයට හා කළමනාකරණයට අදාළ තනතුරු නාම භාවිතය පිළිබඳ තොරතුරු ඓතිහාසික මූලාශ්‍රයවල හා මහාවංසය ආදී කොට ඇති බොහෝ වංසකතා කෘතිවල සඳහන් ය. ඒ අතරෙන් විගණන, විගණක හා ගණක ආදී වෘත්ති ඉපැරණි වෘත්ති වශයෙන් පිළිගනු ලබන අතර ඈත අතීතයේ සිට මූල්‍ය කළමනාකරණයෙහි වගකීම ඉටුකර ඇත. භාණ්ඩාගාර හෝ මුදල් පරිපාලනය හා රාශිකරණයට අදාළ ආයතන ද මානව ශිෂ්ටාචාරය තරම් ම පැරණි ආයතනය විශේෂයක් බව පුරා ලිපි හා සීගිරි ගී සාක්ෂි සපයා ඇත. සන්නිවේදනය හා මතකය මානව අත්දැකීම් පිළිබඳ කේන්ද්‍රීය සාධකයෝ වෙති. ස්වකීය ඉතිහාසය පිළිබඳ හැඟීමක්, අවබෝධයක් ඇති පෘථිවිවාසී එකම සත්ත්ව කොට්ඨාසය මිනිසුන් පමණි. සිදුවීම්, මතක තබා ගැනීමේ ආශාවක් හා හැකියාවක් මෙන් ම මතකය විශ්ලේෂණය කිරීමේ හැකියාවක් ද මිනිසා සතු ය. ඊට ම අනන්‍ය වූ මූල්‍ය ස්ථාවරත්වයට අදාළ කළමනාකරණය ද සිදු වී ඇත.

පෙරදිග ලෝකයේ බොහෝ වෘත්ති හෝ ඊට අදාළ කටයුතු ආරම්භවීමේ පදනම ආගමික සාහිත්‍යය ඇසුරෙන් ගොඩනැඟී ඇති බව ආගමික මූලාශ්‍රය පරිශීලනයේ දී අනාවරණය වේ. වෘත්තියක තථ්‍ය ආරම්භය වෛදික ශිෂ්ටාචාරයේ හෙවත් වෛදික යුගයේ ආගමික දැනුම මත සිදු වී ඇති අතර, යුරෝපයේ වෘත්තීන්හි ආරම්භය පූජක වෘත්තිය බව ඒ පිළිබඳ ශාස්ත්‍රීය කරුණු අධ්‍යයනයන්හි දී පිළිබිඹු වී ඇත. අනුරාධපුර යුගයෙහි විවිධ වෘත්තීන්ට අදාළ තනතුරු නාම පිරිනැමීම පිළිබඳ ඓතිහාසික සාධක සෙල්ලිපි, වංශ කතා කෘති හා විද්‍යමාන සාහිත්‍යයන් ඇසුරෙන් අධ්‍යයනය කළ හැකි ය. මෙම තනතුරු බොහොමයක් ආගමික මධ්‍යස්ථාන ආශ්‍රිත තනතුරු හා රාජ්‍ය පවත්වා ගෙන යාමට පිරිනමන ලද තනතුරු වශයෙන් හැඳින්විය හැකි ය.

### පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවල සඳහන් වන ජීවන වෘත්තීන් හා රැකී රක්ෂා

පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර හෙවත් ඓතිහාසික ලේඛන යටතේ ස්ථාවර ලිපි පිළිබඳ ව අධ්‍යයනය කරනු ලැබේ. ලක්දිව නොයෙක් ප්‍රදේශවලින් සෙල් ලිපි 4000කට වඩා වැඩි ප්‍රමාණයක් සොයා ගෙන ඇත. මෙම සෙල් ලිපි (අමරවංශ හිමි, 1969, පි. 10) අතරින් 1048ක් පමණ සවිස්තර ව සංඛ්‍යා ලේඛනවලට ගෙන ඇත. මෙම සෙල් ලිපි පිහිටි ස්ථාන හා ස්වරූපය අනුව කොටස් 4කට වර්ග කළ හැකි ය. (අ). ලෙන් ලිපි, (ආ). ගිරි ලිපි, (ඇ). ටැම් ලිපි හා (ඈ). පුවරු ලිපි වශයෙනි.

පූර්වෝක්ත ඓතිහාසික ලේඛන සියල්ල ම මෙහි දී නිරීක්ෂණය කර නැත. ඒ අතරෙන් ලෙන් ලිපිවල සඳහන් වන ජීවන වෘත්තීන් හා රැකී රක්ෂා පිළිබඳ වැදගත් තොරතුරු ගැන පමණක් කරුණු සඳහන් කරනුයේ මෙම ලිපියට අදාළ තොරතුරු නිරාවරණය සඳහා පමණි. ඒ අනුව ලෙන් ලිපිවලින් ද ජීවන වෘත්තීන් හෙවත් රැකී රක්ෂා පිළිබඳ ව කරුණු හෙළි වේ. අචරිය, අචිරිය, අජරිය (සංස්කෘත. ආචාර්ය) යන වචනය ලිපි 14ක ම දැක්වෙයි. නගගේ පුත් දෙව (තුලදර) රන්කරුවෙකි. තබකර තිශ යනු තම්බකාරක (තඹ වැඩ කරන්නෙකි). මණිකර තිශ යනු මැණික් කපන්නෙකි. ශ්‍රී ලංකාවේ නොයෙක් පළාත්වල සංචාරය කළ මැණික් ශිල්පියෙකි. එවක මෙරට සෑම පළාතකම මැණික් තිබූ බවත්, ඔහුට අවශ්‍ය මැණික් වර්ග සෙවීමෙහි නිරත වූ බව ද මූලාශ්‍රයවල සඳහන් කර ඇත.

කම්මාර ශිල්පියා හැඳින්වූයේ කබර යනුවෙනි (යකඩ වැඩ කරන්නා. වර්තමාන සිංහල වචනය කඹුරු යනුයි.) කුබකර **(පාලි. කුම්භකාර)** යනු කුඹල් කර්මාන්තය කළ තැනැත්තා ය. වළං සෑදීම ඔහුගේ කාර්යය විය. දටික **(පා. දාඨික)** යනු ඇත්දත් වැඩ කරන්නා ය. නටඹුන් තැන්වල ඇත්දතින් නිම කළ පුරාවස්තු හමු වී ඇත. තනවය **(සං. තන්තුවාය)** පෙහෙකර **(පා. පෙසකාර)** යනු පේෂකර්මාන්තයෙහි නියුක්තයන් සඳහා භාවිත වචනයකි. **(සං, පෙශස්)** යනු විසිතුරු මැහුම් වැඩ යනුයි.

**එළු බෝධිවංසයට** අනුව පේෂකාරයන්ට අයත් ප්‍රධාන කටයුත්ත වූයේ වතුර පෙරහන, පෙරහන්කඩ, ලනු, කඹ ආදිය මහබෝ මඟුලට සම්පාදනය යි. **'වණිකඩ, වණිච'** යන වචන ව්‍යාපාරිකයන් නොහොත් වෙළෙන්දන් හැඳින්වීම සඳහා යොදා ගෙන ඇත. **'කහාපණ'** යන වචනය ද ඇතැම් ලිපියක හමු වේ. මෙම යුගයේ දී බඩු හුවමාරු ක්‍රමයට අමතර ව මුදල් භාවිතය ද පැවති බව පිළිගත හැකි ය.

### පුරාණ වෛද්‍ය ක්ෂේත්‍රයට අදළ තනතුරු, ජීවන වෘත්තීන් හා රැකී රක්ෂා

ශ්‍රී ලංකාවේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය බුදු දහමේ පණිවිඩයත් සමඟ මෙරට ආරම්භ වූ බව උගතුන්ගේ මතයක් වන අතර ලාංකික වෛද්‍ය සම්ප්‍රදායට ප්‍රාග් ඓතිහාසික ආරම්භයක් ඇති බව තවත් උගත්තු පිළිගනිති. ප්‍රාග් ඓතිහාසික තත්ත්වය යටතේ සාකච්ඡා කෙරෙන්නේ නම්, එවක චිර ප්‍රසිද්ධ වෛද්‍යවරයා වශයෙන් සැලකෙන්නේ රාවණ රජතුමා ය. හින්දුන්ගේ සම්භාව්‍ය කෘතියක් වූ රාමායනයේ ප්‍රබල චරිතය රාවණ රජතුමා ය. මහායාන සම්ප්‍රදායට අයත් ලංකාවතාර සූත්‍රයේ ද රාවණ රජු පිළිබඳ ව සඳහන් වේ. පූර්ව ආර්ය යුගයේ පටන් දේශීය වෛද්‍යවරු පිළිබඳ තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවල, වංශ කතාවල හා සාහිත්‍යය කෘතිවල (හෙට්ටිආරච්චි, 2007, පි. 253)

එවැනි තොරතුරු සඳහන් වේ. පුරා ලේඛන පරීක්ෂා කිරීමෙන් වෛද්‍ය ක්ෂේත්‍රයට අදළ තනතුරු නාම කිහිපයක් හඳුනා ගැනීමට හැකි ය.

1. වෙද්නා - ප්‍රධාන වෛද්‍යවරයා
2. වෙද්සම්දරු - විධායක වෛද්‍ය නිලධාරී
3. වෙදහල් කැමියන් - රෝහල් නිලධාරීන්
4. වෙදහල් වැස්සන් - රෝහල් නිලධාරීන්
5. පුහුඬා වෙද - කුඩැල්ලන්ගෙන් ප්‍රතිකාර කළ වෛද්‍යවරුන්
6. අන්දුන් වෙද - අක්ෂි වෛද්‍යවරුන්

රෝහල්වල සේවය කළ වෛද්‍යවරුන්ට හා සේවකයන්ට මුදල් මෙන් ම ධාන්‍ය, ඉඩම් ආදිය ද ලබා දුන් බව වංශ කතාවලින් හා පුරා ලේඛනවලින් ස්ඵුට වෙයි. මිහින්තලේ සෙල් පුවරු ලිපියෙහි පැරණි වෛද්‍ය ආයතනවල ක්‍රියාත්මක වූ නීතිරීති ගැන ද විස්තර ඇත. එම ලිපියට පූර්වයෙන් මැදිරිගිරිය රෝහල සම්බන්ධයෙන් ඊට පෙර ව්‍යවස්ථා 6ක් නිකුත් කර ඇත.

**සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වන ජීවන වෘත්තීන් හා රැකී රක්ෂා**

සාහිත්‍ය මූලාශ්‍ර පුළුල් පරාසයයක ව්‍යාප්ත වුව ද ජන කවිය ගැන පමණක් කරුණු සඳහන් කර ඇත. විවිධ වෘත්තීන් හා බැඳුණු කවිවලින් කියැවෙන විවිධ වෘත්තීන් සමූහයත්, එකී කාව්‍යයන්හි පිළිබිඹු වන වෘත්තීය ගුණාංග සමූහයත්, විවිධ අභියෝග හමුවේ නොසැලී අනේක විධ දුක්පීඩා විඳගත් ආකාරයත්, එයින් අපට ලබා ගත හැකි ආදර්ශයත් මෙහි දී විශේෂ අවධානයට ලක් වී ඇත. අදාළ කාරණයට සාධක වශයෙන් නිදසුන් කීපයක් උධෘත වශයෙන් දක්වා ඇත.

පැරණිතම වෘත්තියක් වශයෙන් කුඹල් කර්මාන්තය ආශ්‍රිත රැකියා සඳහන් කළ හැකි ය. ඒ අනුව දීර්ඝ ඉතිහාසයක් ඇති කුඹල් කර්මාන්තයෙහි මහනුවර අවදියෙහි දී බඩහැල කුලයේ පිරිස නියුක්ත වූ බව ආනන්ද කුමාරස්වාමි මහතා පවසයි. දවසකට වළං පහක් සැපයූ කුඹලෙකුට දිවෙලට ඉඩම් හරියක් ලැබුණු බව 10 වන මිහිඳුගේ සෙල්ලිපියෙහි ද සඳහන් වෙයි. වළං තැනීමේ දී කුඹලාට සකපෝරුව උදව් වෙයි. එය කෙතරම් අගේ කොට සැලකේ ද කියතොත් දීග දෙන දුවට ද සකපෝරුවක් දයාද වශයෙන් ලබාදුන් බව රොබට් නොක්ස් සඳහන් කරයි. **කුඹල් කුලයට අයත් කුඹල්ලු උඩුකය වසා ඇඳුම් අඳින්නට තහනම් වූවෝ වෙති.** (කරුණාරත්න, 2011, පි. 234)

පුරාණ වෘත්තීන් අතර යකඩ ආශ්‍රිත කර්මාන්ත ද වැදගත් වෙයි. යපස් එකතු කර ඒවා උණුකර යකඩ තනා ගැනීමටත්, එම යකඩ උපයෝගී කර ගැනීමෙන් අවශ්‍ය අවි ආයුධ තනා ගැනීමටත් සිංහලයෝ දැනසිටියහ. යකඩ කර්මාන්තය මෙරට පැවති කර්මාන්ත අතුරෙන් ප්‍රධාන ස්ථානයක් ගත් බව රොබට් නොක්ස් ද පවසයි. (එහි ම, පි. 289) මහනුවර අවදියෙහි ලංකාවේ යපස් තිබුණු ප්‍රදේශ හා කර්මාන්ත කළ ස්ථාන එකසිය හැත්තෑවක් පැවති බව මන්දාරම් පුවත කවියෙන් ප්‍රකාශ වේ.

හම්බන්තොට ගිරුවා ඌව දෙදුම්බර බිම් තැන්නා
සපරගමුව හා සත්කෝරළේ මන්නාරම තිබෙනා
යකඩ ලොහෝ කම්මල් එකසිය හැත්තෑ පමනා
කරවා දහස් ගණන් නිරතුරු නො කඩව වැඩ කරනා

එවකට ලෝහ කර්මාන්තයෙහි නියුක්ත වූ පිරිස ආචාරී කුලයට හෙවත් නවන්දත්තා කුලයට අයත් වේ. මේ කුලයේ රන් රිදී වැඩ කරන්නෝ, ආචාරීන් නමින් ද, යකඩින් අවි ආයුධ සාදන්නෝ, නවන්දත්තා වශයෙන් ද, යපස් උණු කොට යකඩ සාදන්නෝ, යමන්නන්, වශයෙන් ද හඳුන්වා ඇත. රොබට් නොක්ස්ට අනුව රන්කරුවන් පිළිබඳ තොරතුරු සඳහන් වන්නේ මෙසේ ය. **මේ අවධියේ රන්කරුවෝ බෙහෝ ධනවත් ය. දියුණුය, මහනුවර පදිංචි වී රජ්ජුරුවන්ගේ රන්කම් පට්ටලයේ නියුක්ත වූ රන්කරුවෝ** (එහි ම, පි. 233) **විශේෂයෙන් දියුණු ය.**

ගොවිතැනින් ජීවත් වූ සමාජයක කම්මල්කරුවාට උසස් තත්ත්වයක් තිබෙන්නට ඇත. කැත්ත, උදැල්ල, පොරව ආදී අවි ආයුධ සාදවා ගැනීමටත්, ඒවා අළුත් වැඩියා කරගැනීමටත් කම්මල්කරුවාගේ සහාය ගොවියාට අත්‍යවශ්‍ය විය. ඔහුගෙන් අවි ආයුධ සකස් කරගෙන ඇත්තේ මිල මුදල් දීමෙන් නොව ත්‍යාග වශයෙන් යම් යම් ආහාර ද්‍රව්‍ය දීමෙන් බව,යකඩ තැලීම, පිළිබඳ සැහැලි කියැවීමෙන් පැහැදිලි වෙයි. (ගමගේ, 1986, පි. 153) කම්මලට යන විට අඟුරු සහ යකඩ කැබැල්ලක් ද ගෙන ගොස් දී, තෑගි බෝග පිරිනමා මයිනහම ද ඇදිය යුතු වීම එදා සමාජයේ ජීවන තත්ත්වය පැහැදිලි කරන ප්‍රබල සාධකයකි.

අඟුරු කොටාලා කම්මලකට එති
ඉඳ ගෙන පිල පිට ගිනි මොලවා දෙති
තනවතී නහවතී පණ පිහිටා දෙති
ඉඳා මෙන්න ගෙයි තිබුණා දෑකැති

ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාවේ පේෂකර්මාන්තය දියුණුව පැවති බවට ඓතිහාසික ලේඛනවල මෙන් ම ජන සාහිත්‍ය සම්ප්‍රදායෙහි තොරතුරු සඳහන් වෙයි. විජය රජුට කුවේණිය හමුවන මොහොත පිළිබඳ තොරතුරු මහාවංශයේ විස්තර කර ඇත. පූර්ව ඓතිහාසික යුගයෙහි පවා මෙරට විසූ පිරිස් වස්ත්‍ර ඇඳි බවට එය හොඳ ම සාක්ෂියකි. පන් නෙලා නූල් කැට රෙදි වියා පඩු පොවා කඨින සිවුරු අසූවක් එක් රැයක් එක් දවසකින් නිම කර පූජා කළ බව පූජාවලියෙහි සඳහන් වේ. මේ සියල්ල එක් රැයකින් නිම කිරීමට නම්, මෙම කර්මාන්තයෙහි නිපුණත්වයක් ලැබූ වෘත්තිකයන් බොහෝ සිටින්නට ඇත.

කපු නූලෙන් රෙදි විවීම බෙරවායන් කළ බව ද,රන් හුයෙන් රෙදි විවීම ඉන්දියාවෙන් ගෙන්වන ලද චාලියන් (සලාගමයන්) කරන ලද බව ද ආනන්ද කුමාරස්වාමි පවසයි. කපු වැවීම කළ අන්දම පහත සඳහන් කවියෙන් විස්තර වෙයි.

මූකලන් කොටා කපු ඇට ඉසින්නේ
දෙපෙන් වෙලා පැලපත ලොකුවට යන්නේ
සමසක් ගිය කලට මල් බොකල වන්නේ
වෙසක් මසට සුරතල් මල් පිපෙන්නේ

ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තය ආරම්භ වූයේ ඉංග්‍රීසි අධිරාජ්‍යවාදයට මේ රට යටත්වීමෙන් පසුව ය. යටත් විජිතයක් ව පැවති අවධියෙහි මෙරට ආරම්භ වූ වෘත්තියක් වශයෙන් මෙම කර්මාන්තය හැඳින්විය හැකි ය. ඒ අනුව පතල් කර්මාන්තය ද මෙරට පැවති තවත් වෘත්තියක් වශයෙන් ඉතිහාසට එකතු වේ. පතල් කර්මාන්තය ආශ්‍රිත ජීවන වෘත්තියෙහි කටුකත්වය ද, ගෙදර දී විවිධ ආහාර වර්ග ගනිමින් ජීවත් වූ ගැමියාට විවිධත්වයෙන් තොර ඒකාකාර ආහාර වේලක් ගැනීමට සිදු වූ බව පහත සඳහන් ජනප්‍රිය ජනකවියෙන් ප්‍රකාශිත ය.

ඉන්නේ දුම්බරයි මහ කළු ගලක් යට
කන්නේ කරවලයි රට හාලේ බතට
බොන්නේ බොර දියයි පූරුවේ කළ පවට
යන්නේ කවදා ද මව්පියො දකින්නට

මිනිරන් පතල්වල මිනිසුන් මෙන් ම ස්ත්‍රීන් ද වැඩ කළ බව සඳහන් වේ. මිනිරන් කැබලි කිරීම, ශුද්ධ කිරීම හා තේරීම ආදී කටයුතුවල ඔවුන් නියුක්ත ව ඇති බව පහත ජනකවියෙන් ප්‍රකාශ වේ. (එහි ම, පි. 162)

කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා
මිනිරන් තෝරන්න දින ගණනට එනවා
මිනිරන් තේරුවොත් ළඳෙ නුඹ කළු වෙනවා
ළඟනම් ගෙදර මුර ඇරුනම මම එනවා

ඔරුපාරු පදින්නන් අතරින් බිහි වූ එම වෘත්තිය හා සම්බන්ධ ජනකවි බහුල වශයෙන් වාර්තා ස්වරූපයෙන් රචිත ය. පහත සඳහන් කවියෙන් ප්‍රකාශවන්නේ ඔරුපාරුවලින් බදු අයකිරීම පිළිබඳ තොරතුරකි.

පැරණි වෘත්තීන් අතර ගැල්කරුවාට ප්‍රධාන තැනක් ලැබෙයි. ඈත අතීතයෙහි සිට ම සිංහලයෝ ගමනාගමනය සහ බඩු ප්‍රවාහනය සඳහා ගැල උපයෝගී කර ගෙන ඇත. එදා ප්‍රධාන මාර්ගවල බඩු භාණ්ඩ ප්‍රවාහනය සඳහා ගැල උපයෝගී කර ගෙන ඇත. වෘත්තියක් වශයෙන් ගැල්කරුවා මෙන් ම, පාරුකාරයෝ ද ගංගාවල බඩු බාහිරාදිය ද මිනිසුන් ද ගෙන ගොස් ඇත. ශ්‍රී ලංකාවේ පැවති විවිධ වෘත්තීන් පිළිබඳවත්, ඒ ඒ වෘත්තීන්ට අදාළ කටයුතු පිළිබඳවත් සාහිත්‍යමය වශයෙන් වැදගත් තොරතුරු ජන සාහිත්‍යයෙන් ලබා ගත හැකිය. (ගුණසේකර, 2004, පි. 209) අසරණයන්ගෙන් අයුතු ලෙස මුදල් ඉපැයීම මේ කවියෙන් ධ්වනිත වෙයි.

මාතර ගඟේ ඉන්නා කිඹුලිගෙ පැටියා
තල්ල සුදයි බෙල්ලේ ගෝමර කැටියා
යන එන ඔරු පාරු නවතා ගෙන සිටියා
මිනී නොකයි මාතර කිඹුලිගේ පැටියා

ජීවිත පරිඥානයෙන් හෙබි පැරණි සිංහලයෝ පරිසර වස්තූන්හි හැඩරුව, ක්‍රියාකාරිත්වය හා ගති ස්වභාවය නිරීක්ෂණය කොට, එම ලක්ෂණ අප්‍රකට ආකාරයට අන්තර්ගත කොට තේරවිලි වශයෙන් ඉදිරිපත් කළහ. විශේෂයෙන් අනුරාධපුර යුගයේ සිට රාජධානි ආශ්‍රිත ඉදිකරන ලද රාජ මාලිගා ආශ්‍රිත ගෘහ නිර්මාණ ද, ආගමික ස්ථාන ද, කෘෂි කර්මාන්තය සම්බන්ධ මහසයුර පරදන වාරි කර්මාන්ත ද අතීත වෘත්තිකයන්ගේ තාක්ෂණික කුසලතාව සඳහා නිදසුන් වශයෙන් සඳහන් කළ හැකි ය. මෙහි අපූර්වත්වය නම් දේශීය ඥාන සම්ප්‍රදාය ජන සාහිත්‍යයෙහි හා ජනශ්‍රැතියෙහි නිධන්ගත වී තිබීම යි.

**ආර්ථික කටයුතු හා සම්බන්ධ ජීවන වෘත්තීන් හා රැකී රක්ෂා**

ආර්ථිකයට අදාළ ව ඉතා වැදගත් කටයුත්තක් වූ කාසි අච්චු ගැසීම හා සම්බන්ධ වෘත්තියක් පිළිබඳ ව සඳහනක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පෙරියකාඹු විහාර ගුහා ලිපියේ ඇතුළත් ය. එම ලිපියේ දී අදාළ වෘත්තියෙහි නිරත පුද්ගලයා හඳුන්වා ඇත්තේ **'රූපදක'** නමිනි. එම පදය සකස් වී ඇත්තේ සංස්කෘත රූප අධ්‍යක්‍ෂ යන දෙපදය එක් වීමෙනි. මෙහි ලා වැදගත් වන්නේ සමකාලීන ආර්ථික යාන්ත්‍රණය හා සම්බන්ධ වෘත්තීන් සම්බන්ධයෙන් ද සෙල්ලිපිවල කරුණු දක්වා ඇත.

යුරෝපයේ කාසි භාවිතය ආරම්භය ක්‍රි. ව. 1252 දී ය. ශ්‍රී ලංකාවේ කාසි භාවිතය ආරම්භ වී ඇත්තේ ක්‍රි. පූ. 6 වන සියවසේ දී ය. විජය කුමරු ලංකාවට පැමිණි දින වණ්ණා (කුවණ්ණා හෙවත් කුවේණි) වෙරලේ මුතුවල මිල සඳහන් කර අලෙවි කළ බවට තොරතුරු සඳහන් වේ. 4 වැනි සියවස වන විට ලංකාවේ බැංකු ක්‍රමය ව්‍යාප්තව පැවති බව තෝනිගල සෙල් ලිපියෙන් හෙළි වේ. දේව නමැත්තෙකු කලහුමනක නියමතනහි වී උදු මුං තැන්පත් කොට එහි පොලිය යහිස පවය වෙහෙරෙහි අරියවංශ උත්සවය පැවැත්වීම සඳහා වඩින සංඝයාට ප්‍රත්‍ය සම්පාදනය පිණිස පූජා කිරීම.

සෙල්ලිපිවල සඳහන් වන වෘත්තීන් අතර ප්‍රධාන වන්නේ භාණ්ඩාගාරිකවරුන් ය. භාණ්ඩාගාරිකවරුන් හඳුන්වා දී ඇත්තේ '**බඩගරික**' නමිනි. මෙහි දී අවධානයට ගත යුතු තවත් වැදගත් කරුණක් වන්නේ ඇතැම් භාණ්ඩාගාරිකවරුන්, පරුමකවරුන් ලෙස ද හඳුන්වා දී ඇති බවයි. මේ භාණ්ඩාගාරිකවරුන් කෘෂිකාර්මික නිෂ්පාදන ගබඩා කිරීම හා බෙදාහැරීම සම්බන්ධීකරණය කළ නිලධාරීන් පිරිසක් විය හැකි ය. මේ පිරිස් සංවිධානය වූ ආකාරය පිළිබඳ ව වැදගත් තොරතුරක් සෙල්ලිපිවලට ඇතුළත් වී නැත.

සෙල්ලිපිවල සඳහන් සෙසු තනතුරු අතර වැදගත් වන්නේ ගණකවරුන් ය. ඔවුන් ගණකාධිකාරීවරුන් වශයෙන් වර්තමාන ව්‍යවහාරයට අනුව හැඳින්වේ. ක්‍රි. පූ. 250 හා ක්‍රි. ව. 10 අතර කාලයට අයත් සෙල්ලිපිවල මෙවැනි ගණකාධිකාරිවරුන් අටදෙනෙකු පිළිබඳ විස්තර ඇතුළත් ය. හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් සීලවකන්ද ගුහා ලිපිය එවැනි ගණකවරයකු බෞද්ධ භික්‍ෂු සංඝයා වෙත හවුලේ පිරිනමන ලද දීමනාවක් පිළිබඳ තොරතුරු ඇතුළත් වූවකි. අනුරාධපුර යුගයේ සිට ආර්ථික කටයුතු හා සම්බන්ධ ජීවන වෘත්තීන් හා රැකී රක්ෂා සඳහා භාවිත වූ තනතුරු නාම කීපයක් අකාරාදී පිළිවෙළින් පහත දක්වා ඇත.

1. උල්වාඩු : ගිණුම් කටයුතු හා සම්බන්ධ අපරාධ පරීක්‍ෂණ නිලධාරි
2. කණක්කරු : ගණකාධිකාරි යන අර්ථයෙහි යෙදී ඇත. එහෙත්, ද්‍රවිඩ භාෂා ස්වරූපයක් ගෙන ඇත.
3. කණ පෙඩික/කණ පෙටික :
පරුමකවරුන් දැරූ තනතුරු අතර ගණක හා කණ පෙඩික (කණ පෙටික) යන තනතුරු ගැන ද සඳහන් වෙයි.
4. කණ පෙඩික : වාර්තා තබන්නන් හෙවත් වාර්තා ලියා සුරක්ෂිත කරන්නන් ය.

5. ගණක
(අ). ගණන් පරීක්‍ෂක, (ආ). ගණකයා, ගණනය කරනු ලබන තැනැත්තා, (ඇ). ගණන් තබන්නන් හෙවත් ගණකාධිකාරීන් ය. ඔවුන් ද ගණන් පිළිබඳ වාර්තා පවත්වා ගෙන ගිය බව සඳහන් වේ. (ඈ). ගණකාධිකාරි
(නගර ගුත්තිකගේ සහායට සිටි නිලධාරියෙකි)

6. ගණක අමාත්‍ය/ගණක ඇමති
රජුගේ අය වැය ගණන් තැබූ ඇමතිවරයෙකි. ජේතවනාරාම (අභයගිරි) සංස්කෘත ලිපියේ සඳහන් වේ. ක්‍රි. ව. 9 වන ශත වර්ෂයට අයත් ය.

7. ගණකවරු : නගරයේ ප්‍රධාන විධායක තනතුරකි

8. ගණකයන් ගණන් පිරික්සන නිලධාරීන්

9. බඩකරික (භාණ්ඩාගාරික)

10. රජ්කොල් සම්දරුවන් : රජයේ නිලධාරීන් සියලු දෙනා හැඳින්වීමට භාවිත පොදු නාමයකි.

11. ලේඛන කලාව හා සෘජු සම්බන්ධතාවයක් ඇති තවත් තනතුරු නාම කීපයක් වශයෙන් අන්තර ලියන (අත්පිටපත් කෙටුම්පත් කරන්නා), අරිකි ලෙයා (ආරක්‍ෂක අංශයේ ලියන්නා), ආලෙයා (ආදායම් ලේඛනගත කරන්නා/අයවැය පොත් තබන්නා)

ක්‍රි. ව. 956 සිට 972 දක්වා පැවති සිව්වැනි මිහිඳු රජු විසින් පිහිටුවා ඇති **මිහින්තලේ සෙල් පුවරු ලිපිය** කොටස් හෙවත් ලිපි දෙකක් වශයෙන් දැක්වේ. පළමු ලිපියෙන් චේතියගිරි විහාරයෙහි අභ්‍යන්තර පාලනය හා භික්‍ෂූන් වහන්සේලාට රජයෙන් කළ සැලකිලි ද, දෙවන ලිපියෙන් ආරාම සේවකයන්ගේ වැටුප් පිළිබඳව තොරතුරු සඳහන් වේ. මුදල් වශයෙන් හෝ නින්දගම් වශයෙන් හෝ ආහාර වශයෙන් වැටුප් නොගෙවා කිසිඳු සේවාවක් ලබා ගෙන නැත. ලක්දිව සෙල්ලිපි කෘතියෙහි (අමරවංශ හිමි, 1969, පි. 299) පළමු ලිපියෙහි පේළි අතර සඳහන් වන 11-15 හි එන කරුණු මේ සම්බන්ධයෙන් වැදගත් වේ.

11 ග් අවුද් මෙත් පිරිත් කොට් බැසැ හම්බුබත් ගතැයුතු ගිලන්වැ ලහාග් ඉයැ නො යහන හිමියනට් වෙදුන්

12 කියූ සැන්දැ **වසග්** දියැයුතු මෙ වෙහෙර වැසැ වනවළා කියන බික්සග්හිමියනට් කඩින් පිඩින් **වස**

13 **ග් පසක්** ඉසා සුතන්වළා කියන බික්සග්හිමියන්ට් **වසග් සතක්** ඉසා බිදම්වළා කියන බික්

14 සග්හිමියනට් **වසග් දොළොසක්** ඉසා දියැයුතු ඉසා දායකයන් පිරිකපා සග්නට් දෙනු කළ පස

15 නො පිරිහෙළා දියැ යුතු මෙ වෙහෙර ආවු තුවාක් අවසැ බඳ් ගම්බිම් මෙහි මෙ පසක් දී නිබඳ්වැ වැසැ වළ

මෙම පාඨයෙහි සරල අර්ථය ලක්දිව සෙල්ලිපි කෘතියෙහි (එහි ම, පි. 306) මෙසේ දැක්වේ. ... මෙත්ත සූත්‍රයෙන් පිරිත් කියා බැස කැඳබත් ගත යුතුය. රෝගීව සලාකාග්‍රයට නොයා හැකි ස්වාමීන් වහන්සේලාට, වෙදුන් කියූ විට ආහාර කොටස දිය යුතුය. මේ විහාරයෙහි වාසය කර, විනය පිටකය කියන (හදාරණ) භික්‍ෂූන් වහන්සේලාට වස්ත්‍රයෙන් හා ආහාරයෙන්, පස් කොටසක් ද, සූත්‍ර පිටකය හදාරණ භික්‍ෂූන් වහන්සේලාට කොටස් හතක් ද, අභිධර්ම පිටකය හදාරණ භික්‍ෂූන් වහන්සේලාට, කොටස් දොළොසක් ද, දිය යුතු ද වේ. දායකයින් නියම කර සංඝයාට දුන් ප්‍රත්‍යය නො අඩු කොට දිය යුතුයි. ... මේ ලිපියෙහි **වසග්** යනුවෙන් සඳහන් කර ඇත්තේ ආරාමයෙහි පොදු භාණ්ඩාගාරයෙන් ලද ප්‍රමාණවත් ආහාර කොටසකට කියන ලද නමක් බව ශිලා ලේඛන සංග්‍රහය සංස්කරණය කළ වික්‍රමසිංහ (පුරාවිද්‍යා 2000, පි 43) සඳහන් කර ඇත.

යුරෝපයේ බැංකු ක්‍රමය ආරම්භ වූයේ 12 වන සියවසේ දී ය. ඉතාලියේ ලූකා පැසියෝලි ගිණුම් පොත් සටහන් තැබීමේ ක්‍රමය හඳුන්වා දී ඇති බවට විස්තර සඳහන් වුවද ඊටත් සියවස් කීපයකට පෙර එම ක්‍රමය ශ්‍රී ලංකාවේ පැවති බවට තොරතුරු ඇත. ලොව ප්‍රථම වරට පාස්පොත, වවුචරය, මාසික වාර්තා හා වාර්ෂික ගිණුම් මෙරට ක්‍රියාත්මක වූ බව මිහින්තලා සෙල් ලිපියෙන් හෙළිදරව් වේ. ආරාමික සේවකාදීන්ට ගෙවිය යුතු වැටුප් ප්‍රමාණය හා වෙහෙරට අයවිය යුතු බදු පිළිබඳ ව ක්‍රි. ව 10 වන සියවස 4 වන මිහිඳු (ක්‍රි. ව. 952-972) රාජ්‍ය පාලනයට අදාළ ඓතිහාසික කරුණු අධ්‍යයනයේ දී නිරීක්ෂිත ය.

**ආරාම පාලන කටයුතු හා සම්බන්ධ ජීවන වෘත්තීන් හා රැකී රක්ෂා**

අනුරපුර යුගයේ බෞද්ධාගමික මධ්‍යස්ථාන, පන්සල්, වෙහෙර විහාරස්ථාන, පිරිවෙන් හා ආරාම පාලන තනතුරු නාම දෙයාකාර ය. එනම්, (අ). භික්ෂූන් පිළිබඳ තනතුරු නාම හා (ආ). ආරාමය පාලන සඳහා භික්ෂූන්ට සහාය වූ ගිහි නිලධාරි තනතුරු නාම වශයෙනි. මෙම තනතුරු නාම අතරෙන් ගිහි නිලධාරී තනතුරු නාම විශේෂයෙන් වැදගත් ය. ආරාම පාලනයෙහි යොදවන ලද්දවුන්ගේ තනතුරු නාම අතරෙන් මාතෘකාවට ඍජු ව අදාළ වන **ආර්ථික කටයුතු හා සම්බන්ධ ජීවන වෘත්තීන් හා රැකී රක්ෂා** පිළිබඳ පමණක් කරුණු සඳහන් කර ඇත.

1. ආකැමියා - භාණ්ඩාගාරික
2. ආකැමි - විහාරය පිළිබඳ අයවැය ලියන්නා
3. කරඩි ලෙයා - කරඩු පිළිබඳ ලේකම්
4. නියම් ජෙටු - ආරාම පාලක මණ්ඩලයේ ප්‍රධානියා
5. පසක් කැම් - අයවැය පරීක්ෂක
6. පියන්ගල් පෙරෙවැලි - පධානඝර පරිපාලක
7. වර් ජෙටු - ගණ ප්‍රධානයා
8. වෙහෙර්ලෙයා - විහාරය පිළිබද ලේකම්

ආගමික සාහිත්‍යය ආශ්‍රයෙන් ද තනතුරු නාම රාශියක් හඳුනාගත හැකි ය. අතීතයේ සිට පැවති විවිධ වෘත්තීන් සම්බන්ධ තොරතුරු සපයන ඓතිහාසික මූලාශ්‍රය විශේෂයක් වශයෙන් ද ලෙන් ලිපි හැඳින්විය හැකි ය. වැටුප්, දීමනා හා බදු පිළිබඳවත්, ශ්‍රී ලංකාවේ රජවරු හා ප්‍රභූන් ඒවා පරිහරණය කරන අන්දම පිළිබඳව ද අභිලේඛනයන්හි කරුණු දක්වා ඇත. පස් වන කාශ්‍යප රජු විසින් අභයගිරිය හා චෛතියගිරිය යන මධ්‍යස්ථානයන්හි භික්ෂූන්ට සිවුපසය සැපයීම, ප්‍රවේණිගම් සහ විහාර ගම්බිම් පාලන නීති හා විශේෂ වරප්‍රසාද පිළිබඳ ව සඳහන් කර විහාර කතිකාවතක් ලෙස සලකනු ලබන අනුරාධපුර පුවරු ලිපිය පිහිටුවා ඇත. හතර වන මහින්ද රජු මිහින්තලයේ පිහිටුවන ලද පුවරු ලිපිවල ආරාමික සේවකාදීන්ට ගෙවිය යුතු වැටුප් ප්‍රමාණය සහ විහාරයට අයවිය යුතු බදු පිළිබඳ ව දක්වා ඇත. උදාමහයාගේ පුලියන්කුලම ලිපියෙහි කපාරාමූළයට අයත් පුවරම් වෙහෙරින් පැමිණි භික්ෂූන් දොළොස් දෙනෙකුට ගම්බිම් පිදීම ගැන සඳහන් වේ. කපාරාරාම සංස්කෘත ලිපියේ කපාරාමූළයේ භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා ජල පහසුකම් සැපයීම පිළිබඳ ව තොරතුරු අන්තර්ගත වේ.

අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගයේ අවසානය වශයෙන් පිළිගැනෙන 1815 දක්වා පැවති තනතුරු නාම මෙම ලිපියෙහි සඳහන් කර ඇත. එකී තනතුරු බෞද්ධාගමික මධ්‍යස්ථාන හා ආරාමයන්හි පාලන තනතුරු පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණයක් සහිත තනතුරු නාම බව සඳහන් කළ යුතු ය. කෙසේ වුවත් ආර්ථිකයට අදාළ වූ ද, විගණනය හා ඍජු සබඳතාවක් ඇති තනතුරු නාම ඉතා වැදගත් වන හෙයින් ඊට අනන්‍ය වූ කරුණු ප්‍රමුඛත්වයෙහිලා මේ ලිපියෙහි සඳහන් කෙරේ. මෙම තොරතුරු අනුව අතීත යුගයේ රාජ්‍ය තාන්ත්‍රිකත්වයේ විශේෂත්වය මොනවට පැහැදිලි වේ. මහනුවර යුගයෙන් පසු ශීඝ්‍ර පරිවර්තනයකට ලක් වූ මේ තත්ත්වය වර්තමානයේ දී දක්නට නොලැබේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිසා තනතුරු නාමත් එහි වගකීම හා වගවීමත් සංශෝධනය වී පරිණාමයට පත් වී ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අමරවංශ හිමි, කොත්මලේ (1969), **ලක්දිව සෙල්ලිපි.** කොළඹ : ඇම්. ඩී. ගුණසේන

කරුණාරත්න, ඩේවිඩ් (2011), **එදා හෙළ දිව,** කොළඹ : ඇම්. ඩී. ගුණසේන

ගමගේ, නිමල් ජේ. (1986), **සිංහල ජනකවියේ සාහිත්‍යමය අගය හා සංස්කෘතික ලක්ෂණ**

ගුණසේකර, ලාල් (2004), **හදබැඳි ජනකවි,** මහනුවර : පෙරකුම් ප්‍රකාශකයෝ

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ශිලා ලේඛන සංග්‍රහය 1 වෙළුම** (2000), සංස්. දොන් මර්තීනු ද සිල්වා වික්‍රමසිංහ, කොළඹ : පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

හෙට්ටිආරච්චි, කරුණාසේන (2007), "**ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ශිල්පයෙහි ඓතිහාසික පසුබිම හා නීතිය**", **විද්‍යාරණි**, ගංගොඩවිල : ඉතිහාස හා පුරාවිද්‍යා සංගමය


**ආශ්‍රේය වෙනත් ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය**


කහඳගමගේ, පියසේන. (2008), **කෙතක මහිම : කෙම් පහන්.** කොළඹ : ඇම්. ඩී. ගුණසේන

**තාක්ෂණය, වෛද්‍ය ක්‍රමය සහ කෘෂිකර්මයට අදාළ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දැනුම.** (1983) කොළඹ : යුනෙස්කෝ ආයතනය, (ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දැනුම පිළිබඳ සම්මන්ත්‍රණ වාර්තාව, 01-03 ජූනි 1983)

වීරසිංහ, අමරදාස, (1986). **සිංහල ජනශ්‍රැතිය හැදෑරීම** : කෙටි හැඳින්වීමක්, ගල්කිස්ස : සංස්කෘති ප්‍රකාශනය

සිරිසේන, කොත්මලේ (2007), **සිංහල ජනකවි,** නුගේගොඩ : සරසවි ප්‍රකාශකයෝ

සෙනෙවිරත්න, අනුරාධ. (2009), **පුරාණ සිංහල වාරි සංස්කෘතිය.** කොළඹ : එස්. ගොඩගේ

**Indigenous Knowledge and Sustainable Development**. (1969). Nugegoda : University of Sri Jayewardenapura, Sri Lanka Resource Centre for Indigenous Knowledge 23-39 p.

(Proceedings of the first National Symposium on Indigenous Knowledge and Sustainable Development, Colombo, March 19-20, 1994)

**☺විෂයානුබද්ධ ලිපි**

# රාජ්‍ය විගණනය සහ පුද්ගල බද්ධ විමර්ශනය

**එස්.එම්.ඩී.එස්. සුදීෂ් රෝහිත**

**නියෝජ්‍ය විගණකාධිපති**

ශ්‍රී ලංකාවේ මේ වන විට උද්ගතව තිබෙන දේශපාලන අර්බුදය සහ අස්ථාවරත්වය රාජ්‍ය විගණනයට සෘජුව අදාළ නොවන සහ මැදිහත් වී විසඳිය නොහැකි විෂයයක් හෙයින් ඒ පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමක් රාජ්‍ය විගණනයෙන් සිදු නොකෙරිණි. එහෙත් රටෙහි පවතින ආර්ථික තත්ත්වය, රාජ්‍යය ණයකරණයේ දිශානතිය සහ උපයෝජනය ආදිය පිළිබඳව වර්ෂ ගණනාවක සිට රාජ්‍යය විගණනය විසින් අනාවරණ කරන ලද බව කිව යුතුය. ඒවා වටහා ගත හැකි මට්ටමක බුද්ධියක් සහිත ඕනෑම අයකුට වත්මන් ආර්ථික අර්බුදයේ පෙරනිමිති වර්ෂ ගණනාවක සිට දැකිය හැකිව තිබුණි. එම පෙර නිමිති සබුද්ධිකව ග්‍රහණය කර ගෙන විනිමය අර්බුදය කේන්ද්‍රකොට ගෙන පැන නැග ඇති වත්මන් අසහනකාරි තත්ත්වය වළක්වා ගැනීමට පූර්ව පියවර නොගත් සියලු බලධාරින්ට මෙම වගකීමෙන් බැහැර විය නොහැකිය. කඩිනම් සහ සැලසුම්සහගත විසඳුම් ප්‍රතිකර්ම සකස් කර ඉදිරිපත් කළ යුතු අධිකාරි බලය සහිත පාර්ශව තම වෘත්තිමය අධිකාරි බලය නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීමත් දේශපාලන අධිකාරිය හමුවේ සුවචව නිර්වින්දන තත්ත්වයකින් පසුවීමත් මෙම අර්බුදය තීව්‍ර වීමට හේතු වී ඇත.

රාජ්‍ය විගණනය විසින් විවිධ පැතිකඩ ඔස්සේ එනම් මූල්‍ය, කාර්ය සාධන, විමර්ශන, පරිසර, විශේෂ වාර්ෂික වාර්තා සහ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව (COPA) හෝ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) වෙත විමර්ශන සභය සඳහා වාර්තා නිකුත් කරනු ලැබේ. ව්‍යවස්ථාදායකය වෙත ඉදිරිපත් කරන විගණකාධිපති වාර්තාවල අන්තර්ගත නිරීක්ෂණ සහ නිර්දේශවල ගැඹුර වටහා ගෙන ඒවායෙන් පෙන්වා දෙන ඌනතා, ආකාර්යක්ෂමතා, වංචා වැළැක්වීම සඳහා ක්‍රියාත්මක නොවීම ගැටලුවකි. එවැනි සන්දර්භයක මහජන නියෝජිතයන් ද මේ වන විට රාජ්‍ය විගණනයේ වැදගත්කම පිළිබඳව ප්‍රකාශ කිරීම දෛවයේ සරදමක් ලෙස සැලකිය හැකිය.

සාම්ප්‍රදායික අනුගාමී මානසිකත්වයෙන් බැහැර වූ තරුණ ප්‍රජාව මෙම අර්බුදය කඩිනමින් විසඳීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් ඉදිරිපත් කරන ඉල්ලීම් ඇතැම් විටෙක පවත්නා ව්‍යවස්ථාපිත තත්ත්ව ඉක්මවා යාමක් ලෙස අර්ථකථනය කළ හැකි වුවද එම ප්‍රජාව ප්‍රමුඛ කරගත් පුරවැසියන්ගේ පණිවුඩයේ යථාර්ථය සියලු පාර්ශව වටහා ගත යුතුය. එලෙසම විසඳුම් සෙවීමට තරම් ගැටලුවක් නොමැති යැයි සිතා නිද්‍රාගතව සිටි පාර්ශ්වවලට විසඳිය යුතු සැබෑ අර්බුදයක් පවතින බවට ඒත්තු ගැන්වීමේ ගෞරවය එම තරුණ ප්‍රජාවට හිමි විය යුතුය.

පුරවැසියන්ගේ සහ මහජන නියෝජිතයන්ගේ මෙම පිබිදීම හමුවේ වංචා හා දූෂණයෙන් තොර දේශයක් බිහිකිරීමෙහිලා රාජ්‍ය විගණනයේ වැදගත්කම මේ වන විට නන් දෙසින් ඉස්මතු වෙමින් පවතී. නුදුරු අතීතයේ ජනප්‍රිය කියමනක් වූ පළමුවත් දෙවනුවත් සහ තෙවනුවත් මව්බිමය යන ප්‍රකාශය සිහිගන්වමින් පළමුවත්, දෙවනුවත්, තෙවනුවත් විගණනය යන වැකිය සහිත පුවරු සමාජයේ බොහෝ තැන්වල ප්‍රදර්ශනය වන්නේ එබැවිනි.

කෙසේවෙතත් පවත්නා නෛතික අධිකාරි රාමුව අතුළත විෂයපථයෙන් බැහැර කර ඇති ක්ෂේත්‍ර

වෙත පිවිසීමට විගණකාධිපතිට බලයක් නොමැති බව බොහෝ පුරවැසියන් නොදන්නවා විය හැකිය. එම පසුබිමේ මහජන නියෝජිතයන් උපයා ඇති වත්කම් පිළිබඳව පරීක්ෂා කර අයථා ලෙස උපයා ඇති වත්කම් රාජසන්තක කිරීමේ කාර්යයද ඇතැම් පාර්ශව විගණකාධිපති වෙතින් අපේක්ෂා කරන බව පෙනේ. එවැනි පුද්ගල බද්ධ විමර්ශනයක් කිරීමේ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ 2018 අංක 19 දරන ජාතික විගණන පනතෙන් හෝ වෙනයම් ලිඛිත නීතියක් මඟින් හෝ විගණකාධිපති වෙත පැවරී නොමැත. එහෙයින් තමන්වද විගණනයට භාජනය කරන ලෙස ඇතැම් මහජන නියෝජිතයින් ප්‍රසිද්ධියේ සහ ලිඛිතව කරන ප්‍රකාශ සත්භාවයෙන් කරන ඒවා විය හැකි වුවද පවත්නා නෛතික තත්ත්ව යටතේ එවැනි ඉල්ලීම් මාධ්‍ය සංදර්ශනයකින් ඔබ්බට යන වටිනාකමක් ඇති ඒවා නොවන බව කිව යුතුය.

ශ්‍රී ලංකාව මේ වන විට මුහුණ දී ඇති අර්බුදකාරී තත්ත්වයට ඉවහල් වූවා යැයි නන් අයුරින් ප්‍රකාශිත වංචනික චෝදනා සහිත ගනුදෙනු හා සිද්ධීන් විගණනයට අදාළව රාජ්‍ය විගණනයේ මැදිහත් වීම ප්‍රමාණාත්මක නොවූයේද සහ එසේ නම් ඒ කවර හේතු මතද යන්න ජනතාව වටහාගත යුතුව ඇත. ඇතැම් ආයතන ප්‍රධානීන් රාජ්‍ය මුදල් මිලියන ගණනින් වැයකරමින් විගණකාධිපතිට එරෙහිව තහනම් නියෝග ලබාගැනීම වැනි කරුණුද රාජ්‍ය විගණනයේ මැදිහත් වීම අඩපන වීමට හේතුවී ඇත. ඉහතදී සඳහන් කළ පරිදි මහජන නියෝජිතයන්ට පමණක් නොව නිලධාරින්ට අදාළවද අයථා ලෙස වත්කම් උපයා ගැනීම පිළිබඳව විමර්ශනය කිරීමේ බලයක් විගණකාධිපතිට නැත. එසේවුවත් 2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව විගණනයට යටත් ආයතනයක ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති ගනුදෙනුවක් මඟින් ඊට සම්බන්ධ තැනැත්තන්ගේ වංචාවන්, නොසැලකිල්ලක්, සාවද්‍ය පරිහරණයන් හෝ දූෂණයක් හේතුකොට ගෙන යම් ඌනතාවක් හෝ පාඩුවක් හෝ සිදු වී ඇති විට එම වටිනාකම දීර්ඝ ක්‍රියාවලියකින් අනතුරුව අධිභාර කිරීමේ හැකියාව ලබා දී ඇත. එහෙත් එම අධිභාරය අයකර ගැනීමේ කාර්යය මහේස්ත්‍රාත් අධිකරණයේ විමර්ශය දක්වා දිවෙන දීර්ඝ ක්‍රියාවලියකින් යුතුව පවරා ඇත්තේද අදාළ විගණිත ආයතනය භාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වන අමාත්‍යාංශ ලේකම්වරයාටමය. මෙලෙස වැටකඩොලු බාධක රාශියකින් හෙබි අධිභාර ක්‍රියාවලිය මඟින් එකදු අධිභාරයක් හෝ බලාත්මක කිරීමට ප්‍රථම විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ජාතික විගණන කොමිසම අහෝසි කෙරිණි. එබැවින් තාක්ෂණික දෝෂ සහිතව හෝ ජාතික විගණන පනතකින් විගණන සේවා කොමිෂන් සභාවට ලබා දී තිබූ අධිභාර බලතල ස්වභාවික මරණයකට ලක්ව ඇත. ඇතැම් ආයතන ප්‍රධානීන් රාජ්‍ය මුදල් මිලියන ගණනින් වැය කරමින් විගණකාධිපතිට එරෙහිව තහනම් නියෝග ලබාගැනීම වැනි කරුණුද රාජ්‍ය විගණනයේ මැදිහත් වීම අඩපන වීමට හේතු වී ඇත.

එම තත්ත්වය තවදුරටත් පැහැදිලි කරන්නේ නම් විගණකාධිපති විසින් අනාවරණය කරගනු ලබන ඌනතා හෝ පාඩු හෝ නැවත අය කර ගැනීමේ අධිභාර බලතල විගණකාධිපති වෙතම පැවරීම මගින් අධිභාර ක්‍රියාවලියේ තුලන හා සංවරණය (Check and Balance) නැති වී යා හැකි බවට වූ තර්කමත එය විගණකාධිපතිගේ විෂය පථයෙන් බැහැරට ගෙන ගියේය. ඒ අනුව විගණකාධිපති විසින් නිරීක්ෂණය කරනු ලබන අධිභාර නිම්ති විගණකාධිපති ප්‍රධානත්වය දරන පෙරදී විගණකාධිපති දෙපාර්තමේන්තුව ලෙස හඳුන්වන ලද වත්මන් ජාතික විගණන කාර්යාලයෙන් බැහැර තවත් ස්වාධීන ආයතනයක් ලෙස 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කරන ලද ජාතික විගණන කොමිෂන්

සභාව මඟින් අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කිරීම සඳහා ජාතික විගණන පනත මගින් ප්‍රතිපාදන අනුව හඳුන්වා දී තිබුණි. මෙහිදී තවදුරටත් පැහැදිලි කළ යුතු අමතර කරුණක් තිබේ. එනම් විගණකාධිපතිවරයා ආයතන ප්‍රධානි වන ජාතික විගණන කාර්යාලය (විගණකාධිපති දෙපාර්තමේන්තුව ලෙස පෙරදී හඳුන්වන ලද) සහ විගණකාධිපතිවරයාට තීරක ඡන්දයක් පමණක් හිමිව නිල බලයෙන් සභාපති ධුරයට පත් වන විගණන සේවා කොමිෂන් සභාව ආයතන දෙකක් බවත් රාජ්‍ය විගණනය විගණන සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන කාර්යයක් නොවන බවත්ය. විගණන සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත්තේ ජාතික විගණන කාර්යාලයේ මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය තහවුරු කර විගණකාධිපතිගේ කාර්යය මණ්ඩලයට සහ ජාතික විගණන කාර්යාලයට අවශ්‍ය සේවා සැපයීම සඳහා මිස රාජ්‍ය විගණන කාර්යයේ නියැළීම සඳහා නොවන බව අවධාරණය කළ යුතුය.

ඉහතදී සඳහන් කළ පරිදි අධිහාර ක්‍රියාවලියේ නිරවද්‍යතාව සහ ස්වාධීන බව ශක්තිමත් කිරීම සඳහා එම ක්‍රියාවලියට අදාළ අතරමැදි කාර්යයක්ද විගණන සේවා කොමිෂන් සභාව වෙත පවරා තිබුණි. තවද විගණන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන විගණකාධිපති ලැබෙන තොරතුරුවල රහස්‍ය භාවය ආරක්ෂා කිරීමේ වගන්තිය මඟින් බැඳ තබා ඇති බැවින් විගණන සේවා කොමිෂන් සභාව වෙත එම අධිහාර තොරතුරු සන්නිවේදනය කිරීමේ සීමා පනවා තිබූ බවද කිව යුතු ය.

කෙසේවෙතත් විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක කිරීමේ දී විගණන සේවා කොමිෂන් සභාව මගින් කළ යුතුව තිබූ අධිහාර ක්‍රියාවලියේ කාර්යභාරයන් ඇතුළු ඇතැම් කාර්යය හා කර්තව්‍යය සඳහා විකල්ප ආයතනයක් හෝ ක්‍රමවේදයක් හෝ හඳුන්වා දීමකින් තොරව විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම හේතුවෙන් විගණන නිරීක්ෂණ මඟින් අධිහාර කිරීමේ ජනතා අපේක්ෂා සුන් වී ඇත.

පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ ජාතික විගණන පනතින් හෝ වෙනත් කිසිදු ලිඛිත නීතියකින් හෝ අධිකාරි බලයක් පවරා නොමැති තත්ත්වයක පුද්ගල බද්ධ විගණන සිදුකර වංචා දූෂණ පිටු දැකීමේ ක්‍රියාවලියක් විගණකාධිපති වෙතින් අපේක්ෂා කිරීම නිරර්ථකය. අධිහාර බලතල විගණකාධිපති වෙත ලබාදීම අවංක හා බුද්ධිමත් පුරවැසියන් ගේ සහ ඇතැම් මහජන නියෝජිතයන්ගේ අපේක්ෂාවක් වුවද ජාතික විගණන පනත මගින් ඒ අරබයා විගණකාධිපතිවරයාට ප්‍රමාණවත් තරම් බලයක් ලබා නොදුනි. ඒ පසුපස රාජ්‍ය දේපොළවලට අදාළ විවිධ වංචනික ක්‍රියාවල නියුතු පිරිස් මෙන්ම ඔවුන්ට සහාය දක්වන අය සිටි බව රහසක් නොවේ.

පවත්නා නෛතික රාමුව සංශෝධන කිරීමකින් තොරව ජනතා අපේක්ෂාවන් මුළුමනින්ම ඉටු නොවේ. විෂය පථය සීමා කිරීම් මධ්‍යයේ වුවද රාජ්‍ය විගණනය විසින් ඉමහත් කැපකිරීම් කරමින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණන වාර්තා පිළිබඳව නිසි අවධානය යොමු වූයේ නම් මෙලෙස පුද්ගල බද්ධ විගණනයක අවශ්‍යතාවක් පැන නොනඟිනු ඇත. මාධ්‍ය මඟින්ද ප්‍රචාරය වී ඇති පරිදි විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ විවිධ කාරක සභාවල සාකච්ඡාවට භාජනය වීමේ දී ඒවායෙහි ඇතුළත් නිරීක්ෂණ සහ චෝදනා දියාරු තත්ත්වයට පත් කිරීමට විවිධ උපක්‍රම යොදා ඇති බව නොරහසකි.

තවද ශ්‍රී ලංකාවේ සමස්ත රාජ්‍ය ණය වත්කම් බැරකම් සහ රාජ්‍ය ආදායම් හා වියදම් ආදිය පිළිඹිබු වන ජන රජයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති විසින් සිය මතය ප්‍රකාශ කරන ලද ඇතැම්

අවස්ථාවලදී විගණකාධිපතිවරයාට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ආ යුතු බවට ඇතැම් මහජන නියෝජිතයන් අදහස් දක්වා තිබුණි. එවැනි චර්යා මගින් පැහැදිලි වන ප්‍රධානතම කරුණක් වන්නේ ඇතැම් මහජන නියෝජිතයන් සහ ඔවුන්ගේ අනුගාමීන් ද රාජ්‍ය විගණනයේ පණිවුඩය වටහා නොගෙන තාවකාලික පැවැත්ම සඳහා කටයුතු කරන බවයි.

රාජ්‍ය විගණනය විසින් ව්‍යවස්ථාපිත විගණනය ලෙස කළ යුතු ව තිබූ විගණනයන්ගෙන් ඔබ්බට ගොස් විශේෂ විගණන, කාර්යසාධන විගණන පරිසර විගණන ලෙස පසුගිය වර්ෂ කිහිපයේදී විශාල ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරමින් වාර්තා නිකුත් කර තිබුණි. එහෙත් එම වාර්තාවලින් ඉතා සුළු ප්‍රමාණයක් පමණක් මහජන නියෝජිතයන්ගේ සහ ජනතාවගේ අවධානයට යොමු විය. රුපියල් බිලියනවලින් ගණනය කර ඇති ප්‍රශ්නගත කරුණු කිසිදු පාර්ශවයක අවධානයට ලක් නොවී යටපත් වූ අවස්ථා එමටය. විගණකාධිපති විසින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳව ප්‍රමාණවත් පරිදි ජනතාව දැනුවත් නොවීමද ගැටලුවකි. වෘත්තිය ආචාර ධර්ම සහ රහස්‍යභාවය පිළිබඳ පවත්නා සීමා කිරීම්වලට අනුගතව පාර්ලිමේන්තුව වෙත සහ අධිකරණමය කාර්යයන් සඳහා තොරතුරු අනාවරණය කිරීම හැර විගණකාධිපතිවරයාට මාධ්‍ය ප්‍රකාශකයකු ලෙස කටයුතු කිරීමේ සීමාවන් පැවතීමද මෙම මහජන නොදැනුවත්භාවයට හේතු වී ඇත. මේ අරබයා ප්‍රයෝජනවත් අයුරින් යොදා ගත හැකි විකල්පයක් නම් විගණකාධිපති වාර්තා ජාතික විගණන කාර්යාලයේ නිල වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධියට පත්කරන හෙයින් ඒවා පරිශීලනයට ජනමාධ්‍ය සහ සිවිල් පුරවැසියන් හුරු කරවීමයි. විශේෂයෙන්ම මේ වන විට දේශයේ පවත්නා අර්බුදය වටහා ගෙන මහමඟට පිවිස ඇති තරුණ ප්‍රජාව තමන් සතු ජංගම දුරකථනය උපයෝගී කරගෙන හෝ විගණකාධිපති වාර්තා පරිශීලනයට යොමු වන්නේ නම් ඉතා වැදගත්ය. එවිට ඔවුන්ට රටේ සිදුවන වංචා දූෂණ ගැන නිවැරදිව දැනුම්වත් විය හැකිය. එමගින් වංචනික නිලධාරින්ටද සිය චර්යාවන් නිවැරදි කර ගැනීමට සිදුවනු නොඅනුමානයි.

උද්ගතව ඇති වත්මන් අර්බුද සහ ඉදිරියේදි ඇති විය හැකි මෙවැනි අර්බුද විසඳීමට රාජ්‍ය විගණනයේ මැදිහත්වීම අවශ්‍ය බවට විශ්වාස කරන පුරවැසියන්ගේ ප්‍රමුඛ කර්තව්‍යයක් විය යුත්තේ රාජ්‍ය විගණනයට පවත්නා සීමා බන්ධන ජාත්‍යන්තරයේද පිළිගත හැකි මට්ටමකට ඉවත් කර විගණකාධිපතිවරයාගේ බලතල ශක්තිමත් කළ යුතු බවට වන කතිකාව ශක්තිමත් කිරීමය. ඒ අරබයා මහජන නියෝජිතයන්ට බලපෑම කිරීමයි. එසේ වුවහොත් මහජන නියෝජිතයන් මෙන්ම නිලධාරී තන්ත්‍රයද රජය වැය කරන සෑම රුපියලකටම වගවීමට හා වගකීමට බැඳී ජනතා අපේක්ෂාවන් ඉටුවන ශක්ති සම්පන්න ශ්‍රී ලංකාවක් බිහිවනු ඇත.

# විගනණයේ දී අවදානම් හදුනා ගැනීම සහ තක්සේරු කිරීම

-----------------------------------------------------------------

**ඉන්දික සමන්ත**
**විගණන අධිකාරි**

අවදානම යන වචනය අපි විසින් විගණනයේ දී අවධානය යොමු කළ යුතු වැදගත් සංකල්පයක් වේ ඒ මන්ද යත් සාර්ථක විගණනයක් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සදහාත් විගණකයාගේ අවදානම අඩු කර ගැනීම සඳහාත්මේ පිළිබඳ අවධානය යොමු කිරීම වඩාත් වැදගත් වේ මෙහිදී පහත දැක්වෙන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළ යුතුය

**01 මූල්‍ය ප්‍රකාශවල සත්‍යය හා සාධාරණ භාවය**

-----------------------------------------------

කළමනාකරණය විසින් ප්‍රමාණාත්මක සාවද්‍යතාවයන්ගෙන් තොර විශ ්වාසනීය ලෙස මූල්‍ය කාර් ්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් ඉදිරිපත් කල යුතු අතර එය කළමණාකරනයේ වගකීම වේ එම මූල්‍ය ප්‍රකාශන කට්ටලය පිළිබඳව

1. විගණකගේ සමස්ත අරමුණ වනුයේ (ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 200 හි 11 ඡේදය) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශණ වැරදි හා වංචා හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් වලින් තොර බවත්, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කළ හැකිවන ආකාරයට සෑම ප්‍රමාණාත්මකතාවයකින්ම යුතුව අදාල මූල්‍ය වාර් තා කරන රාමුවට අනුව පිළියෙල කර ඇති බවට සාධාරන තහවුරුවක් ලබාගැනීම සහ

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ,විගණන පනතේ සහ වෙනත් අණපනත් වල දැක්වෙන ආකාරයට මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකගේ විගණන නිරීක්ෂණ පාර් ලිමේන්තුවට සහ අනෙකුත් අ ාල පාර් ශවයන්ට වාර් තා කිරීම යි.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා විගණකයා විසින් අවදානම් පාදක විගණන ප්‍රවේශය අනුගමනය කළ යුතු අතර ප්‍රමාණාත්මක වැරදි සිදුවීමේ අවදානම හඳුනාගෙන එය ඇගයීමට ලක් කළ යුතුය විගණිත ආයතන වුවද මෙම උපක්‍රමය යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශන ඇල්මක් දක්වන පාර්ශවයකට . ඉදිරිපත් කිරීමට පෙර සිදු විය හැකි සාවද්‍ය ප්‍රකාශයන් නිවැරදි මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කළ හැකිය.

**වැරදි සහගත ප්‍රකාශනයන් යනු කුමක්ද (SLAUS 200- para 13 (i) )**

කිසියම් මූල්‍ය රාමුවකට අදාළව එනම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හෝ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ආදී ලෙස ගත් කලවිගණිත ආයතන විසින් අනුගමනය කරනු ලබන මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා කළ යුතුව තිබූ වටිනාකම්ඉදිරිපත් කිරීම් වර්ගීකරණයන් හෝහෙළිදරව් කිරීම් සහ ඇතුළත් කර ඇති වටිනාකම් වර්ගීකරණයන් ඉදිරිපත් කිරීමේ හෝ .හෙළිදරව් කිරීම් අතර වෙනස්කම් වේ

**02 මූල්‍ය ප්‍රකාශනවල සැසඳුම්(SLAUS 315- para A 129 )**

-----------------------------------------------------------------

සැසඳුම් යනු මූල්‍ය ප්‍රකාශන වල අයිතමයන්හි ( ගණුදෙනු හා සිද්ධීන් ගිණුම් ශේෂඉදිරිපත් කිරීම් සහ හෙළිදරව් කිරීම් යනාදියයි)පැවතිය යුතු යයි මහජනතාව බලාපොරොත්තු වන ගුණාංග වන අතර ඒවා තිබේදැයි යන්න විගණකයා විසින් පරික්ෂා කර බැලිය යුතුයඑම සැසඳුම් නොමැති කල්හි .ඒවා තුළින් විවිධ වැරදි සහගත ප්‍රකාශයන් මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත්ව තිබිය හැක උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

***ගිණුම් ශේෂ සහ ඒ ආශ්‍රි (ස්කන්ධය ,වගකීම්,වත්කම් )හෙළිදරව් කිරීම් වලට අදාල සැදැහුම් ( SLAUS 315 – para 129 )***

-පැවැත්ම (Existence)
අයිතිය හා වගකීම්-(Right and ….
සම්පූර්ණත්වය- (Completeness)

තක්සේරු කිරීම හා ප්‍රතිපාදන , නිරවද්‍යතාවය- ( Accuracy , valuation & allocation)
වර්ගීකරණය- ( Classification )
ඉදිරිපත් කිරීම- ( presentation )

***ගණුදෙනු සිද්ධීන් සහ එම හෙළිදරව් කිරීම් වලට අදාළ සැදැහුම් (SLAUS 315 – para A 129)***
-සිදුවීම (occurrence)
සම්පූර්ණත්වය- (Completeness)
නිරවද්‍යතාවය- ( Accuracy )
ලුහුකම් ක්‍රියාවලිය-( cut off )

වර්ගීකරණය- ( Classification )
ඉදිරිපත් කිරීම- ( presentation )

**03 අවධානම් තක්සේරු කිරීම (Risk Assessment)**
---------------------------------
අවදානම් තක්සේරු කිරීම යනු විගණකට ලැබී ඇති මූල්‍ය ප්‍රකාශනවල සාවද්‍ය ප්‍රකාශයන් ඇතුළත්ව තිබීමට ඇති හැකියාව පිළිබඳව කරනු ලබන ක්‍රියාවලියකි මෙහිදී වඩාත් වැඩි අවදානම(High Risk), සාමාන්‍ය අවධානම ( Average Risk ) සහ පහළ අවධානම් ( Low Risk ) සහිත ක්ෂේත්‍ර හඳුනාගැනීමේ අවකාශය ලැබෙන අතර ඒ අනුව පවත්නා සම්පත්මනා ( මානව හා භෞතික ) කළමණාකරණය තුළින් ක්‍රියාත්මක කළ යුතු විගණන පිළිවෙත් අනුගමනය කිරීමෙන් විගණන මතය ඉදිරිපත් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර ගත හැකිවන අතර විගණකයාගේ අවදානම අඩුකර ගත හැකිය.මේ සඳහා පහත අනුගමනය කළ හැකිය .
ප්‍රශ්න කිරීම (Enquiries)
නිරීක්ෂණය කිරීම- (Observations)
පරීක්ෂා කිරීම -(Inspections)
විග්‍රහාත්මක සමාලෝචනය-(Analytical Procedures)

**04 ව්‍යාපාරික ආයතනික අවදානමට එරෙහිව විගණන අවදානම**
---------------------------------------------------------------------
ව්‍යාපාරික අවදානම සහ විගණන අවදානම වෙන්වෙන්ව හඳුනා ගත යුතු වන අතර ව්‍යාපාරික අවදානම තුළින් පැන නැගිය හැකි විගණන අවදානම ද හඳුනාගත යුතුය.

**ව්‍යාපාරික අවදානම(Business Risk )**
ව්‍යාපාරයක ස්වභාවයෙන් ම පවත්නා අවදානම මින් අදහස් වේ. මෙම අවදානම නිසා මූල්‍ය ප්‍රකාශන වලට සාවද්‍ය ප්‍රකාශ ඇතුළත් කිරීමට ඇති හැකියාව පිළිබඳව අවදානම විගණකයා විසින් සොයා බැලිය යුතුය.

උදා-
1. තරගකාරීත්වය
2. නිෂ්පාදනයේ ගුරුත්වය
3. ව්‍යාපාරික වෙනස්වීම
4. මෙහෙයුම් කටයුතුවල වෙන්ස් වීම.

**විගණන අවධානම (Audit Risk)**

මූල්‍ය ප්‍රකාශන වරදවා දක්වා තිබියදීත් විගණකයා විසින් ඊට උචිත නොවන විගණන මතයන් ප්‍රකාශ කිරීමේ අවදානම මින් අදහස් වේ.

උදා.වැරදි ලෙස ආදායම් හඳුනාගැනීම -( SLFRS – 15)

වැරදි ලෙස දේපළ, පිරියත සහ උපකරන ප්‍රාග්ධනිත කිරීම.( LKAS – 16 )
විගණන අවධානම යන්න ***සාවද්‍ය ප්‍රකාශ පැවතීමේ අවධානම*** සහ ***හෙළිදරව් කිරීමේ අවධානම*** ලෙස කොටස් වන අතර සාවද්‍ය ප්‍රකාශ පැවතීමේ අවධානම යන්න ***ආවේණික අවධානම*** සහ ***පාලන අවධානම*** ලෙස නැවත බෙදේ.එය පහත පරිදි සාරාංශ කළ හැකිය.




**විගණන අවදානම හෙළිදරව් කිරීමේ අවදානම+පාලන අවදානම+ආවේනික අවදානම =**
**Audit Risk= Inherent Risk + Control Risk+ Detection Risk**

ඉහත සඳහන් විගණන අවධානම් හඳුනාගත් පසු එම අවධානම් අඩුවන ආකාරයට ඊට ප්‍රතිචාර දැක්විය යුතු ය එනම් විගණන ප්‍රවේශයන් හරහා උචිත විගණන පටිපාටි හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතු ය.කි 2 ඒ සඳහා ප්‍රවේශ

**1 සාම්ප්‍රදායික ප්‍රවේශය (Procedural Approach)**

මෙහිදී කිසියම් සාම්ප්‍රදායික විගණන පටිපාටි කිහිපයක් අනුගමනය කරන අතර එය සම්පූර්ණයෙන්ම අවධානම් පාදක විගණනයට පරස්පර වේ.

**2 අවධානම් පාදක විගණන ප්‍රවේශය(Risk based Approach)**

මෙම ප්‍රවේශය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවල සඳහන් පරිදි සිදුවන අතර සේවාදායකයාගේ ව්‍යාපාරික කටයුතුවල, ගනුදෙනුවල සහ පද්ධතිවල පවත්නා අවධානම හඳුනාගෙන ඒ තුළින් සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමට හැකි ප්‍රදේශවලට ඍජුව පරීක්ෂණයන් දියත් කිරීම මෙහිදී සිදුවේවිශේෂයෙන්ම එනම් , මූල්‍ය ප්‍රකාශන තුළ සාම්ප්‍රදායික ලෙස කටයුතු කිරීමට වඩා ව්‍යාපාරික අවධානම් ප්‍රවේශය ඊට හේතුව වන්නේ මූල්‍ය ආයතනයේ ඉහළ සිට පහළටම අවධානම යොමු කිරීම වඩා යෝග්‍ය වේ ප්‍රකාශන තුළ කළමණාකරනය විසින් සාවද්‍ය ප්‍රකාශ ඇතුළත් කිරීමට විශේෂයෙන්ම සිදුවන්නේ ව්‍යාපාරික කටයුතුවල සිදුවන වෙනස් වීම් පාදක කරගෙනය.

**අවධානම් හඳුනාගැනීමේදී විග්‍රහාත්මක සමාලෝචනය යොදා ගැනීම**
**(Use of analytical procedures during risk assessment)**

මූල්‍යමය තොරතුරුවල සහ මූල්‍යමය නොවන තොරතුරු අතර පවත්නා සම්බන්ධතාවයන් හඳුනාගැනීම මෙහිදී සිදුවේ 315 මේ සඳහා විගණන ප්‍රමිත (SLAUS 315 ) ට අනුව මෙය සිදුකළ යුත්තේ විගණන අවධානම තක්සේරු කරන අදියරේදීය විග්‍රහාත්මක සමාලෝචනය පහත දැ වලින් සමන්විත වේ.

1 පසුගිය කාල පරිච්ඡේදවල සමාන තොරතුරු පුරෝකථනයන අපේක්ෂිත ප්‍රතිඵල ් සහ අදාල කර් මාන්තයේ තොරතුරු සමඟ සංසන්දනය කිරීම.

2 අනුපාත විශ්ලේෂනය

අතීත අත්දැකීම් මත පදනම්ව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මූලධර්ම වත්කම්,වියදම්,ආදායම්,වගකීම්,ස්කන්ධය.අතර පැවතිය හැකි සම්බන්ධතාවයන් සොයාබැලීමයි උදාහරන ලෙස දළ ලාභය සහ විකුණුම් අතර සම්බන්ධතාවය.

3 මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු අතර පවතින සම්බන්ධතාවය සොයා බැලීම.
උදාහරන ලෙස වැටුප් පිරිවැය සහ සේවක සංඛ්‍යාව අතර සම්බන්ධතාවය.

මීට අමතරව අවධානම තක්සේරු කිරීම සඳහා පහත ක්‍රම ද අනුගමනය කළ හැකිය.

- එකට බැඳුනු ගිණුම් අතර සම්බන්ධතාවය පරීක්ෂාකිරීම.
  උදා- විකුණුම් සහ ණයගැතියෙන්
- උපනිත විශ්ලේෂණය (Trend analysis)
- සාධාරණ පරීක්ෂාවන් ( Reasonable Test )
- ප්‍රතිපායන විශ්ලේෂණය (Regression analysis)

අවධානම් තක්සේරු කිරීම සඳහා Power B1 , ACL වැනි දත්ත විශ්ලේෂණ උපක්‍රම සහ ක්‍රමවේදයන්ද අනුගමනය කල යුතු ය.

**ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් පැවතීම තක්සේරු කිරීම.(Assessing the risk of Material Misstatements)**

මෙය සිදුකළ හැකි මට්ටම් දෙකකි.

1. **සමස්ථ මූල්‍ය ප්‍රකාශන මට්ටම ( මූල්‍ය ප්‍රකාශන සමස්ථයක් ලෙස ගෙන-Overall Financial Statement Level)**

   උදා- අඛණ්ඩ පැවැත්ම (Going Concern)
   කළමණාකරන විසින් බලය අභිබවා යෑම.
   පාලන පරිසරයේ දූර්වලතා

2. **සැදැහුම් මට්ටම.(Assertion Level)**

   එක් එක් ගිණුම් ශේෂ , ගණුදෙනු සහ හෙළිදරව් කිරීම් වෙන් ගෙන සලකා බැලීම.

   උදා- තොග අගය කිරීම (LKA 02)
   ආදායම් හඳුනාගැනීමේ සම්පූර්ණත්වය (SLSRS 15 )

විගණකයා විසින් අවධානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය තුළ දී බොහෝ අවධානම් ඇති වැදගත් අවධානම්(Significant Risk) හඳුනාගත යුතුය.

**අවධානමට ප්‍රතිචාර දැක්වීම ( විගණන පටිපාටි ) Risk response(Audit Procedures)**

මෙය ආකාර දෙකකට සඳහන් කළ හැකිය.

1. **සමස්ත ප්‍රතිචාර දැක්වීම.(Overall Response)**
   -විගණන කාර්ය මණ්ඩලයට වෘත්තිය ඥානය භාවිතා කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම.
   -අතිරේක සහ වඩාත් පලපුරුදු කාර්ය මණ්ඩලය යෙදවීම
   - පුරෝකථනය කළ නොහැකි දෑ විගණන පටිපාටිය තුළට ඇතුළත් කිරීම.
   -විගණන පටිපාටිවල ස්වභාවය , කාලය සහ ප්‍රමාණය සංශෝධනය කිරීම.

2. **සැදහුම් මට්ටමේදී ප්‍රතිචාර දැක්වීම.(Response at the Assertion Level)**

   මෙය කොටස් දෙකකට සිදුකළ හැකිය

**-පාලන පරීක්ෂාවන් ( Test of Control )**

සැදැහුම් මට්ටමේ දී සිදුවිය හැකි ප්‍රමාණාත්මක වැරදි ප්‍රකාශන වලැක්වීම, හෙලිදරව් කරගැනීම සහ නිවැරදි කර ගැනීම සඳහා පවත්නා පාලනයන්ගේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා සැලසුම්කර ඇති විගණන පරිපාටීන් වේ.

**-නිශ්චිත පරිපාටින් / අනුකූලතා පරීක්ෂාව (Substantive procedures)**

සැදැහුම් මට්ටමේදී සාවද්‍ය ප්‍රකාශයන් හඳුනාගැනීම සඳහා සැලසුම්කර ඇති විගණන පරිපාටීන් වේ.

* නිශ්චිත විග්‍රහාත්මක පරීක්ෂාවන් (Substantive Analytical Procedures)
මෙය විශාල අගයන් සහිත(Large volume) පුරෝකතනය කල හැකි, තොරතුරු ලබාගත හැකි ගණුදෙනු සඳහා යෝග්‍යාවේ.

* ගැඹුරු පරීක්ෂාවන් ( Test of details )

ගිණුම්ශේෂ පිළිබඳව තොරතුරු ලබාගැනීම සඳහා මෙම පරීක්ෂාවන් සිදු කල හැක.

සාවද්‍ය ප්‍රකශයන් පැවතීමට වැඩි ඉඩකඩ ඇති ක්ෂේත්‍ර

1. ආදායම් හඳුනා ගැනීම( SLFR – 15 )
2. අඛණ්ඩ පැවැත්ම. ( LKAS – 01 )
3. සම්බන්ධ පාර්ශවයන් සහ ගිණුම් ශේෂ . . ( LKAS– 24 )
4. සාධාරණ අගයකිරීම්.
5. තොග. . ( LKAS– 02 )
6. වෙන්කිරීම්. . අසාමාන්‍ය වගකීම් සහ සාමාන්‍ය වත්කම් , ( LKAS – 37 )
7. වත්කම් හානිකරණය. . ( LKAS – 36 )
8. ආයෝජන දේපළ ඇගයීම. . ( LKAS – 40 )
9. ණයගැති අයකර ගැනීම . ( SLFR – 09 )
10. අස්පෘශ්‍ය වත්කම් ඇගයීම. ( LKAS – 38 )
11. විදේශ මුදල් පරිවර්තනය ( LKAS 21)
12. විලම්භිත බදු ( LKAS 12)
13. හිමිකම් භාවිත අයිතිය ( SLFRS 16 )
14. අවදානම් කළමණාකරනය ( SLFRS 07 )
15. ජීවවිද්‍යාත්මක තොග අගය කිරීම ( LKAS 41)

විගණන ප්‍රමිත වලට අනුකූලව මනා අවබෝධයෙන් විගණනයන් සිදුකිරීම සඳහා උනන්දුවක් ඇතිකිරීම මෙම ලිපියේ අරමුණයි.

# ප්‍රජා සහභාගිත්ව විගණනය

ජී.ඒ.එම්.අයි. ගුණරත්න
විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති

උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයට (INTOSAI) අනුව, රාජ්‍ය මූල්‍ය කළමණාකරනයේ දී විගණකාධිපතිවරයාගේ කාර්යභාරය වැදගත් වන්නේ එය, පොදු ජන ජීවිත වෙනස් කල හැකි සාධකයක් සේ සැලකෙන හෙයිනි. රාජ්‍ය ආයතන විසින් ජනතා අපේක්ෂාවන් ඉටුවන පරිදි පොදු සම්පත් පරිහරණය කෙරෙන්නේද යන්න සම්බන්ධයෙන් රාජ්‍ය අංශ විගණනයේදී අවධානය යොමු කරනු ලබන හෙයින් විගණකාධිපතිවරයා විසින් සිදුකරන විගණන කාර්යයන් සම්බන්ධයෙන් මහජන විශ්වාසයක් ගොඩනැගී පවතී. මනා ලෙස සැලසුම් කල , කාර්යක්ෂම රාජ්‍ය විගණනයක් මගින් රාජ්‍ය ගිණුම්කටයුතු භාවය පිළිබඳ යාන්ත්‍රණය විධිමත් කිරීමටත්, ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලිය පලදායී ලෙස ශක්තිමත් කිරීමටත් , එමගින් රාජ්‍ය අංශයේ වටිනාකම් වර්ධනය කිරීමටත් හැකිවේ. උත්තරීතර විගණන ආයතනයක් (Supreme Audit Institution) විසින් යම් රාජ්‍ය ආයතනයක් සම්බන්ධයෙන් සිදුකරන ලද විගණනයක ප්‍රතිඵල ප්‍රසිද්ධ කල විට එම රාජ්‍ය ආයතනය විසින් පොදු සම්පත් පරිහරණය කල ආකාරය පිළිබඳ තක්සේරුවක් ලබාගැනීමට ඒ පිළිබඳ උනන්දුවන පාර්ශවයන්ට හැකියාව ලැබේ. ඒ ආකාරයට, රාජ්‍ය මූල්‍ය කළමණාකරනය ඇතුලත්ව රාජ්‍ය පරිපාලනය සම්බන්ධ කාර්යයයේදී රාජ්‍ය ආයතනවල ගිණුම්කටයුතු භාවය, කාර්යක්ෂමතාවය, පලදායි භාවය සහ විනිවිද භාවය යන ගුණාංග වර්ධනය කිරීමට උත්තරීතර විගණන ආයතනයකට දායකත්වය සැපයිය හැකිය. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා රාජ්‍ය කටයුතු සම්බන්ධයෙන් ගිණුම්කටයුතු භාවය , විනිවිද භාවය හා අවංක භාවය යනාදී ගුණාංග ආරක්ෂා කිරීම මෙන්ම ස්වාධීන, පලදායී හා වගකීම් සහගත උත්තරීතර විගණන ආයතනයක පැවත්මද අත්‍යාවශ්‍ය අංගයක් ලෙස සැලකේ.

ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමයකදී, මහජනතාවගේ අභිමතාර්ථයක් ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් මහජන නියෝජිතයින් වෙත බලය පැවරීම පිළිබඳ යාන්ත්‍රණයන් පිහිටුවා ඒවා ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යවස්ථාදායකය හා විධායකය එම යාන්ත්‍රණයේ මූලික අංග වේ. ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමයකදී ජනතාව අත්දකින මූලික අවදානම් ක්ෂෙත්‍රය වන්නේ මහජන නියෝජිතයින් හා රාජ්‍ය ආයතන වෙත ජනතාව විසින් පවරන ලද බලය හා රාජ්‍යය සතු සම්පත් අව භාවිතයට හෝ අව කළමණාකරනයට පවතින ඉඩ ප්‍රස්ථාව වේ. රාජ්‍ය බලය හා සම්පත් අවභාවිතා වන විට ප්‍රජාතන්ත්‍රවාදි පාලන ක්‍රමය පිළිබඳ ජනතා විශ්වාසය ද බිඳවැටේ. මහජන නියොජිතයින් ගෙන් සමන්විත ව්‍යවස්ථාදායකය හා විධායකය, තමන් විසින් ගනු ලබන තිරණ සම්බන්ධයෙන් වග වන බව තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් ජනතාවට අවශ්‍ය වන්නේ මේ නිසාමය.

උත්තරීතර විගණන ආයතනයකින් මහජනතාව බලාපොරොත්තුවන අග්‍රස්ථ අරමුණ වන්නේ රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් මෙම වගවීමේ ක්‍රියාවලිය සතුටුදායක ලෙස ක්‍රියාත්මක වන්නේද යන්න තහවුරුකර ගැනීමයි. රාජ්‍ය විගණනයේ අරමුණු හා විෂය පථය, පෞද්ගලික විගණනයේ අරමුණු හා

විෂය පථයට වඩා පුළුල් හා සංකීර්ණ වන්නේ මේ හේතුවෙනි.

වඩාත් සාර්ථක රාජ්‍ය විගණනයක් ක්‍රියාත්මක කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් මහජන අපේක්ෂාවන් නැතහොත් මහජන අභිමතාර්ථයන් හඳුනාගැනීම වැදගත් වේ. රාජ්‍ය විගණනය පිළිබඳ මහජන අපේක්ෂාවන් පුද්ගලයාගෙන් පුද්ගලයාට කාලානුරූපව වෙනස්වන හෙයින් , ජනතා අපේක්ෂාවන් හා විගණකාධිපතිවරයාගේ කාර්ය සාධනය අතර නොවිසඳෙන පරතරයක් ( Public Expectation Gap ) නිරන්තරයෙන් පවතී. මෙම පරතරය පියවීම ප්‍රායෝගිකව අපහසු කාර්යයක් වන අතර එය අවම කිරීම සඳහා යම් යම් පියවර ගතහැකිය. ඒ සඳහා උත්තරීතර විගණන ආයතනය හා ජනතාව අතර පලදායි සන්නිවේදනයක් අඛන්ඩව පැවැත්විය යුතුවේ. රාජ්‍ය විගණන ක්‍රියාවලිය සඳහා ප්‍රජා දායකත්වය ලබාගැනීම සඳහා යම් ක්‍රියාවලියක් අනුගමනය කිරීම තුලින් රාජ්‍ය විගණනය කෙරෙහි පවතින ජනතා අපේක්ෂාවන්ගේ පරතරය අවම කිරීමට හැකියාවක් තිබෙන බව අවබොධ කරගත් බොහො උත්තරීතර විගණන ආයතන මෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ලෝක ව්‍යාප්ත ආයතන, ප්‍රජා සහභාගිත්ව විගණන ප්‍රවේශයන් කෙරෙහි වැඩි නැඹුරුතාවක් දැක්වීමට වර්තමානයේ පෙළඹී තිබේ.

ලෝක බැංකුවේ සහභාගිත්ව විගණනය පිළිබඳ විද්‍යුත් මාර්ගෝපදේශ අනුව, සහභාගිත්ව විගණනයක් යනු රාජ්‍ය කටයුතු අධීක්ෂණය සම්බන්ධයෙන් පුරවැසියන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය සඳහා සකස්කරනු ලබන ක්‍රමවේදයකි. එය, විගණන ක්‍රියාවලිය සඳහා පුරවැසියන්ගේ සහ ප්‍රජා සංවිධානවල සහභාගිත්වය සම්බන්ධයෙන් ඍජුව සම්බන්ධවීමේ වැඩපිළිවෙලකි. උදාහරණ වශයෙන් යම් සමාජ ආරක්ෂණ වැඩපිළිවෙලක් ගතහොත් ඊට අදාල දූර්වලතාවයන් හෝ වැඩි දියුණු කලයුතු ක්ෂේත්‍ර සම්බන්ධයේ වඩාත් අත්දැකීම් ඇත්තේ අදාල වැඩ පිළිවෙලෙහි ප්‍රතිලාභීන්ට වන බැවින් විගණනය සඳහා ඔවුන්ගේ සහභාගිත්වය වඩාත් වැදගත්වේ. සහභාගිත්ව විගණන ක්‍රමවේදය, මූල්‍ය විගණනයට හා අනුකූලතා විගණනයට වඩා පලදායි ලෙස කාර්ය සාධන විගණනය සඳහා යොදා ගත හැකිය.

2017 දී, උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය විසින් සහභාගිත්ව විගණන ක්‍රමවේදය පිළිබඳව මාර්ගොපදේශ හඳුන්වා දෙන ලදී. එමගින් විගණන ක්‍රියාවලිය සඳහා පුරවැසියන්, සිවිල් සමාජ සංවිධාන හා විශේෂිත සමාජ කණ්ඩායම් ඇතුලත්ව සමාජයේ උනන්දුවක් සහිත විවිධ සමාජ සංවිධාන සහභාගි කරගන්නා ආකාරය පිළිබඳව සාකච්ඡා කරන ලදී. පලදායී රාජ්‍ය විගණනයක් සඳහා විගණනයේ විවිධ පියවරයන්වලදී, විවිධ විගණන ක්‍රමවේද සඳහා අදාල සමාජ කණ්ඩායම් සහභාගි කරගත හැකි ආකාරය තීරණය කිරීම සඳහා ඉහත මාර්ගොපදේශයන් ඉතා වැදගත්වේ. ඒ අනුව, විගණනයේ සැලසුම් අදියර, ක්‍රියාත්මක කිරීමේ අදියර, විගණන වාර්තාව පිළියෙලකිරීමේ අදියර සහ විගණන නිර්දෙශයන් සම්බන්ධ පසු පරීක්ෂාකිරීමේ අදියර යන අවස්ථා හතරේදී සහභාගිත්ව විගණන ක්‍රමවේදයන් යොදාගැනීමට හැකිය.

වර්තමානයේදී, ලෝකයේ විවිධ උත්තරීතර විගණන ආයතන සිය විගණන කාර්යයන් සඳහා සහභාගිත්ව විගණන ක්‍රමවේදය යොදාගනු ලබයි. දකුණු කොරියානු විගණකාධිපති වරයා, විශ්ව විද්‍යාල මහාචාර්ය වරුන්ගෙන් සහ විවිධ පර්යේෂණ ආයතනවලට අනුබද්ධ විශේෂඥයින් ගෙන් සමන්විත උපදේශක කමිටු හරහා සහභාගිත්ව විගණන ක්‍රමවේදය ප්‍රවර්ධනයකිරීම සඳහා උපදෙස් ලබාගනු ලබන අතර මහජන නියෝජනයන් කාර්යක්ෂමව ලබාගැනීමේ ක්‍රමවේදයක් තුලින් රාජ්‍ය

ආයතනවල කාර්යක්ෂමතාවය හා කාර්යසාධනය අගයනු ලබයි. ඇමෙරිකා එක්සත් ජනපදය සිය සහභාගිත්ව විගණන ක්‍රමවේදය, ජාතික විද්‍යා ආයතනය හරහා ක්‍රියාත්මක කරනු ලබන අතර අසල්වැසි ඉන්දියාව සහ පිලිපීනය වැනි රටවල් සමාජ විගණන ආදර්ශකයන් වැඩිදියුණු කරමින් සිටිති. හොන්දුරාස් රාජ්‍යය, මහජන රැස්වීම් පැවැත්වීමේ ක්‍රමවේදයක් තුලින් මහජන අදහස් ලබාගන්නා අතර විගණන ප්‍රතිඵල ජනතාවට සන්නිවේදනය කරනු ලබයි.

ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලය ද සිය විගණන ක්‍රමවේදයන් තුල මහජන නියොජන හෝ ප්‍රකාශ ලබාගැනීම, ප්‍රධාන විගණන සාක්ෂියක් වශයෙන් සලකනු ලබයි. කෙසේ වෙතත්, කාර්ය සාධන විගණනයේදී, ප්‍රජා සහභාගිත්වය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලයට පුළුල් අවකාශයක් තවදුරටත් පවතී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 04 වැනි ජේදය අනුව විගණකාධිපති වරයාට මහජන පෙත්සම් හෝ නියෝජන මාර්ගයෙන් තොරතුරු ලබාගතහැකි අතර ඒ සම්බන්ධ වාර්තාවක් වාර්ෂිකව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුවේ.

සහභාගිත්ව විගණන ක්‍රමවේදයක් අනුගමනය කිරීමේදී ඒ සම්බන්ධ ආවේනික දුර්වලතා සහ අවදානම් ක්ෂේත්‍ර හඳුනාගැනීමද වැදගත් වේ. රාජ්‍ය විගණන ක්‍රමවේදය හා එහි අරමුණු පිළිබඳව ජනතාව තුල පවතින අනවබොධය හා වැරදි වටහාගැනීම් මේ හා සම්බන්ධ ප්‍රධාන දුර්වලතාවය වේ. මහජනතාව විසින් ලබාදෙන තොරතුරු සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය ඉක්මනින් විමර්ශණය කරනු ඇතැයි යන විශ්වාසය හා අදාල අඩුපාඩු ක්ෂණිකව නිවැරදි වනු ඇතැයි යන අපේක්ෂාවද මේ සම්බන්ධයෙන් පවතින ප්‍රධාන සීමාකාරී සාධකයක් වේ. මහජන තොරතුරු ලබාගැනීම හා විගණනයේ ප්‍රතිඵල ජනතාව වෙත ප්‍රබල ලෙස සන්නිවේදනය කිරීමේ පාරදෘශ්‍ය ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම තුලින් මෙම දුර්වලතා අවම කර ගැනීමට හැකිවනු ඇත.


Sources

Auditing Community Participation – An Assessment Handbook by Burns and Taylor (2002)

Citizen Engagement Practices of Supreme Audit Institutions – INTOSAI publication (2013)

E-guild on Participatory Audit- World Bank Group

INTOSAI-P12

INTOSAI Journals

# ශ්‍රී ලංකා ආර්ථික අර්බුදයේ හෙළිනොකළ යථාර්ථය

එච්.එම්.රණසිංහ බණ්ඩාර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

අද ශ්‍රී ලංකා ආර්ථිකයේ ඇතිව තිබෙන අර්බුදය අභ්‍යන්තර හා බාහිර ආර්ථික කටයුතුවල දිගුකාලයක් තිස්සේ මෝරමින් තිබූ ප්‍රශ්නයක පුපුරායාමකි. මූලික මිනිස් අවශ්‍යතාවයන් අවම වශයෙන් වත් සපුරාගත නොහැකි ජනගහනය වර්ධනය වෙමින් පවතී. විදේශ ණය ගෙවා ගත නොහැකිව ආර්ථිකය බංකොලොත් තත්ත්වයකට පත්වී ඇත.

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය නිර්මාණය වී ඇත්තේ රටට දරාගත නොහැකි ණය බරක් තිබීම හා එම ණය ගෙවා දැමීමට තරම් ජාතික නිෂ්පාදිතයේ සැබෑ වර්ධනයක් සිදු නොවීමයි. එය වසරක දෙකක කෙටි කාලයක් තුල සිදු වූවක් නොව ගතවූ වසර 20 කට අධික කාලයක් තුල රට පාලනය කල පාලකයන් සහ ඔවුන්ගේ වුවමනාවන් මත ආර්ථිකය මෙහෙයවූ නිලධාරීන් සිදුකල ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයකි. ඒ සඳහා මූලික පසුබිම නිර්මාණය වී ඇත්තේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස්කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත ආර්ථික දර්ශකයන්ගේ විකෘතිභාවයයි.

කිසියම් රටක ආර්ථිකය පිළිබඳ අවබෝධයක් ලබාගැනීම සඳහාත්, ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදීත් උපයෝගී කරගන්නා ප්‍රධාන විචල්‍යයන් දෙක ලෙස සලකන්නේ භාණ්ඩ හා සේවා නිමවුම හා ඒවායේ මිල ගණන් වේ. අන්තර්කාලීන වශයෙන් බලනවිට රටක ජාතික නිෂ්පාදිතය මෙම විචල්‍ය දෙකේම බලපෑම මත උස් පහත් වනු ඇත. ඒ අනුව ආර්ථිකයේ වර්ධනය මැනීම සඳහා ඒක පුද්ගල මූර්ත ආදායමත් මිල මට්ටම්වල අඩුවැඩි වීම මැනීම සඳහා උද්ධමන අනුපාතයත් යොදාගැනේ. රටක ආර්ථිකයේ යථාතත්ත්වය නිරූපණය කිරීම සඳහා ඉවහල් කරගන්නා උද්ධමන අනුපාතය සහ ඒක පුද්ගල මූර්ත ආදායම සියලුම ආර්ථික ක්‍රියාකාරකම්වල සමස්ථය නිරූපණය වන බැවින් ජාත්‍යන්තර වශයෙන් ද මෙම විචල්‍යයන් මත රටක ආර්ථිකයේ ඉදිරි පැවැත්ම පිළිබඳ තීරණ ගැනීම සිදුකරනු ලබයි.

ඒ අනුව වඩාත් නිවැරදිව හා තර්කානුකූල පදනමක් මත එම විචල්‍යයන් ගණනය කිරීම තුලින් රටක ආර්ථිකය පිළිබඳව නිවැරදි චිත්‍රයක් දේශීය හා විදේශීය ප්‍රජාවට ලබාගත හැකි වේ. එහෙත් ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු දා සිට ගතවූ වසර 74 ක කාලය තුල උද්ධමන අනුපාතය සහ ඒක පුද්ගල මූර්ත ආදායම ගණනය කිරීම් නිවැරදිව සිදුකර දේශීය හා ජාත්‍යන්තර ප්‍රජාව වෙත ඉදිරිපත් කර ඇත්ද යන්න සහ අදාළ දත්ත මත පිහිටා ගනු ලැබූ ආර්ථික තීරණ සහ ප්‍රතිපත්ති සම්පාදනයන් රටේ උන්නතිය සඳහා කොතෙක් දුරට ඉවහල් වූයේද යන්න පිළිබඳව මේ වනවිට දේශීය හා ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානයට යොමුවී ඇත.

උද්ධමන අනුපාතිකය සහ ඒකපුද්ගල මූර්ත ආදායම නිවැරදිව ගණනය නොකිරීම මත එම දර්ශක තුලින් ලබාගත් දත්ත මත ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණ මත ශ්‍රී ලංකාවේ ආර්ථිකය කඩා වැටී ඇති බව ජන හා සංඛ්‍යා ලේඛන දත්ත හා මහ බැංකු වාර්තා වල දත්ත සැසඳීමෙන් අනාවරනය වේ. ප්‍රධාන දර්ශක පිළිබඳ විස්තර පහත දැක්වේ.

1. උද්ධමන අනුපාතය

ශ්‍රී ලංකවේ ජීවන වියදම් දර්ශකයන් ලෙස භාවිත කරන කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගොඩනංවා ඇත්තේ යම් යම් කම්කරු කොටස්වල ජීවනාධාර දීමනා ආදිය සංශෝධනය කිරීමේදී යම්කිසි පදනමක් ලබාදීම සඳහා බව ඩබ්.ඩී.ලක්ෂ්මන් සහ එච්.එම්.ගුණසේකර (ආර්ථික විශ්ලේෂණය) යන විද්වතුන් දක්වා ඇත.

එසේම යොදාගනු ලබන දර්ශකය සමාජයේ විශේෂ පිරිසකගේ ජීවන වියදමේ වෙනස්වීම් පෙන්නුම් කරලීම් සඳහා සකස් වී ඇත්නම් එයට ඇතුලත් වන භාණ්ඩ හා යොදා ගැනෙන බර තැබීමේ ක්‍රමය, එම තෝරාගත් ජන කොටසේ ජීවන රටාවන්ට අනුකූල වෙයි. එහෙත් මෙම ජීවන රටාව පොදුවේ රට වැසියාගේ ජීවන රටාවන්ට වඩා විශාල වශයෙන් වෙනස්වන්නේ නම් තක්සේරු කෙරෙන දර්ශකයෙන් සමස්ථයක් ලෙස මුළු ජනතාවගේ ජීවන වියදම හෝ භාණ්ඩ හෝ සේවාවල සාමාන්‍ය මිල මට්ටම හෝ වෙනස් වන අයුරු හරියාකාරව නොදැක්වෙන්නට පුළුවන් බව ද දක්වා ඇත.

එහෙත් කොළඹ පාරිභෝගික මිල දර්ශකය සකස්කර ඇත්තේ කොළඹ නගර සහා බල ප්‍රදේශයේ කම්කරු පවුල් 455 ක නියැදියක් පදනම් කරගෙන වේ. ඒ අනුව ඔවුන්ගේ ගෘහ ආර්ථික කටයුතු ඇසුරෙන් භාණ්ඩ පැස තෝරාගෙන තිබුණි.

ජීවන වියදම් දර්ශකයක් ලෙස 1952 වසරේ සිට 2007 වසර වන තෙක් කොළඹ

පාරිභෝගික මිල දර්ශකය අනුව උද්ධමන අනුපාතිකය ගණනය කර තිබුණි. 2007 වසරේදී 2002 පදනම් වර්ෂය ලෙස සලකා එය වැඩිදියුණු කර තිබුණි. පසුව 2011 වසරේදී 2006/07 පදනම් වසර ලෙස සලකා සංශෝධනය කර තිබුණු අතර අවසන් වරට සංශෝධනය කර ඇත්තේ 2017 වර්ෂයේ 2013 පදනම් වසර ලෙස සලකමිනි. එහෙත් අදාල යාවත්කාලීන කිරීම් වලදී පදනම් වසර පමණක් සංශෝධනය කර තිබුණු අතර මූලික භාණ්ඩ පැස එලෙසම තබාගෙන නව කාණ්ඩයන් ඇතුලත් කර අදාල යාවත්කාලීන කිරීම් සිදුකර තිබුණි.

ජාත්‍යන්තර ප්‍රමිත අනුවද කාණ්ඩ 12ක් යටතේ භාණ්ඩ පැස සමන්විත විය යුතුවේ. මධ්‍යසාර පාන, මත්පැන් හා මත්ද්‍රව්‍ය කාණ්ඩය 2017 වසර වනතුරුම (2013 පදනම් වසර) භණ්ඩ පැසට ඇතුලත් කර නොතිබුණි.

මේ සම්බන්ධයෙන් ජන සංඛ්‍යාලේඛණ අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණකාධිපති වෙත පනත පරිදි අදහස් දක්වා තිබුණි.

මිල දර්ශකය ඇතැම් ආයතන විසින් ජීවන වියදම් දීමනාවක් ගෙවීම සඳහා ප්‍රොක්සි දර්ශකයක් ලෙසද යොදාගන්නා බැවින් "මධ්‍යසාර පාන, මත්පැන් සහ මත්ද්‍රව්‍ය "කාණ්ඩය මිල දර්ශකය පිළියෙළ කිරීමට ඇතුලත් කළහොත් එම අයිතමයන්ගේ මිල ඉහල යාම නිසා සේවකයින් වෙත කෙරෙන ජීවන වියදම් දීමනාව ද ඉහල යාම සිදුවේ. එමගින් මධ්‍යසාර පාන, මත්පැන් සහ මත්ද්‍රව්‍ය පාවිච්චිය දිරිමත් වීමේ ප්‍රවනතාවයක් ඇතිවිය හැකි බැවින් එය ඉවත් කිරීම සුදුසු බවට මත පළ වී ඇත. තව ද 2007 වසරේ මෙය එලි දැක්වෙන විට රටේ පැවති "මතට තිත" වැඩසටහන යටතේ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක වී තිබීම නිසා "මධ්‍යසාර පාන, මත්පැන් සහ මත්ද්‍රව්‍ය" යන කාණ්ඩය මෙයට ඇතුලත් කිරීම නුසුදුසු බව මත පලවීම ද මෙය ඉවත් කිරීමට හේතු වී ඇත. එහෙත් ආපනශාලා සහ හෝටල් යන කොටස ආහාර කාණ්ඩය යටතට ඇතුලත් කර ඇත. කෙසේ වෙතත්, 2013 දී පාද වර්ෂය යාවත්කාලීන කිරීම සමඟ වියදම් කාණ්ඩ 12 ක් යටතේ මිල දර්ශක ඉදිරිපත් කර ඇත.

ඉහත කරුණුවලින් පෙනීයන මූලිකම කාරණය වන්නේ නිවැරදි උද්ධමන අනුපාතයන් ගණනය කිරීම සඳහා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරිත්වය කටයුතු කර නොමැති බවයි. උද්ධමන අනුපාතය නිවැරදි ගණනය නොකිරීම පිළිබඳව විගණන විමසුමකට පිළිතුරු ලෙස පහත ප්‍රකාශයද අවධාරනය කර තිබුණි.

ජාත්‍යන්තර වර්ගීකරනයන් සියළුම රටවලට පොදුවේ පිළියෙල කළද තම රටට අනුව දේශීයකරණය (Localize) කළ හැකිය.

අපගේ රට අනුව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් දේශීයකරනය කර Sri Lanka standard Industry classification (SLSIC-Rev 4) පෙන්වාදිය හැකි අතර අප රට භාවිතාවන්නේ එයයි.

එහෙත් අපේ රටට ගැලපෙන සේ භාණ්ඩ පැසක් තෝරාගෙන වසර 5ට වරක් අදාල දර්ශක යාවත්කාලීන කිරීමක් සිදුකර නොතිබුණි.

උදාහරණයක් ලෙස කොළඹ පාරිභෝගික මිල දර්ශකය සඳහා යොදාගත් කම්කරු පවුල් හෝ නාගරික කුටුම්භයන් කුලී නිවාස වල ජීවත්වීම පදනම් කරගෙන නිවාස කුලිය භාණ්ඩ පැසට තෝරාගෙන ඇත. එහෙත් ශ්‍රී ලාංකික ජනතාවගේත් අති මහත් බහුතරය ඔවුන්ගේ ආර්ථික හැකියාව මත පාරම්පරිකව හිමිවූ ඉඩමක හෝ බිම් කොටසක් මිලදී ගෙන හෝ නිවසක් ඉදිකර ජීවත්වේ. සිය ආදායමෙන් විශාල වියදම් ප්‍රතිශතයක් මේ සඳහා මිඩංගු කරනු ලබයි. එහෙත් පාරිභෝගික මිල දර්ශකය සකස් කිරීමේදී ඉඩම් මිලදී ගැනීමට හෝ ඉදිකිරීම් කටයුතු සඳහා දායකවන සිමෙන්ති, ගඩොල්, සෙවිලි තහඩු ලී වැනි ඉදිකිරීම් කටයුතු සඳහා දරන වියදම් පාරිභෝගික මිල දර්ශකය තුල ඇතුලත්ව නොමැත. එහෙත් එම වියදම් රටේ පොදු මිල මට්ටම කෙරෙහි ඍජු බලපෑමක් සිදුවේ.

නිවසේ පදිංචි හිමිකරුවන්ට අයත් හා කුලියට පදිංචි නිවාසවල ප්‍රතිශතය
පදිංචි අංශය අනුව, 1981 හා 2012

| අංශය | නිවසේ පදිංචි හිමිකරුවන්ට අයිති | | කුලියට පදිංචි | |
|---|---|---|---|---|
| | 1981 | 2012 | 1981 | 2012 |

| | | | | |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 69.5 | 82.9 | 10.2 | 6.3 |
| නාගරික | 58.0 | 75.0 | 29.1 | 14.8 |
| ග්‍රාමීය | 79.5 | 88.0 | 6.5 | 4.5 |
| වතු | 1.3 | 22.2 | 1.3 | 5.3 |
| | | | | |

ඉහත සංගණන වාර්තා අනුව ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 10% කට ආසන්න ප්‍රමාණයක් පමණක් කුලී නිවාසවල ජීවත්වන බව ප්‍රකාශවේ. එහෙත් උද්ධමන අනුපාතයන් ගණනය කරන කොළඹ පාරිභෝගික මිල දර්ශකය සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය සඳහා භාණ්ඩ පැසට නිවාස කුලිය යොදාගැනීමත් ඒ සඳහා බරතැබීම් ලෙස 11.5% සිදුකිරීමක් තුලින් ගණනය කරනු ලබන උද්ධමන අනුපාතයන්, රටේ සැබෑ උද්ධමනය නිරූපනය නොවන බවට ප්‍රබල සාක්ෂියක් බවත් පෙන්වා දිය හැකිය.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය මගින් රටේ සමස්ථය නිරූපනය නොවන බවත් ජාතික පාරිභෝගික මිල දර්ශකය මගින් රටේ සමස්ථය නිරූපනය කරන බවත් දක්වා ඇත. ඒ අනුව ජාතික පාරිභෝගික මිල දර්ශකය ප්‍රකාශයට පත්කල 2017 වසර දක්වාම උද්ධමන අනුපාතිකයන් නිවැරදි නොවන බවට ව්‍යංගයෙන් ප්‍රකාශකර ඇති බවත් පෙනේ.

නිල මිල දර්ශකය ලෙස භාවිතයට ගන්නා ලද ජාතික පාරිභෝගික මිල දර්ශකය සඳහා පාදක කරගක් ජන සමීක්ෂණයන් හා කොළඹ පාරිභෝගික මිල දර්ශකය සඳහා සිදුකල ජන සමීක්ෂණ 2013 වසරේදී සිදුකර ඇත. එහිදී මාසික කුටුම්භ වියදම ජාතික පාරිභෝගික මිල දර්ශකය අනුව රු. 32147 ක් වන අතර කොළඹ පාරිභෝගික මිල දර්ශකය සඳහා එය රු. 60363ක් බව දක්වා ඇත. ඒ අනුව කොළඹ පාරිභෝගික මිල දර්ශකය හා ජාතික පාරිභෝගික මිල දර්ශකය අතර වියදම පරතරය 28220

------ X 100 =87.79% ක් වේ. මේ තුලින් තහවුරු

වන්නේ 32143

2017 වසර දක්වා ඒ ඒ වර්ෂවල ප්‍රකාශිත උද්ධමන අනුපාතිකයන් නිවැරදි නොවන බවයි.

එසේම ජාතික පාරිභෝගික මිල දර්ශකය සඳහා යොදාගත් මාසික කුටුම්භ වියදම (2013 පාද වර්ෂය අනුව) වර්තමානය වන විට ඉතා ඉහළ අගයකින් වැඩි වී ඇත. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් මාධ්‍ය වෙත ප්‍රකාශ කරන ආකාරයට මෙරට එක් පුද්ගලයෙකුට සිය මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා මසකට අවශ්‍ය අවම වියදම රු. 13460 ක් වන අතර සිවුදෙනෙකු ගෙන් යුත් පවුලකට සිය මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මසකට අවශ්‍ය අවම වියදම රු. 53840 ක් වේ. (2022 ඔක්තෝබර් 19 බදාදා මව්බිම)

සාමාන්‍ය පවුලක අවම වියදම එසේ වන්නේ නම් උද්ධමනය සඳහා ගැනෙන ආහාර හා ආහාර නොවන කාණ්ඩය සඳහා 2013 වසරේ මාසික වියදම වූ රු. 32143 ක් ලෙස යොදාගෙන උද්ධමන අනුපාතය ගණනය කරන ජාතික පාරිභෝගික මිල දර්ශකය කෙරෙහි විශ්වාසයක් තැබිය නොහැකි වේ.

ආර්ථික විද්‍යාවේ න්‍යායාත්මක සාධක අනුවද පසුගිය දශක ගණනාවක සිට ප්‍රකාශිත උද්ධමන අනුපාතිකය සැබෑ උද්ධමනයට වඩා බෙහෙවින් අඩු අගයක් ගන්නා බව සංඛ්‍යා දත්ත ඇසුරෙන් විග්‍රහ කල හැකිය.

ප්‍රමාණාත්මක න්‍යායට (Quantitive Theory) අනුව මුදල් සැපයුම සහ ඉල්ලුම නිසා මුදලේ වටිනාකම තීරනය වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස උද්ධමන ඇතිවේ. එසේම මුදල් මුද්‍රණය කිරීමද උද්ධමනය සඳහා සෘජු බලපෑමක් සිදුවේ. ඒ අනුව මුදල් සැපයුම වැඩිවීම මත උද්ධමන අනුපාතිකයද ඊට සමගාමීව වැඩිවිය යුතුවේ.

එසේ ම විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම මත ආනයනික අමුද්‍රව්‍ය සහ නිමිභාණ්ඩවල මිල ඉහලයාම මත උද්ධමනකාරී තත්ත්වයක් ඇතිවේ. පසුගිය දශක දෙකකටත් අධික කාලයක සිට ජංගම ගිණුමේ දක්නට ඇත්තේ සෘණ ශේෂයකි. ඛනිජතෙල් මිල ඉහළයාමද සියළුම භාණ්ඩවල මිල ගනන් ඉහළයාමට හේතුවේ.

මුදල් සැපයුම, විනිමය අනුපාතිකය සහ උද්ධමන අනුපාතිකයන්ගේ පසුගිය දශක 05 ක කාලය තුල හැසිරීම පහත වගුවේ දක්වා ඇත. (ජන හා සංඛ්‍යාලේඛන සකස්කල දත්ත පදනම්කරගෙන ඇත).

1971 සිට 2021 දක්වා වසර 51 ක කාලය තුල උද්ධමන අනුපාතිකය, මුදල් සැපයුමේ වර්ධනය සහ විනිමය අනුපාතය අවප්‍රමාණය වීම

| කාලය | උද්ධමනය | මුදල්සැපයුම | විනිමය අනුපාතිකය (ආ.ඩොලර්) | |
|---|---|---|---|---|
| 1971 – 1980 | 124.3 | 478.2 | 5.93 – 16.53 | 3263% |
| 1981 – 1990 | 168.7 | 270.4 | 19.25 – 40.06 | |
| 1991 – 2000 | 124.5 | 266.0 | 41.37 – 77.01 | |
| 2001 – 2010 | 136.3 | 302.2 | 89.38 – 113.06 | |
| 2011 – 2021 | 64.9 | 339.6 | 110.57 – 198.88. | |
| | --------- | -------- | | |
| වැඩිවීමේ ප්‍රතිශතය | 618.7 | 1656.4 | 3263 | |
| | ===== | ===== | ==== | |

ඉහත සංඛ්‍යා දත්ත අනුව ගතවූ වසර 51 ක් කාලය තුල ප්‍රකාශිත උද්ධමන අනුපාතිකය 618.7% කින් ඉහළයනවිට මුදල් සැපයුම 1656% කින්ද විනිමය අනුපාතිකය 3263% න් අවප්‍රමාණය වී ඇත..

ඉහත කරුණු අනුව ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත උද්ධමන අනුපාතිකය සැබෑ උද්ධමන අනුපාතිකයට වඩා බෙහෙවින් අඩු අගයක් ගෙන ඇති බව තහවුරු වේ. මෙහි අභාග්‍යසම්පන්න කරුණ වන්නේ ශ්‍රී ලංකාවට ණය සැපයීමේදී මෙම දර්ශකය කෙරෙහි ජාත්‍යන්තර ප්‍රජාව තැබූ විශ්වාසය මත අධික පොලියට කෙටිකාලීන ණය ලබාදීම කෙරෙහි සිදුවූ බලපෑමයි.

**ඒක පුද්ගල මූර්ත ආදායම**

කිසියම් රටක ආර්ථිකය මනින මූලික නිර්නායකය වන්නේ ඒක පුද්ගල මූර්ත ආදායමයි. එය රටක සමස්ථ ජාතික නිෂ්පාදිතයේ මූල්‍ය වටිනාකමින් උද්ධමනීය බලපෑම ඉවත්කර සකස් කරනු ලබයි. ඒ අනුව ජාතික නිෂ්පාදිතය එම රටේ මුළු ජනගහනයෙන් (මධ්‍ය වාර්ෂික ජනගහනය) බෙදීමෙන් එක් පුද්ගලයෙකුගේ මූර්ත ජාතික ආදායම ගනනය කරනු ලබයි.

එහෙත් මෙය ගනනය කරනු ලබන ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවට අදාල නිවැරදි ආර්ථික දත්ත ලබාගැනීමේ ක්‍රමවේදයක් සකස්කර නොතිබුණු අතර හා නිවැරදි ආර්ථික දර්ශක සකස් කිරීමේ අවශ්‍යතාවයක්ව නොතිබූ බව ද නිරීක්ෂණය විය. එසේම සකස් කරන දර්ශක අතරද පරස්පරතා අනාවරනය වේ.

ශ්‍රී ලංකාව විවිධ සංවර්ධන ව්‍යාපෘති හා වෙනත් කටයුතු සඳහා ගනු ලබන ණය රජයේ ආදායම් ලෙසත් එම  උපයෝජනය කිරීමේදී නිෂ්පාදන හා වියදම් ලෙසත් සලකා බැලීම හේතුවෙන් ඒක පුද්ගල මූර්ත ආදායම ක්‍රමානකූලව වර්ධනය සිදුවී ඇත. එහෙත් රටේ අපනයන ආදායම් හෝ නිෂ්පාදනයේ වර්ධනය ප්‍රකාශිත ඒක පුද්ගල ආදායමට වඩා අඩු අගයක් ගෙන ඇත. එසේම ගනු ලබන ණය සමස්ථ ජනතාවගේ ආර්ථිකය වර්ධනය සඳහා ඉවහල් වී ඇත්තේ ඉතාමත් අවම ප්‍රමාණයකිනි.

80 ගනන්වලදී විදේශ ණය වැඩිවී ඇත්තේ කඩිනම් මහවැලි ව්‍යාපාරයට විශාල වශයෙන් විදේශ ණය හා ආධාර ලබාගැනීමය. මෙම ව්‍යාපෘතියට ලබාගෙන ඇති ණය ඉතා සහනදායී කොන්දේසි යටතේ ඉතා අඩු පොලියකට ලබාගෙන තිබුණි. එසේම ණය ලබාදුන් බොහෝ රටවල් ප්‍රදානයන් ද සිදුකර තිබුණි.

මහවැලි ව්‍යාපාරයට එකලගත් ණය හේතුවෙන් විදේශ විනිමය පැත්තෙන් ලැබූ ප්‍රතිලාභයන් කොටස් දෙකක් යටතේ විග්‍රහ කල හැකිය.

1. රටේ කෘෂිකර්මය දියුණුව හේතුවෙන් ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමට හේතුවක් විය. විදේශ රටවලින් සහල් ඇතුළු ආහාර ද්‍රව්‍ය සඳහා වැයකල විදේශ විනිමය ඉතිරි කර ගැනීමට මෙය ප්‍රබල පිටුවහලක් විය.

2. ජල විදුලිබල උත්පාදනය නිසා සිදුවූ ඉතිරිය

වැසිකාලයට මුළු විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා බොහෝ විට ජල විදුලිය යොදාගනී එය මුළු ධාරිතාවයෙන් 60% කට ආසන්න අගයක් ගනී. එසේ නොවන්නට විදුලිබලය නිපදවීම ගල්අඟුරු සහ ඛනිජතෙල් යොදාගන්නේ නම් වත්මන් අර්බුදය මීට දශක දෙකකටවත් පෙර ඇතිවන්නට ඉඩතිබුණි.

මධ්‍යම ආදායමක් ලබන රටක් බවට ප්‍රකාශ කිරීමට පෙර ලබාගත් ණය උපයෝජනයෙන් ඇතැම් ව්‍යාපෘතිවලින් ඉහළ ප්‍රතිලාභයක් ලැබී තිබුණ ද සමස්ථයක් ලෙස කෘෂිකර්මය සහ වාරිමාර්ග කටයුතු සඳහා ලබාදුන් විදේශ ණය හා ආධාර තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි. දුර්වල කළමනාකාරිත්වය මේ සඳහා හේතුවී තිබුණ අතර ජාත්‍යන්තරය විසින් ලංකාව අසාර්ථක රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබුණි.

කිසියම් පුද්ගලයෙක් සිය අවශ්‍යතාවයක් ඉටුකර ගැනීම සඳහා තවත් පුද්ගලයෙකුගෙන් හෝ බැංකුවකින් ණයක් ලබාගතහොත් නියමිත කාලය අවසානයේ පොළියක් ද සමඟ ගෙවිය යුතුවේ. එසේ ණය ලබාගෙන ඇත්තේ සිය පරිභෝජනය සඳහා නම් ලබාගත් ණය සහ පොළිය ගෙවීමට නොහැකිවේ. එසේ වූ විට එම ණය පියවීමට ද තවත් ණයක් ගැනීමට සිදුවේ. එහෙත් ණය දෙන ආයතනය හෝ පුද්ගලයා ණය ගන්නාගේ ගෙවීම් හැකියාව ද අධ්‍යනය කිරීමෙන් පසු ණය ලබාදෙන බැවින් ණය ලබාගන්නාට තම ආර්ථික හැකියාවක් නොමැති වූ විට ව්‍යාජ තොරතුරු ලබාදීමට පෙළඹේ.

මෙම සරල තත්වය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ද ආදේශ කළ හැකිවේ. 1977 විවෘත ආර්ථිකය හඳුන්වා දීමෙන් පසු විදේශ ණය හා ආධාර ලබාගැනීම කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්නට ලැබුනි. ඒ අනුව ප්‍රකාශිත ඒක පුද්ගල ආදායම ක්‍රමානුකූල වර්ධනයක් පෙන්නුම් කරන ලදි. 1977 දී ඇ.ඩොලර් 288 ක් වූ ඒක පුද්ගල ආදායම 2000 වර්ෂය වනවිට ඇ.ඩොලර් 870 දක්වා වර්ධනය විය. එය 202.08%න් සහ තුන්ගුණයක් දක්වා වර්ධනය වී තිබුණි. 2001 වසර වනවිට රජයේ පුනරාවර්තන වියදම පියවා ගැනීමටවත් රජයේ ආදායම සමත් නොවුනු අතර එම වසරේදී ආර්ථික වර්ධනය සෘණ 4.24 වී තිබුණි.

හිටපු මහබැංකු අධිපතිවරයෙක් වන අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් රචිත ශ්‍රී ලාංකික පුනර්ජීවනයක් උදෙසා ----------(2003) ග්‍රන්ථයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව පහත ප්‍රකාශය කර තිබුණි.

අපේ ආර්ථිකයට තල්ලුවක් දී ප්‍රාණවත් කලයුතු යැයි බොහෝ දෙනා පවසනු අපි අසා ඇත්තෙමු. කළයුත්තේ එය නම් ආර්ථිකයට තල්ලුවක් දිය හැක්කේ කෙසේද? ශ්‍රී ලංකාවට හදිසි ආර්ථික දියුණුවක් අවශ්‍ය බව අපි සියලු දෙනාම දනිමු. අපට ඇත්තේ වැදගත් ප්‍රධාන අවයව රැසක් ම ඉතා නරක ලෙස හානියට පත්වූ විවිධ රෝගා බාධාවලින් පෙළෙමින් ශල්‍යාගාරයේ මේසය මත වැතිරී හුස්ම පොදක් ගැනීමට වෙර දරන රෝගියෙකි. ඒ සමඟම අපට ඇත්තේ අවශ්‍ය ශල්‍ය උපකරණ ඉතා අබලන් තත්ත්වයේ පැවතීම නිසාත් අවශ්‍ය ඖෂධ හිඟය නිසාත් දැඩි සේ අසරණ වූ ශල්‍ය වෛද්‍යවරයකු ය. මේ ප්‍රශ්න එසේ තිබුණත් රෝගියා ජීවත් කරවීම සඳහා ප්‍රමාණවත් ඔක්සිජන් සැපයුමක් ලබා දීමට වෛද්‍යවරයාට හා ඔහුගේ කාර්ය මණ්ඩලයට සිදු වී තිබේ. ඒ සමඟ ම ලේ ගැලීම් නැවතීමටත් ඉතා දරුණු ලෙස හානිවූ අවයව යථා තත්ත්වයට පත් කිරීමටත් කටයුතු කිරීමට ද ඔහුට සිදුවී තිබේ. මනාව සැලසුම් කරන ලද පශ්චාත් ශෛල්‍ය කර්ම සැත්කමක් කළ හැකි වන්නේ රෝගියා යථා තත්ත්වයට පමුණුවා කැඩුණු ඇට හා තුවාල සුවපත් කිරීමෙන් පසුව බව අපි මතක තබා යුත්තෙමු. සුවය ලබමින් සිටින රෝගියා ඉදිරියේ ඇති දුෂ්කර තත්ත්වයට මානසිකව හා ශාරීරිකව සූදානම් කළ හැකි වන්නේ එවිටය. රෝගියාගෙන් හානි වූ මහපට ඇඟිල්ල මැසීමෙන් හෝ වැලමිටේ තුවාලයට ප්‍රතිජීවක ඖෂධ ආලේප කිරීමෙන් හෝ පමණක් මේ මූලික ප්‍රයත්නය සාර්ථකව දැරිය නොහැකිය.

ඒ ආකාරයෙන් ම, පසුගිය වසරේදී සෘණ දළ දේශීය නිෂ්පාදිතයක් සහිත අපේ ගිලන් ආර්ථිකයට වහාම ජීවය ලබා දීමට රජයට සිදු වී තිබේ. එසේ කරන අතරම, දේශීය මෙන් ම විදේශීය ආයෝජනයක් අතර අපේ ආර්ථිකය පිළිබඳව කල් පවත්නා උනන්දුවක් ඇති කිරීම සඳහා විශ්වාසය ගොඩ ගැනීමේ ක්‍රියාමාර්ග කිහිපයක් ගැනීමට ද රජයට සිදු වී තිබේ. ඉන් පසුව, පුහුණුකරු සහ කායික චිකිත්සකයා අලුතින් සුව වූ ක්‍රීඩකයන් මැරතන් තරඟය සඳහා සූදානම් කරන්නාක් මෙන් රටට නව කර්මාන්ත හඳුන්වා දීමටත්, නවෝත්පාදක සංවර්ධන උපාය මාර්ග ආරම්භ කිරීමටත්, ඒ ප්‍රයත්නයන් කාලයක් පවත්වාගෙන යාමටත් රජයට සිදුවේ

2003 වසර වනවිට ආර්ථිකය ඉතාමත් දුර්වල තත්වයක පැවති බවට වන කදිම නිදසුනක් ලේඛකයා විසින් දක්වා තිබුණි. එවන් ආර්ථික පසුබිමක් තිබූ ශ්‍රී ලංකාව 2004 වසරේදී මධ්‍යම ආදායම් ලබන රටක් බවට පරිවර්තනය විය. එය සිදුවූයේ සැබෑ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් නිසා නොව ජාතික

ආදායම් ගනනය කිරීමේදී රජය ලබාගනු ලබන ණයද ජාතික ආදායමට ඇතුලත් වීම නිසා වේ. ඒ වනවිට ලබාගත් ණය ගෙවාදැමීමටද ණය ලබා ගැනීමට සිදුව තිබූ පසුබිමක් නිර්මාණය වී තිබුණි.

ඒ වනවිට පවුල් 21 ලක්ෂයක් (සමහර විට පුද්ගලයන් 90 ලක්ෂයක් නැතහොත් දළ වශයෙන් අඩක්) සමෘද්ධි ප්‍රතිලාභ ලබන අතර පසුගිය වසර 6 තුල ඒ සංඛ්‍යාව ඉහළ නගිමින් තිබේ. යනුවෙන් පෙර සඳහන් කළ ග්‍රන්ථයේ සඳහන් කර තිබුණි.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස පැවති සමයේ ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ වෙනත් රටවලින් විශේෂ සහන ලංකාවට ලැබී තිබුණි. ණය ලබා දුන්නේද පහසු ක්‍රමවේද යටතේය. අඩු පොළියකට ආපසු ගෙවීමට දිගු කාලයක් ලබාදී තිබුණි.

එහෙත් ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පත්වීමත් සමඟ සහන ණය සියල්ල අහිමි වී ගියේය. ආර්ථික අර්බුදයකට අඩිතාලම වැටෙන්නේ එතැන් පටන්ය. නව කාර්මික රටක් බවට පත්වීමට පෙර සහනදායී වටපිටාවක් යටතේ අපගේ නිෂ්පාදන ඇමරිකාව ඇතුලු රටවලට අපනයනය කිරීමට අවස්ථාව සැලසුණි. එහෙත් මධ්‍යම ආදායමක් ලබන රටක් බවට පත්වීමත් සමඟ GSP බදු සහනය නොලැබීමේ තත්ත්වයක් නිර්මාණය විය. මෙරට තිබූ ඇඟලුම් කම්හල් බංගලාදේශය, කාම්බෝජය, වියට්නාමය වැනි රටවලට ගෙන ගියේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. මේවායින් සිදුවූයේ රටට ඩොලර් ලැබෙන මාර්ග අවහිර වීමය. එසේම සහනදායී කොන්දේසි යටතේ ලබාදුන් ණය වෙනුවට කෙටිකාලීන හා ස්වෛරී බැඳුම්කර වැනි වැඩිපොළියට ණය ගැනීමට සිදුවිය.

ශ්‍රී ලංකාව ලබාගත් වානිජ ණය ජාතික නිෂ්පාදනය වැඩිකිරීම සඳහා උපයෝජනය නොවීම හා අපනයන ප්‍රවර්ධනය සඳහා යොදානොගැනීම හේතුවෙන් සමස්ථ ජනතාවගේ ආදායම් වර්ධනයට ඉවහල් වී නොතිබුණි.

රටේ සංවර්ධනයට යැයි කියමින් ඇතිකළ බොහෝ ව්‍යාපෘති අද රටට බරක්වී තිබේ. ඊට හොඳම නිදසුන් වශයෙන් මත්තල ගුවන් තොටුපල, සූරියවැව ක්‍රීඩාංගනය, නෙළුම් කුළුන, හම්බන්තොට සම්මන්ත්‍රණ ශාලාව සහ අධිවේගී මාර්ග පෙන්වා දිය හැකිය. මේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඩොලර් මිලියන ගනනින් විදේශයන්ගෙන් ණයට ගෙන තිබේ. එම ණය මුදල් උපයෝජනය ජාතික ආදායමට ඇතුළත්වීම තුළ සිදුවන ඒක පුද්ගල මූර්ත ආදායම් වර්ධනය සැබෑ ආර්ථික වර්ධනයක් ලෙස හුවාදැක්වීම පදනම් විරහිතය.

වත්මන් ආර්ථික අර්බුදය පිළිබඳව වත්මන් මහබැංකු අධිපතිවරයා (වී.නන්දලාල් වීරසිංහ) පහත පරිදි මාධ්‍ය වෙත අදහස් දක්වා ඇත.

පසුගිය කාලයේ වානිජ ණය ගෙන වියදම් කළේ කුමකටද? මේ කාලයේ විශාල අයවැය හිඟයක් තිබුණි. එසේ තිබියදී වැඩියෙන් වියදම් කර තිබෙන්නේ රජයේ සේවකයන් බඳවා ගැනීමටය. පඩිනඩි ගෙවීමටය. විශ්‍රාම වැටුප් ගෙවීමටය. පොහොර ඇතුළු විවිධ සහනාධාර දීමටය. අඩු මිලට පෙට්‍රල් දී පාඩුවන රාජ්‍ය ආයතනවලට මුදල් දීමටය. වාණිජ මට්ටමින් විදේශ ණය ගෙන මෙවැනි කටයුතුවලට වියදම් කළ විට ඒවායෙන් නැවත විදේශ විනිමය ඉපැයීම් මාර්ග විවෘත වන්නේ නැත. අද තිබෙන අර්බුදයේ මූලික කාරණය එයයි.

මේ මොඩලය පවත්වාගෙන ගොස් තිබෙන්නේ ණය ගනිමින් එම ණය ගෙවීමට තවත් ණය ගනිමිනි. ලබාගන්නා ණයකින් ආදායම් වැඩි නොවන නිසා එම ණය ගෙවීමට තවත් ණයක් ගෙන තිබේ. එහෙත් රටක් වශයෙන් ආර්ථික වර්ධන වේගය වැඩි වූ නිසාත් උද්ධමනය පාලනය කරගෙන සිටි නිසාත් අපට ණය දීමට විදෙස් රටවල් පසුබට වූයේ නැත. වෙළඳපොළට පිවිසීමේ අවකාශය තිබුණි. විදේශිකයන් ණය දෙන තරමට අපි ණය ගත්තෙමු. මේ ක්‍රමවේදය දිගට පවත්වා ගෙන ගියේ ඒ ආකාරයෙනි. එහෙත් යම් ස්ථානයකදී ඔවුන් ණයදීම නැවැත් වූ විට රට බංකොළොත්ය. ලබාගත් ණය ගෙවීමේ හැකියාවක් ද නැත. මේ නිසා රජයත් රටත් දෙකම බංකොළොත්ය. 2020 දක්වාම මේ ක්‍රමය පවත්වාගෙන ඇත්තේ ණය ලබාගෙන සංචිත තරකර එම සංචිත යොදාගෙන ඊළඟ වසරේ ණය ගෙවීමෙනි. ණය ගන්නා තාක් මේ චක්‍රය පවත්වා ගන්නට පුළුවන.

2021 දී ණය ගැනීමේ වෙළඳපොළ ප්‍රවේශය අපට අහිමිව ගියේය. එහෙත් ණය බර එලෙසමය. ණය බර එළෙසම තිබිය දී ණය නොගෙවන විට වැටෙන්නේ බංකොළොත් කාණ්ඩයටය.

ඉහත ආර්ථික විග්‍රහයට අනුව රටට වානිජ ණය ලබාගැනීමට ඉවහල් වී ඇති ප්‍රධානතම සාධකය වී ඇත්තේ ආර්ථික වර්ධනය (ඒක පුද්ගල මූර්ත ආදායමේ වැඩිවීම) සහ උද්ධමන අනුපාතිකය පාලනය කිරීම බව දක්වා ඇත. ඒ අනුව මෙම ආර්ථික දර්ශක, ණය ලබාගැනීම සඳහා ගැලපෙන අයුරින් සකස් කළාද (කෘතිම ලෙස) නොඑසේ නම් මෙම දර්ශක මත දේශීය හා විදේශීය වශයෙන් වන බලපෑම ගැන අවධානය යොමුනොකර නොසැලකිල්ලෙන් සකස් කර ඇත් ද යන්න ද මතභේදයට තුඩුදෙන කාරණයක් වේ.

ජන හා සංඛ්‍යා ලේඛන දත්ත අනුව 2021 වසර වන විට ඒක පුද්ගල මූර්ත ආදායම ඇ.ඩොලර් 3815 ක් වන අතර කුටුම්භයක මාසික ආදායම 3815x198.88=758727.2/12=රු.63227.266

x3.9=246586.31 වේ.

2022 වසර වනවිට ආර්ථිකය 9% කට ආසන්න ප්‍රමාණයකින් සෘණ වන බව උපකල්පනය කර ඇත.ඒ අනුව 3815 x $\frac{91}{100}$ = 3471.65 ක් වේ.

මාසික කුටුම්භ ආදායම 3471.65 x 360 = රු.1249794 /12 = රු. 104149.5 x 3.9 = රු.406183.05 ක් වේ.

ඉහත දත්ත නිවැරදි නම් වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ එක් පවුලක මාසික ආදායම රු. 400,000/= ඉක්මවා ඇත. එවන් ආදායමක් සමස්ථ ජනතාව වෙත ලැබෙන්නේ නම් රටේ ආර්ථික අර්බුදයක් තිබිය නොහැක. එයට හේතුව වැඩි ආදායම් ලබන්නන්ගෙන් සෘජු බදු අයකර අඩු ආදායම් ලාභීන්ට සහනාධාර ලබාදී ආර්ථිකය සමතුලිත කළ හැකි වීමයි. එහෙත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව සෘජු බදු ලිපිගොනු සංඛ්‍යාව 400,000 කටත් අඩුවේ. එය මුළු ජනසංඛ්‍යාවෙන් 2% ක්වත් නියෝජනය නොකරයි.

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව දත්ත අනුව ආදායම් බෙදී යාමේ විෂමතාවයක් ද ඇති බවක් ද නොපෙනේ.

ආදායම් විෂමතාවයේ උපනති පරීක්ෂා කළ හැකි ප්‍රධාන සංරචකයන් දෙකක් දැක්විය හැකිය.

1. කුටුම්භ මාසික ආදායමේ ගිනි සංගුණකය
2. ඉහළම ආදායම් ලබන ජනගහනයේ 20% හිමිකරගත් ආදායම් ප්‍රතිශතය සහ පහළම ආදායම් ලබන ජනගහනයේ 20% හිමිකරගත් ආදායම් ප්‍රතිශතය සැසඳීම

පහත දැක්වෙන සංඛ්‍යා සටහන තුළින් ශ්‍රී ලංකාවේ 2002 -2016 කාල පරිච්ඡේදය තුළ ආදායම් විෂමතාවයේ උපනති හඳුනාගත හැකිය.

| දර්ශක / වර්ෂය | කුටුම්භ මාසික ආදායම් ගිනි සංගුණකය | ධනවත් 20% ආදායමෙන් හිමිකරගත් ප්‍රතිශතය | දිළිඳු 20% ආදායමෙන් හිමිකරගත් ප්‍රතිශතය |
|---|---|---|---|
| 2002 | 0.48 | 53.7 | 4.8 |
| 2006/07 | 0.49 | 54.7 | 4.6 |
| 2009/10 | 0.49 | 54.1 | 4.5 |
| 2012/13 | 0.48 | 52.9 | 4.5 |
| 2016 | 0.45 | 50.8 | 4.8 |

මූලා - ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ඉහත දැක්වෙන කුටුම්භ මාසික ආදායමේ ගිණි සංගුණකයෙන් මෙන්ම ධනවත් 20% ආදායමෙන් හිමිකරගත් ප්‍රතිශතය සහ දිළිඳු 20% ආදායමෙන් හිමිකරගත් ප්‍රතිශතය යන දත්ත මගින් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ 2010 වර්ෂයෙන් පසු ආදායම් විෂමතාවය මන්දගාමීව අඩුවී ඇති බවයි. එසේම ගිනි සංගුණකය 0.5 ට ආසන්නවීම තුල ජනතාවගෙන් බහුතරය මධ්‍යම ආදායම් ලබන්නන් බවද තහවුරු වේ.

ආදායම් බෙදීයාමේ සැලකියයුතු විෂමතාවයන් නොමැති නම් මසකට කුටුම්භ ආදායම රු. 400,000/= උපයන පිරිස කව්රුන්ද යන්න සොයාබැලිය යුතුවේ. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රම බලකා සමීක්ෂණ වාර්ෂික වාර්තාව 2021 අනුව ජන සංයුතිය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| අවුරුදු 15 ට අඩු ජනගහනය | - | 5,022,341 |
| ඉගෙන ගනිමින් සිටින ජනගහනය | - | 1,999,226 |

| | |
|---|---|
| ගෙදර වැඩකරගෙන සිටින ජනගහනය - | 3,809,684 |
| මහළු ජනගහනය (විශ්‍රාමික හැර) - | 1,164,003 |
| ශාරීරික රෝග/ආබාධිත අය - | 677,849 |
| වෙනත් - | 257,411<br>-- ------------- |
| ශ්‍රමබලකායට අයත් නොවන, -<br>කිසිදු ආදායමක් නොලැබෙන ජනගහනය | 12,930,514 |
| ශ්‍රමබලකායට අයත් එහෙත් සේවා වියුක්ත ජනගහනය- | 439,783<br>-------------- |
| කිසිදු ආදායමක් නොලැබෙන පිරිස - | 13,370,297<br>========== |
| විශ්‍රාමිකයින් (විශ්‍රාම වැටුප් දෙපා. අනුව) - | 672,196 |
| **ශ්‍රම බලකාය** | |
| සේවකයන් - රාජ්‍ය | 1,235,164 |
| පෞද්ගලික | 3,410,408 |
| සේවායෝජකයන් - | 222,833 |
| තමාගේම කටයුතුවල නියුතු - | 2,706,505 |
| පවුලේ කටයුතුවලට දායකවන - | 538,597<br>------------ |
| | 8,113,507<br>======== |

ඉහත ජන සංයුතිය අනුව රටේ සමස්ථ ජනගහනය (2021 වර්ෂය) 22156000 ක් වේ. ඉන් පුද්ගලයන් 13370297ක් කිසිම ආදායමක් නොලැබෙන බව දැක්වේ. එසේ නම් මිලියන 9 කට ආසන්න (8785703) ජනගහනයක් මිලියන 13 ක් ජනගහනයක් නඩත්තු කිරීම සඳහා ආදායම් උපයා ගතයුතු වේ. ඒ අනුව ඒක පුද්ගල ආදායම (2022 ඒක පුද්ගල ආදායමට අනුව) ආසන්න වශයෙන් රු. 100000 ලෙස සැලකුවහොත් ආදායම් ලබන පිරිසේ ඒක පුද්ගල ආදායම රු. 252000 කට ආසන්න අගයක් වේ.

එසේම ආදායම් ලබන පිරිස ලෙස හඳුනාගෙන ඇති විශ්‍රාමිකයන්ට ලැබෙන වැටුපේ සාමාන්‍ය අගය රු. 30977 ක් වේ. ආසන්න වශයෙන් රු. 31000 ක් වේ. රාජ්‍ය හා පෞද්ගලික සේවක සංඛ්‍යාව 4645572 ක් ලබන වැටුපේ සාමාන්‍ය අගය රු. 50000 ට අඩුවේ. ස්වයං රැකියා ලෙස සළකන (2706505 + 538597) 3245102 ජනගහනයෙන් බහුතරයද රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවක් වෙනුවට විකල්ප ආදායම් සෙවීම සඳහා කටයුතු කරන පුද්ගලයන් වේ. ත්‍රීරෝද රථයක් හෝ සුළු පරිමාන වෙළඳාමක් හෝ සේවාවක් කරන ජනතාව වේ. සේවකයන් යොදාගෙන අදාල ව්‍යාපාර කටයුතු කරන්නේ නම් ඔවුන් සේවායෝජකයන් යටතට වැටේ.

ඒ අනුව කිසිදු ආදායමක් නොලබන පිරිස හා රු. 100000 අඩුවෙන් ආදායම් ලබන බහුතර ජනතාවගේ පරතරයද පියවා දැමීමට හැකි එකම පිරිස වන්නේ සේවායෝජිතයන් ලෙස හඳුනාගෙන ඇති 222833 කගේ ආදායමයි. එම ජනගහනය 1% කටත් අඩුවන අතර ජනගහනයෙන් 99% කට නොලැබෙන ආදායමක් ඔවුන් ලබන්නේ නම් ආදායම් විෂමතා ගනනය නිවැරදි නොවේ.

එහෙත් යථාර්ථය වන්නේ එය නොවේ සමස්ථ ජනතාවට ප්‍රතිලාභ අත්නොවන අතිවිශාල ණය ගැනීම් ජාතික ආදායම් ගනනය කිරීමේදී ජාතික නිෂ්පාදනයට ඇතුලත් කිරිමයි. එසේම ජාතික නිෂ්පාදනය ගනනය කිරීමේදී උද්ධමන බලපෑම ඉවත් කිරීමේදී (උද්ධමන අනුපාතය

අඩුවෙන් ගනනය කිරීම නිසා) සමස්ථ මූර්ත ජාතික නිශ්පාදනයේ අධි තක්සේරු වීම තවදුරටත් ප්‍රසාරනය වීමක් සිදුවේ.

ඒ අනුව ආර්ථිකය පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනයට ඉවහල්වන ප්‍රධාන දර්ශක නිවැරදිව සකස් නොකිරීම මත දේශීය හා ජාත්‍යන්තරය නොමගයාම නිසා ගනුලැබූ තීරණ හේතුවෙන් ආර්ථිකය බංකොලොත්වීම සිදු වී ඇති බව පෙන්වා දිය හැකිය.

(සංවාදයට විවෘතයි)

# පනතෙන් බලගැන්වෙන ජාතික විගණනය

*කාංචනා ලියනආරච්චි*

විගණනය කිරීම යනු සරලව ගණනය කිරීම සුපරීක්ෂණයයි. සුපරීක්ෂණය කරනු ලබන ගණනය කිරීම මහජනතාවගේ ජීවත් වීමේ අයිතියේ (Right to Life) ආරක්ෂකයායි. එකී සන්දර්භය තුළ ශ්‍රී ලංකාවේ උත්තරීතර විගණන ආයතනය වන ජාතික විගණන කාර්යාලය එක් අයුරකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ ප්‍රතිපාදනවල ආරක්ෂකයා වේ. වෙස්ට්මිනිස්ටර් ආකෘතියේ විගණන ක්‍රමයක් වන ජාතික විගනණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මෙන්ම 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින්ද බලවන්ත (empower) කර ඇති අතර නීතිය මගින් වෙස්ට්මිනිස්ටර් ආකෘතිය කෙතෙක් දුරට ශක්තිමත් කර ඇතිද සහ එහි භාවිතාව පිළිබඳව විමසා බැලීමට මෙම ලිපියෙන් අපේක්ෂා කෙරේ.

වර්තමාන දේශපාලන හා ආර්ථික සන්දර්භය තුළ නැපෝලියානු ආකෘතියක විගණනයක් ලංකාවට සුදුසු බව බැලූ බැල්මට පෙනී ගියත් පවතින ආකෘතිය, පවතින නෛතික ප්‍රතිපාදන තුළ ශක්තිමත් කර ගැනීම භාවිතාව තුළ සිදුවිය යුතුය.

මූල්‍ය විගණනය, අනුකූලතා විගණනය සහ කාර්ය සාධන විගණනය යන විගණනයන් එක්ව සාදන විස්තීරණ විගණන රාමුව තුළ සංවිධානයක් හෝ කාර්යයක් පිළිබඳ සම්පූර්ණ දර්ශනයක් සපයන අංග සම්පූර්ණ විගණනයක් ජාතික විගණන කාර්යාලය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව, ඒකාබද්ධ අරමුදල හා සම්බන්ධ සියලු ආදායම්, වියදම් හා, රජයේ ආයෝජන ඇතුළත් වන්නා වූ රජයේ හා අර්ධ රාජ්‍ය සියලු ආයතනවල මූල්‍ය ප්‍රකාශන සහ මෙහෙයුම් පිළිබඳව කාලානුරූප වාර්තා විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි. එමගින් ස්වාධීන ආයතනයක් විසින් විමර්ශනය කළ යුතු ගැටලු හා තත්ත්වයන් ජාතික විගණන කාර්යාලය විසින් ආමන්ත්‍රණය කරන බවට එහි විගණනයන් විසින් පාර්ලිමේන්තුවට සහතික කරනු ලබයි.

කෙසේ නමුත්, වෙස්ට්මිනිස්ටර් ආකෘතියේ විගණනයේ මූලික ලක්ෂණයක් වන නෛතික අනුකූලතාව පිළිබඳ අඩු අවධාරණයක් සහිත වීම පවතින දේශපාලන සමාජ ආර්ථික පසුබිම තුළ විගණනයේ තථ්‍ය අරමුණු ඉටු කර ගැනීමට බාධාවක් වී ඇති බැවින් ජාතික විගණන පනත ඒ සඳහා ශක්තිමත් නෛතික ප්‍රතිපාදන සලසා ඇත.

ජාතික විගණන පනතේ 7 වගන්තියේ ඇතුළත් විධිවිධාන මගින් වඩාත් නිරවද්‍ය සහතික කිරීමකට අවශ්‍ය වන අන්දමේ විගණන සාක්ෂ්‍ය ලබා ගැනීමට ඇතැම් අවස්ථාවලදී අභිමතය ක්‍රියාත්මක කිරීමද ඇතුළුව විගණකාධිපතිවරයාට හා ඔහුගේ අධිකාරියලත් නිලධාරීන්ට ඉතා පුළුල් බලයක් ලබා දී ඇත. ඒ යටතේ තම කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය බවට විගණකාධිපතිවරයා විසින් සලකනු ලබන ආකාරයේ තොරතුරු, සන්තකයේ තබාගෙන සිටින බවට විගණකාධිපතිවරයාගේ සාධාරණ විශ්වාසය අනුව, යම් තැනැත්තෙකු සේවයේ යෙදී සිටියද නොසිටියද කැඳවීමට හා ප්‍රකාශ සටහන් කිරීමට විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරියලත් තැනැත්තෙකුට හැකියාව ඇත. එමෙන්ම මෙම වගන්තියේ විධිවිධානවලට යටත්ව තොරතුරු සපයනු ලබන සෑම තැනැත්තෙකු විෂයෙහිම පනතේ 7(3) වගන්තිය මගින් නෛතික ආරක්ෂාවක්ද සපයා ඇත.

මෙම ප්‍රතිපාදනවල ඇති නෛතික වටිනාකම වන්නේ විගණකාධිපතිවරයා සාක්ෂි ආඥා පනතේ 25 වගන්තිය ප්‍රකාර සාම නිලධාරියෙකු නොවන හෙයින් යම් තැනැත්තෙකු විසින් විගණකාධිපතිවරයා ඉදිරියේ කරනු ලබන ප්‍රකාශයක යම්තාක් දුරකට වරද කියා පෑමක් ඇතුළත් වන්නේ නම් එය ව්‍යතිරේකවලට යටත්ව ඔහුට විරුද්ධව නීතිය ඉදිරියේ ඔප්පු කිරීමේ හැකියාවක් පැවතීමයි. එමගින් ඉහත කී බලතලවලට දූෂණය පිටුදැකීම

ඉදිරියේ වඩාත් ශක්තිමත් කාර්යභාරයක් ඉටු කිරීමට හැකියාවක් ඇත.

එමෙන්ම, යම් තැනැත්තෙකුගේ ගිණුමක් වෙත විගණනය කරනු ලබන ආස්ථිතයට අයත් මුදල් වංචා සහගත ලෙස, අනිසි ලෙස හෝ සාවද්‍ය ලෙස ගෙවා ඇති බවට විශ්වාස කිරීමට හේතු පවතින විටකදී මහේස්ත්‍රාත් අධිකරණයේ අවසරයක් ඇතිව එනම් සෝදිසි වරෙන්තුවක් ලබාගෙන එකී තැනැත්තෙකුගේ, යම් මූල්‍ය ආයතනයක පවතින ගිණුම් ගනුදෙනු හෝ ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීමට ද විගණනය කිරීමටද විගණකාධිපතිවරයාට බලය ඇත. එසේ පනත යටතේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරිමේදී විගණකාධිපතිවරයා විසින් හෝ ඔහුගේ අධිකාරියලත් කවර හෝ තැනැත්තෙකු විසින් ඉල්ලා සිටින යම් අවශ්‍යතාවයක් ඉටු නොකරනු ලබන යම් තැනැත්තෙකු වරදක් සිදු කරන අතර මහේස්ත්‍රාත් අධිකරණයේ ලඝු නඩු විභාගයකින් වරදකරු කිරීමට හැකි අතර එවැනි තැනැත්තෙකු මහේස්ත්‍රාත්වරයා නියම කරනු ලබන දඩයකටද පනතේ 42 වගන්තිය මගින් යටත් කොට ඇත.

එසේ රැස්කරන ශක්තිමත් විගණන සාක්ෂ්‍ය හෙවත් තොරතුරු එනම් ඉලෙක්ට්‍රොනික ක්‍රමවලින් ජනනය කරන ලද දත්ත ද ඇතුළත්ව යම් වාචික හෝ ලිඛිත සාක්ෂ්‍ය අධිකාරිය නොලත් තුන්වන පාර්ශවයකට හෙළිදරව් නොකිරීමට විගණකාධිපතිවරයා බැඳී සිටින නමුත් විගණනය අර්ථාන්විත කිරීම සඳහා ජාතික විගණන පනතේ 9 වගන්තියට ව්‍යතිරේඛ තුනක් ඇතුළත් කොට ඇත. එනම්,

- පාර්ලිමේන්තුව විසින් කරනු ලබන ඉල්ලීමක් මත
- අධිකරණයේ ආඥාවක් අනුව
- පහත කොන්දේසි දෙකට යටත්ව යම් ලිඛිත නීතියක විධිවිධාන බලාත්මක කිරීම සඳහා එනම්
    - යම් තොරතුරක් ලබාදෙන අදාළ තැනැත්තාගේ හෝ ආයතනයේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමෙන් පසු **සහ**
    - නියම කරනු ලැබිය හැකි පරිදි විගණකාධිපතිවරයා විසින් එම තොරතුරුවලට අදාළව පිළියෙල කරන ලද වාර්තාවක් හෝ ප්‍රකාශයක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු

විගණනෙය්දී රැස්කරන සාකෂ්‍ය තුන්වන පාර්ශවයකට ලබා දිය හැක. මෙහි තුන්වන ව්‍යතිරේකී විධිවිධාන ප්‍රකාරව කොන්දේසිවලට යටත්ව ව්‍යවස්ථාපිතව බලය පැවරුණු විමර්ශන ආයතන වෙත විගණන සාක්ෂි ලබා දීමට ඇති හැකියාව මගින් විගණකාධිපතිවරයාට ඵලදායී අපරාධ විමර්ශනයන් සඳහා සහයෝගය ද ලබා දිය හැක. එමෙන්ම, විශේෂයෙන් යම් වංචාවකට අදාළව යම් සැකකරුවකු විසින් විගණකාධිපතිවරයා හෝ ඔහුගේ අධිකාරියලත් තැනැතුතෙකු ඉදිරියේ ලබා දුන් ප්‍රකාශයක් එහි ඇතුළත් කරුණු එකී තැනැත්තාට එරෙහිව නීතිය ඉදිරියේ ඔප්පු කිරීමටද ඇති හැකියාව නිසා තාක්ෂණික කරුණු හේතුවෙන් ඇති වී ඇති අපරාධ සහ දඬුවම් අතර වන දුරස්ථභාවය ද අවම කළ හැකිය. විගණනයේ සාක්ෂ්‍ය වඩාත් ශක්තිමත් වන්නේ එවැනි යම් කරුණකට එරෙහිව විත්තිවාචක ඉදිරිපත් කිරීම චූදිත තැනැත්තා වෙත පැවරෙන බැවිනි.

ඒ අනුව, උත්තරීතර විගණන ආයතනය කිසිඳු අධිකරණමය කාර්යයක් ඉටු නොකරන නමුත්, විගණනය විසින් සිදු කරනු ලබන සොයාගැනීම් ජාතික විගණන පනත තුළින් නීතිය මගින් බලගන්වා ඇති හෙයින් විගණනයේ අවසන් නිමැවුම වරදකරුවන්ට දඬුවම් පැමිණවීම දක්වා වර්ධනය කළ හැකිය.

මේ අනුව, දූෂණය වැළැක්වීම උත්තරීතර විගණන ආයතනවල පැහැදිලි වගකීමක් නොවුනද, විගණනය මගින් වංචා, දූෂණ හා අක්‍රමිකතා අනාවරණය කරන බැවින් සහ ජාතික විගණන පනතේ 9 වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව විගණන සාක්ෂ්‍ය නීතිය ඉදිරියේ ශක්තිමත් වන බැවින් ද ඉහත කී පරිදි සාක්ෂ්‍ය ආඥා පනතේ විධිවිධාන මගින් විගණන සාක්ෂ්‍ය තවදුරටත් නීතිය ඉදිරියේ අනුකූලතාවයක් ලැබී ඇති හෙයින් ද ලංකාවේ රාජ්‍ය විගණනයට දූෂණය වැළැක්වීම සඳහා ශක්තිමත් හා ඵලදායී කාර්යභාරයක් ඉටු කළ හැකිය. එමගින් එය

රාජ්‍ය විගණනයේ ශක්තිමත් බාවය මෙන්ම අර්ථවත්බාවය ද වර්ධනය කරන අතර විගණනය යම් පමණකට වුවත් වැඩි වශයෙන් මූලික මිනිස් අයිතිවාසිකම්වල ආරක්ෂකයා වීමේ වගකීමද තහවුරු කරයි.

එසේම, දූෂණ හඳුනා ගැනීමේ හා වැළැක්වීමේ තීරණාත්මක කොටසක් වන විශ්වාසනීය වාර්තාකරණය සහ අභ්‍යන්තර පාලනයන් මත පදනම් වූ ශක්තිමත් මූල්‍ය කළමනාකරණයක් පෝෂණය කිරීම මගින් රජයේ වැඩසටහන් සහ ක්‍රියාවන්හි විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කරන බැවින් රාජ්‍ය විගණනය තවදුරටත් දූෂණයට එරෙහිව ක්‍රියාත්මක වෙමින් මහජනතාවගේ ආරක්ෂකයා ලෙස ද කටයුතු කරනු ලබයි.

☺ දැනුමට ලිපි

# විවේචනාත්මක චින්තනය (Critical Thinking) අපගේ ජීවිතයට වැදගත් වන්නේ ඇයි ?

එම්.එන්. අබේසිරි,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විවේචනාත්මක චින්තනය අපගේ ජීවිතයට වැදගත් වන්නේ ඇයි ? ඔබ ගන්නා තීරණ ඔබේ ජීවන තත්ත්වයට බලපායි. ඔබ ඔබේ හොඳම, වඩාත්ම සාර්ථක සහ ප්‍රීතිමත් ජීවිතයක් ගත කරන බව සහතික කිරීමට ඔබට අවශ්‍ය නම්, ඔබට සවිඥානික තේරීම් කිරීමට අත්‍යවශ්‍ය වනු ඇත. ඔබට එය විවේචනාත්මක චින්තනය ලෙස හඳුන්වන සරල දෙයකින් එය කළ හැකිය. ඔබේ විවේචනාත්මක චින්තන කුසලතා වැඩි දියුණු කිරීමෙන් ඔබට පසුතැවෙන්නේ නැති තීරණ ගත හැකිය. විවේචනාත්මක චින්තනය ධනාත්මක චින්තනයට (Positive Thinking) විරුද්ධ දෙයක් ලෙස සමහරුන්ට සිතිය හැකිය. නමුත් එය එසේ නොවේ. එය ධනාත්මක චින්තනය වඩාත් හරවත් සහ සඵල දෙයක් කිරීමට උදව් වන්නේය. එසේම එය ධනාත්මක චින්තනයේ නව වැඩි දියුණු කිරීමකි. පහත ලිපිය කියවීමෙන් ඔබට ඒ බව ගම්‍ය වේ.

## විවේචනාත්මක චින්තනය යනු කුමක්ද ?

විවේචනාත්මක චින්තනය ගැන ඔබ නිසැකවම අසා ඇත, නමුත් එහි ඇත්ත වශයෙන්ම අදහස් කරන්නේ කුමක්ද යන්න ඔබට සම්පූර්ණයෙන්ම විශ්වාස නැති විය හැකි අතර ඊට හේතුව ඒ සඳහා බොහෝ අර්ථකථන ඇති බැවිනි. කෙසේ වෙතත් විවේචනාත්මක චින්තනය යනු විනිශ්චයක් සැකසීම සඳහා අවශ්‍ය කරුණු විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලිය ලෙස හැඳින්විය හැකිය. මූලික වශයෙන්, එය සිතීම ගැන සිතීමයි.

විවේචනාත්මක චින්තනය ලේඛණ ගත කළ පළමු අවස්ථාව ප්ලේටෝ විසින් වාර්තා කරන ලද සොක්‍රටීස්ගේ ඉගැන්වීම බව විශ්වාස කෙරේ. නමුත් ඉතිහාසය පුරාවටම නිර්වචන වෙනස් වී ඇත.

අද එය දාර්ශනිකයන් සහ මනෝවිද්‍යාඥයින් විසින් වඩාත් හොඳින් වටහාගෙන ඇති අතර එය ඉතා සංකීර්ණ සංකල්පයක් ලෙස විශ්වාස කෙරේ.

> “විශ්වාස කළ යුතු හෝ කළ යුතු දේ තීරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරන සාධාරණ, පරාවර්තක චින්තනය.”
>
> “සත්‍යය කුමක්ද සහ ඔබ කළ යුත්තේ කුමක්ද යන්න තීරණය කිරීම.” විවේචනාත්මක චින්තනය මඟින් අදහස් වේ.

## විවේචනාත්මක චින්තනයේ වැදගත්කම.

විවේචනාත්මක චින්තනය වැදගත් වන්නේ ඇයි ? විවේචනාත්මක චින්තනය අපගේ ජීවිත සාර්ථක කර ගැනීම සඳහා උදව් විය හැකි ආකාරය අප දැන් සලකා බලමු.

### 01. විවේචනාත්මක චින්තනය විශ්වවීය වේ.

විවේචනාත්මක චින්තනය සාමාන්‍ය චින්තන කුසලතාවකි. මෙමඟින් කුමක් වෙයිද ? එයින් අදහස් වන්නේ ඔබ කුමන මාර්ගයක් හෝ වෘත්තියක් අනුගමනය කළත්, මෙම කුසලතා සැම විටම අදාළ වන අතර ඔබේ සාර්ථකත්වයට සැම විටම ප්‍රයෝජනවත් වනු ඇත. ඒවා කිසිම

ක්ෂේත්‍රයකට විශේෂිත නොවේ.

**02. ආර්ථිකය සඳහා තීරණාත්මකයි.**

අපගේ අනාගතය තාක්ෂණය, තොරතුරු සහ නවෝත්පාදනය මත රඳා පවතී. වේගයෙන් වර්ධනය වන ආර්ථිකයක් සඳහා, හැකි ඉක්මන් හා ඵලදායී ලෙස ගැටළු විසඳීමට විවේචනාත්මක චින්තනයක් අවශ්‍ය වේ.

**03. භාෂා සහ ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කරයි.**

අපට හොඳින් අදහස් ප්‍රකාශ කිරීමට නම්, අපි පැහැදිලිව සහ ක්‍රමානුකූලව සිතන ආකාරය දැන සිටිය යුතුය. එනම් විවේචනාත්මක චින්තනය පුරුදු පුහුණු කිරීමයි! විවේචනාත්මක චින්තනය යන්නෙන් අදහස් කරන්නේ පාඨ බිඳ දැමිය යුතු ආකාරය දැන ගැනීම සහ අනෙක් අතට, අපගේ තේරුම් ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීමයි.

**04. නිර්මාණශීලීත්වය වර්ධනය කරයි.**

විවේචනාත්මක චින්තනය පුරුදු කිරීමෙන්, අපට ගැටළු විසඳීමට පමණක් නොව, ඒ සඳහා නව සහ නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කිරීමට ඉඩ සලසයි. විවේචනාත්මක චින්තනය අපට අදහස් විශ්ලේෂණය කිරීමට සහ ඒ අනුව සකස් කිරීමට ඉඩ සලසයි.

**05. ස්වයං ආවර්ජනය සඳහා වැදගත්.**

විවේචනාත්මක චින්තනයකින් තොරව, අපට සැබැවින්ම අර්ථවත් ජීවිතයක් ගත කළ හැක්කේ කෙසේ ද ? අපගේ ජීවන මාර්ග සහ අදහස් ස්වයං - ආවර්ජනය කිරීමට සහ සාධාරණීකරණය කිරීමට අපට මෙම කුසලතාව අවශ්‍ය වේ. විවේචනාත්මක චින්තනය අපට අවශ්‍ය ආකාරයට අපව ඇගයීමට අවශ්‍ය මෙවලම් සපයයි.

**06. විද්‍යාවේ සහ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම.**

ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කර ගැනිමටත් විද්‍යාත්මක කරුණු ඔප්පු කිරීමටත් ලෝකයේ විවේචනාත්මක චින්තනයක් අවශ්‍යයි. සමාජයක් ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට නම්, එහි පුරවැසියන් හරි දේ සහ වැරදි දේ පිළිබඳ මතයන් ස්ථාපිත කළ යුතුයි.

**<u>විවේචනාත්මක චින්තනයේ ප්‍රතිලාභ.</u>**

විවේචනාත්මක චින්තනය සමස්ත සමාජයටම යහපත් බව අපි දනිමු. නමුත් පුද්ගල මට්ටමින් විවේචනාත්මක චින්තනයේ වැදගත් ප්‍රතිලාභ මොනවාද ? විවේචනාත්මක චින්තනය අපට වැදගත් වන්නේ ඇයි ? යන්න සලකා බලමු.

**01. වෘත්තීය සාර්ථකත්වය සඳහා යතුර.**

බොහෝ වෘත්තිය මාර්ග සඳහා විවේචනාත්මක චින්තනය ඉතා වැදගත් වේ. විද්‍යාඥයින් සඳහා පමණක් නොව, නීතීඥයින්, වෛද්‍යවරුන්, විගණකයින්, වාර්තාකරුවන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරීවරුන් සහ විශ්ලේෂකයින් සිය තනතුරු සඳහා විවේචනාත්මක චින්තනය භාවිත කරයි.

ඇත්ත වශයෙන්ම, ලෝක ආර්ථික සංසදයට අනුව, විවේචනාත්මක චින්තනය ශ්‍රම බලකාය තුළ තිබිය යුතු වඩාත්ම කැමති කුසලතාවකි. එය තොරතුරු විශ්ලේෂණය කිරීමට,

කොටුවෙන් පිටත සිතීමට, නව්‍ය විසඳුම් සමඟ ගැටලු විසඳීමට සහ ක්‍රමානුකූලව සැලසුම් කිරීමට උපකාරී වේ.

**02. වඩා හොඳ තීරණ ගැනීම.**

විවේචනාත්මක චින්තකයින් හොඳම තේරීම් කරයි. විවේචනාත්මක චින්තනය එදිනෙදා ගැටළු අප වෙත පැමිණෙන විට ඒවා සමඟ කටයුතු කිරීමට අපට උපකාරී වන අතර බොහෝ විට මෙම චින්තන ක්‍රියාවලිය නොදැනුවත්වම සිදුවේ. එය අපට ස්වාධීනව සිතීමට සහ හැඟීම් විශ්වාස කිරීමට උපකාරී වේ.

**03. ඔබව සතුටු කළ හැකිය!**

විවේචනාත්මක චින්තනය ඔබට ඔබව වඩා හොඳින් අවබෝධ කර ගැනීමට උපකාරී වන අතර, අනෙක් අතට ඕනෑම ආකාරයක සෘණාත්මක හෝ සීමාකාරී සාධකයන් වළක්වා ගැනීමට සහ ඔබේ ශක්තීන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට උපකාරී වේ. ඔබේ සිතුවිලි බෙදා ගැනීමට හැකි වීමෙන් ඔබේ ජීවන තත්ත්වය ඉහළ නැංවිය හැකිය.

**04. හොඳින් දැනුවත් අදහස් සැකසීම.**

සෑම පැත්තකින්ම අප වෙත එන තොරතුරු වල අඩුවක් නැත. අපගේ විවේචනාත්මක චින්තන කුසලතා භාවිතා කර විශ්වාස කළ යුතු දේ අප විසින්ම තීරණය කළ යුත්තේ එබැවිනි. විවේචනාත්මක චින්තනය මඟින් අපගේ අදහස් පදනම් වී ඇත්තේ කරුණු මත බව සහතික කර ගැනීමට සහ අමතර ඝෝෂාව නිරාකරණය කිරීමට අපට උපකාර කරයි.

**05. වඩා හොඳ පුරවැසියන්**

හිටපු එක්සත් ජනපද ජනාධිපති තෝමස් ජෙෆර්සන් විසින් වඩාත් ප්‍රබෝධමත් විවේචනාත්මක චින්තන උපුටා දැක්වීම් කළ අයෙකි. මෙහිදී ජෙෆර්සන් අපට අවධාරණය කරන දෙය නම්, විවේචනාත්මක චින්තකයින් වඩා හොඳ පුරවැසියන් බවට පත් වන බවයි. මන්ද ඔවුන්ට පක්ෂග්‍රාහීත්වය හා ප්‍රචාරණය මත රඳා නොසිට සමස්ත චිත්‍රය දැක ගත හැකි බැවිනි.

**06. සබඳතා වැඩි දියුණු කරයි.**

විවේචනාත්මක චින්තනයෙකු වීම සබඳතා වලදී ඔබට ගැටළු ඇති කිරීමට බැඳී සිටින බව ඔබට ඒත්තු ගැන්විය හැකි වුවද සත්‍ය එය නොවේ. විවේචනාත්මක චින්තකයෙකු වීම අන් අයගේ ඉදිරි දර්ශනය වඩා හොඳින් අවබෝධ කර ගැනීමට ඔබට ඉඩ සලසයි. විවිධ අදහස් කෙරෙහි වඩාත් විවෘත මනසක් ඇති වීමට ඔබට උපකාර කළ හැකිය.

**07. කුතුහලය ප්‍රවර්ධනය කරයි.**

විවේචනාත්මක චින්තකයින් ජීවිතයේ සෑම ආකාරයකම දේවල් ගැන නිරන්තරයෙන් කුතුහලයෙන් සිටින අතර, පුළුල් පරාසයක රුචිකත්වයන් ඇත. විවේචනාත්මක චින්තනය යනු නිරන්තරයෙන් ප්‍රශ්න ඇසීම සහ වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය වන්නේ ඇයි, කුමක්, කවුරුන්, කොහේද, කවදාද සහ ඔවුන්ට යම් තත්ත්වයක් හෝ සංකල්පයක් අවබෝධ කර ගැනීමට උපකාර කළ හැකි අන් සියල්ල ගැන, තොරතුරු සෙවීමයි.

**08. නිර්මාණශීලීත්වය සඳහා ඉඩ ලබා දේ.**

විවේචනාත්මක චින්තකයින් ද ඉතා නිර්මාණශීලී චින්තකයින් වන අතර, හැකියාවන් සම්බන්ධයෙන් තමන් අසීමිත ලෙස සලකයි. ශ්‍රම බලකායේ තීරණාත්මක වන දේවල් තව දුරටත් ඉදිරියට ගෙන යාමට ඔවුන් නිරතුරුවම බලා සිටියි.

**09. ගැටළු විසඳීමේ කුසලතා වැඩි දියුණු කරයි.**

විවේචනාත්මක චින්තන කුසලතා ඇති අය ඔවුන්ගේ ස්වභාවික සහජ බුද්ධියේ කොටසක් ලෙස ගැටළු විසඳීමට නැඹුරු වෙති. විවේචනාත්මක චින්තකයින් ඉවසිලිවන්තව සහ ගැටළුව විසඳීමට කැපවී සිටිති.

විවේචනාත්මක චින්තකයින්ගේ වැඩි දියුණු කරන ලද ගැටළු විසඳීමේ කුසලතා ඔවුන්ව ඔවුන්ගේ රැකියාවේ වඩා හොඳ කරන අතර ලෝකයේ විශාලතම ගැටළු විසඳීමට වඩා හොඳ කරයි. අයින්ස්ටයින් මෙන් ඔවුන්ටත් ලෝකය වචනාර්ථයෙන් වෙනස් කිරීමේ හැකියාව ඇත.

**10. මනස සඳහා ක්‍රියාකාරකමක්.**

අපගේ මාංශ පේශී මෙන්ම, ඒවා ශක්තිමත් වීමට නම් භෞතික ක්‍රියාකාරකම් අවශ්‍ය වනවාසේ අපගේ මනස සඳහාද ව්‍යායාම කිරීම සහ අභියෝග කිරීම අවශ්‍ය වේ. විවේචනාත්මක චින්තනය මනස සඳහා ක්‍රියාකාරකමක් හා සමාන බව සැලකෙන අතර එය ප්‍රගුණ කළ යුතු වේ. විවේචනාත්මක චින්තනය තාර්කික චින්තනය, තීරණ ගැනීම සහ විවෘත මනස වැනි බොහෝ තීරණාත්මක කුසලතා වර්ධනය කිරීමට දිරි ගන්වයි.

**11. ස්වාධීනත්වය ඇති කරයි.**

අපි විවේචනාත්මකව සිතන විට අප ගැනම වැඩි විශ්වාසයක් ඇති බැවින් අපි තනිවම සිතමු. ස්වාධීනත්වය ඇති කිරීම සඳහා විවේචනාත්මක චින්තනය ප්‍රධාන වන අතර, ඔවුන්ගේම තීරණ ගැනීමට සහ ඔවුන්ගේම අදහස් සැකසීමට දිරිමත් කරයි.

**12. තීරණාත්මක ජීවන කුසලතා.**

විවේචනාත්මක චින්තනය ඉගෙනීම සඳහා පමණක් නොව, සමස්ත ජීවිතය සඳහා ඉතා වැදගත් වේ. අධ්‍යාපනය යනු ජීවිතය සඳහා අපව සූදානම් කර ගැනීමේ මාර්ගයක් පමණක් නොව, එය බොහෝ දුරට ජීවිතයම වේ. ඉගෙනීම යනු අප සෑම දිනකම ගමන් කරන ජීවිත කාලය පුරාම සිදු කරන ක්‍රියාවලියකි.

<u>විවේචනාත්මකව සිතන ආකාරය.</u>

විවේචනාත්මකව සිතීමේ ප්‍රතිලාභ ඔබ දැන් දන්නා බැවින්, ඔබ එය ඇත්ත වශයෙන්ම කරන්නේ කෙසේද?

ඔබේ විවේචනාත්මක චින්තනය වැඩි දියුණු කරන්නේ කෙසේ ද ?

- ඔබේ ප්‍රශ්නය නිර්වචනය කරන්න : විවේචනාත්මක චින්තනය සම්බන්ධයෙන්, ඔබේ ඉලක්කය සෑම විටම මතකයේ තබා ගැනීම වැදගත් වේ. ඔබ සාක්ෂාත් කර ගැනීමට උත්සහ කරන්නේ කුමක් දැයි දැන ගන්න. ඉන්පසු එහි යාමට හොඳම ආකාරය සොයා ගන්න.

- විශ්වාසදායක තොරතුරු රැස් කරන්න : ඔබ විශ්වාස කළ හැකි මූලාශ්‍ර භාවිතා කරන බවට වග බලා ගන්න - පක්ෂග්‍රාහීත්වය පසෙකලා සැබෑ විවේචනාත්මක චින්තකයෙකු ක්‍රියාත්මක වන්න.
- නිවැරදි ප්‍රශ්න අසන්න : ප්‍රශ්න වල වැදගත්කම අපි කවුරුත් දනිමු. නමුත් ඔබ අසන්නේ නිවැරදි ප්‍රශ්න බව සහතික කර ගන්න.
- කෙටි හා දිගු කාලීන බලන්න : විසඳුම් ඉදිරිපත් කරන විට, කෙටි හා දිගු කාලීන ප්‍රතිවිපාක ගැන සිතන්න. ඒවා දෙකම එකසේ වැදගත් වේ.
- සියළු පැති ගවේෂණය කරන්න : කිසිවිටක එක් සරල පිළිතුරක් නොමැති අතර කිසිවක් කළු හෝ සුදු නොවේ. ඔබ යම් නිගමනවලට පැමිණීමට පෙර සියලු විකල්ප ගවේෂණය කර කොටුවෙන් පිටත සිතන්න.

විවේචනාත්මක චින්තකයින් ප්‍රශ්න අසන, නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කරන සහ තරඟයට එරෙහිව නව්‍යකරණයන් ඉදිරිපත් කිරීමට සෑම විටම සූදානමින් සිටින සේවකයින් සේවා යෝජකයින් අගය කරයි. ආයතනයක ඔබේ තනතුර හෝ භූමිකාව කුමක් වුවත්, විවේචනාත්මක චින්තනය සෑම විටම ඔබට කැපී පෙනෙන හා වෙනසක් කිරීමට බලය ලබා දෙනු ඇත. ඉහත සඳහන් පරිදි විවේචනාත්මක චින්තනය,

- කළමණාකරු
- මානව සම්පත් විශේෂඥ
- විගණක
- නීතීඥ
- වෛද්‍ය
- අලෙවි කළමණාකරු
- ව්‍යාපාර විශ්ලේෂක
- ගණකාධිකාරී

ආදී වෘත්තීන්ට ඉතා වැදගත් වන අතර සත්‍ය වශයෙන්ම පැවසුවහොත්, විවේචනාත්මක චින්තනයක් අවශ්‍ය නොවන වෘත්තිය ක්ෂේත්‍රයක් සොයා ගැනීම අපහසු වේ.

අන්තර්ජාලය ඇසුරින් සකස් කරන ලද්දේ :

# ජාතික රතුදත්ත ලේඛනය (National Red List )

-------------------------------------------------------

පී.කේ. කන්දෙගෙදර මිය.
සහකාර විගණන අධිකාරි

- ජීවී විශේෂවල (ශාක හා සත්ත්ව) සංරක්ෂණ තත්ත්වය ඇගයීම රතු දත්තකරණය ලෙස නම් කරන අතර පරිසර අමාත්‍යාංශයේ ජෛවවිවිධත්ව අංශය විසින් ජාතික රතු දත්ත ලේඛනය සකස්කිරීම සිදුකරයි.
- ගෝලීය ජෛවවිවිධත්ව සම්මුතියේ (Convention on Biological Diversity) පාර්ශවකාර රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව, ගෝලීයව සිදුකරන ජෛවවිවිධත්ව සංරක්ෂණ ක්‍රියාවලියට මෙමඟින් දායක වනු ඇත.
- නියමිත කාල වකවානුවකදී ජීවීන්ගේ (ශාක හා සත්ව විශේෂවල) තොරතුරු මඟින් සංරක්ෂණ තත්වය ඇගැයීම රතු දත්ත ලේඛනය තුලින් සිදුකෙරේ. මෙය සාමාන්‍යයෙන් වසර 5-10කට වරක් සිදුකෙරේ.
- ජාතික රතු දත්ත ලේඛනය, ජෛවවිවිධත්ව සංරක්ෂණ සැලසුම්වලදී භාවිතාවන එක් මෙවලමක් වන අතර ලෝකයේ ජෛවවිවිධත්ව තත්ත්වය පිළිබඳ තීරණාත්මක දර්ශකයකි.
- IUCN (*International Union for Conservation of Nature*) ආයතනයේ ජාත්‍යන්තර රතු දත්ත ලේඛනය සකස්කිරීමේ නිර්ණායක අනුව ජාතික රතු දත්ත ලේඛනය සැකසීම සිදුකෙරේ.
- මෙමගින් ප්‍රධාන වශයෙන්ම පහත කාර්යයන් ඉටුවේ.
  - වඳවීමේ තර්ජනයට ලක් වූ ජීවින්ගේ විශේෂ පැතිකඩ සැකසීම සඳහා තොරතුරු ලබා දීම.
  - විශේෂිත ජීවි කාණ්ඩවල භූගෝලීය පැතිරීම හා තොරතුරු පිළිබඳ හිදැස් (Gaps) දැක්වීම.
  - ජාතික පර්යේෂණ සංවර්ධනය න්‍යාය පත්‍රය සැකසීමට විද්‍යාත්මක පදනමක් සැපයීම.
  - ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහාවන පර්යේෂණවලට මූල්‍යාධාර ප්‍රමුඛතාව ලබාදීම.
  - ජෛවවිවිධත්ව උණුසුම් ස්ථාන විශ්ලේෂණයේදී මූලික පදනම ලබාදීම.
  - ජෛවවිවිධත්ව සංරක්ෂණය සඳහාවන නීති රෙගුලාසි හා ප්‍රත්පත්ති සම්පාදනයට හා නියාමනයට විද්‍යාත්මක පදනමක් සැපයීම.
  - දැනුවත් කිරීම ප්‍රවර්ධනය සඳහා තොරතුරු ලබාදීම.
  - සංවර්ධන සැලසුම් සඳහා කලාපීය හා දේශීය පරිපාලන ව්‍යුහයට පිළිගත් තීරණ ගැනීමේ වේදිකාවක් සැපයීම.

- ජෛවවිවිධත්වයේ ස්ථානීයවත් කාලානුරූපීයවත්වන වෙනස්වීම් අධීක්ෂණයට රාමුවක් සැපයීම.

- පරිසර අමාත්‍යාංශය මගින් 2007 හා 2012 රතු දත්ත ලේඛන පිළියෙල කෙරුනි.
- ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තුමේන්තුවේ ජාතික ශාකාගාරයේ සහයෝගීතාවය ඇතිව 2020 දී ශාක පිළිබඳ රතු දත්ත ලේඛනය සකස්කළ අතර සත්ත්ව විශේෂ වලින් මත්ස්‍ය හා පක්ෂි විශේෂ පිළිබඳව රතු දත්ත ලේඛනය පිළියෙල කර ඇත. දැනට අනෙකුත් සත්ත්ව විශේෂවල දත්ත ඇගැයීමේ සාකච්ඡා හා සත්ව කාණ්ඩ දත්ත එක්රැස් කිරීම සිදුකරමින් 2020 නව රතු දත්ත ලේඛනය යාවත් කාලීන කෙරෙමින් පවතී.
- ජාතික රතුදත්ත ලේඛනය සැකසීමේදී පහත නිර්ණායක උපයෝගී කර ගනු ලබයි.



# පරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය

# (EIA – Environmental Impact Assessment)

**එම්.ඩී.එච්.මුණසිංහ**

**සහකාර විගණන අධිකාරි**

1969වර්ෂයේදී එක්සත් රාජධානිය විසින් ජාතික පාරිසරික පනත හරහා පාරිසරික බලපෑම් තක්සේරු කරනයේ වැදගත්කම හඳුන්වාදෙන ලදී .මේ අනුව 1988දී ශ්‍රී ලංකාව පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රමවේදය හඳුන්වා දී ඇත .මානව දයාවේ සිතුම් පැතුම් සහ ජීවන තත්ත්වය වර්ධනය වීමත් සමඟ 1970දශකයේ සිට ආරම්භ කරන ලද කඩිනම් සංවර්ධන වැඩසටහන් හේතුවෙන් පරිසරය ආරක්ෂාකර ගැනීමේ අවශ්‍යතාවය දැඩිව ඇති විය.මෙම සියලුම පාරිසරික ගැටළු නිරාකරණය කිරීම සඳහා 1980අංක 47 දරන ජාතික පාරිසරික පනත පිහිටු වන ලදී .රටේ සංවර්ධනය පුළුල් කිරීමට හා සංවර්ධනය ස්ථිරසාරව පවත්වා ගැනීමට පරිසරය සුරැකීම හා වැඩි දියුණු කිරීමේ අත්‍යාවශ්‍යතාවය මත 1988අංක 56දරන ජාතික පාරිසරික )සංශෝධන (පනත පිහිටුවනු ලැබීය .මේ අනුව පනතේ iv ඇ කොටසින් ශ්‍රී ලංකාවේ පාරිසරික බලපෑම් ඇගයීම් සම්බන්ධ විධිවිධාන පැහැදිලි කරන ලදී 1993 . ජූනි 24දිනැති අංක 22/772දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් මෙගා වොට් 25ට වැඩි තාපබල ව්‍යාපෘති ,කාමර 99ට වැඩි හෝටල් ,කිලෝ මීටර් 10ට වඩා මහාමාර්ග ,හෙක්ටයාර් 04ට වඩා වැඩි ජල ජීවී වගා ව්‍යාපෘති සහ පාරිසරික සංවේදී ඇළ දොළ ආශ්‍රිතව ඇති රක්ෂිතයේ ,වන සත්ත්ව සහ වෘක්ෂලතා අඥා පනත යටතේ ප්‍රකාශයට පත්කොට ඇති අභය භූමියක සිට මීටර් 100ක් ඇතුලත ප්‍රදේශයක පිහිටා තිබීම වැනි ප්‍රදේශවල ව්‍යාපෘති ආරම්භ කරන අවස්ථා වලදී පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව )EIA) ලබාගත යුතු වේ.

පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව ලබා ගැවීම සඳහා අවුවියෝජිත ආයතන වෙත අවශ්‍ය තොරතුරු ව්‍යාපෘති යෝජිත විසින් ලබාදිය යුතු වේ .තොරතුරුවල නිවැරදිතාවය හා සත්‍යතාවය මත අනුනියෝජිත ආයතන විසින් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව නිකුත් කරන ලබන අතර සෑම විටම මෙම ව්‍යාපෘතීන් සම්බන්ධ තොරතුරු මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබා දිය යුතු වේ 1995 . පෙබරවාරි 32දිනැති අංක 14/859දරන ගැසට් පත්‍රයට අනුව අනුනියෝජිත ආයතනවල ලැයැස්තුවක් ඉදිරිපත් කර ඇත .ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට 1981අංක 57දරන වෙරළ සංරක්ෂණ පනත මඟින් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සඳහා අවශ්‍ය නීතිමය විධිවිධාන හඳුන්වාදෙන ලදී .මේ අනුව ,ශ්‍රී ලංකාවේ ප්‍රථම පරිසර බලපෑම් වාර්තාවක් සකස් කරනු ලැබුවේ මෙම පනත යටතේය .මෙම පනත යටතේ පාරිසරික බලපෑම් ඇගයීමක් කරනු ලැබූ ප්‍රථම ව්‍යාපෘතීන් අතරින් එකක් වනුයේ ත්‍රිකුණාමලයේ ගල් අඟුරු තාප බලාගාරයයි 1988.අංක 56දරන ජාතක පාරිසරික )සංශෝධන ( පනතින් පාරිසරික බලපෑම් ඇගයීම දිවයින පුරා අනිවාර්ය කරනු ලැබූ අතර ,මෙම කටයුතු මෙහෙයවීම පරිසර අධිකාරිය වෙත පවරන ලදී .මූලික අවස්ථා 04ක් යටතේ පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය සිදු වේ .

1. මූලික තොරතුරු පරීක්ෂාව (Screening)

මේ මඟින් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් ලබාගත යුතු ද යන්න ව්‍යාපෘතිය අනුව තීරණය කරනු ලබයි.

2. පරිසර විෂය ප්‍රමාණය කිරීම. (Scoping)
පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් මඟින් අවධානය යොමුකල යුතු මූලික හා වැදගත් කරුණු ආවරණය කර ගැනීම සඳහා සකස් කරනු ලබන මාර්ගෝපදේශයකි.

3. විෂය කාර්යය නිර්ණය කිරීම. (Term of Reference)
ව්‍යාපෘතිය සම්බන්ධ තොරතුරු සරල භාෂාවෙන් ලියන ලද සංරක්ෂිත වාර්තාවක් විය යුතු අතර, මේ සඳහා ව්‍යාපෘති යෝජක විසින් විශේෂඥ උපදේශකයකු මඟින් මෙය සකසාගනු ලබයි. මෙහි විශේෂයෙන්ම යෝජිත ව්‍යාපෘතියේ විස්තර, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට බලාපොරොත්තුවන ප්‍රදේශයේ පරිසර සංවේදීතාවය, මේ මඟින් ඇතිවිය හැකි හිතකර හා අහිතකර බලපෑම්, අහිතකර බලපෑම් අවම කිරීමේ මාර්ග, සාධාරණ හා ප්‍රායෝගික විකල්ප හා පසුවිපරම් වැඩසටහන් සම්බන්ධ තොරතුරු ඇතුලත් වේ.

4. මහජන සහභාගීත්වය
ජාතික පාරිසරික (සංශෝධන) පනතේ 23(ආ)(ආ)(2)(1) උප වගන්තියට අනුව පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් ලැබුණු විට මහජනතාව දැනුවත් කිරීම සඳහාත් සහ එම වාර්තාව අධ්‍යනය කිරීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් එක් භාෂාවකින් ජාතික පුවත්පතක පලකරන ලද දැන්වීමක් මඟින් එම වාර්තාව මහජනයා විසින් පරීක්ෂා කල හැකි ස්ථාන හා වේලාවන් දැනුම් දෙනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳ අදහස් කිසිවක් ඇත්නම් දැන්වීමට මහජනතාවට අවස්ථාව ලබාදිය යුතු බවට පනතේ දක්වා ඇත.

පාරිසරික බලපෑම් ඇගයීම් තුලින් ව්‍යාපෘති යෝජකට සැලසෙන වාසි :-

1. සංවර්ධන ව්‍යාපෘතියේ හිතකර හා අහිතකර බලපෑම් පිළිබඳ අපක්ෂපාතී ඇගයීමක් ව්‍යාපෘතිය සැලසුම් කරන අවස්ථාවේදී ලබා ගැනීමට හැකිවීම.
2. අහිතකර බලපෑම් අවමකිරීම හා හිතකර බලපෑම් උපරිම කිරීම.
3. ව්‍යාපෘතියකට එරෙහිව එල්ලවන විරෝධතාවයක් හා කඩාකප්පල්කාරී ක්‍රියාවන් ඇතිවීමේ හැකියාව අඩු කිරීමට හෝ වැලැක්වීමට.
4. ව්‍යාපෘතිය ආරම්භ කරන ස්ථානයේ පරිසරය පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගැනීම.
5. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාලවන නීතිමය පසුබිම පිළිබඳ හොඳ අවබෝධයක් ලබා ගැනීම.
6. ව්‍යාපෘතියේ අනාගත පැවැත්මට හොඳ ප්‍රසිද්ධියක් හා පිළිගැනීමක් ලබා ගැනීම හා අවබෝධයක් ලබා ගැනීම හා තිරසාර ව්‍යාපෘතියක් ඇති කිරීම.

මේ අනුව පාරිසරික බලපෑම් ඇගයීම් )EIA) වාර්තාවක් ව්‍යාපෘති යෝජක විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවේදී ලබා ගැනීම පාරිසරිකව හා සමාජීය වශයෙන් වාසි සහගත වේ.

# “ශ්‍රම වාසනා අරමුදල” මගින් කම්කරු ජනතාවට සුබසාධනය සැලසෙනවාද ?

-----------------------------------------------------------------------------------

**පසන් මනෝහර**

1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනත හා 2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල් සංශෝධන පනත මගින් බලාත්මක කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින මෙම ආයතනය අංක 97, ජාවත්ත පාර, කොළඹ 05 ස්ථානයේ පිහිටුවා ඇත. පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධන කටයුතු වෙනුවෙන් සහන සැලසීමේ අරමුණින් ශ්‍රම වාසනා අරමුදල ඉහත පනත මගින් ස්ථාපිත කර තිබුණි. මෙහිදී සේවා නියුක්තිකයා යන්නට පෞද්ගලික අංශයේ හෝ රාජ්‍ය අංශයේ සේවය කරන, සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය දරන, කම්කරු ජනතාව අදහස් කරයි. ජාතික ලොතරැයි මණ්ඩලය එක්ව ජාතික සම්පත ලොතරැයි අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට 10ක ප්‍රතිශතයක් මෙම අරමුදල වෙනුවෙන් වෙන්කරනු ලැබේ. ශ්‍රම වාසනා අරමුදල් පනතට අනුව සුබසාධන පහසුකම් සැලසිය යුතු ආකාරය පහත පරිදි වේ.

- සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම
- සේවා නියුක්තිකයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසාදැමූ අවස්ථාවක, ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම
- හදිසි අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම
- සේවා නියුක්තිකයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම
- ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ සැපයීම
- සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම
- කම්කරු කොමසාරිස් ජනරාල්වරයා, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තිකයන්ට නීතිමය සහය ලබාගැනීමට මූල්‍යමය සහන සැලසීම

මෙම අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් අරමුදල් විසින් පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි.

- සෞඛ්‍ය සේවා කඳවුරු පැවැත්වීම
  Health Camp Programme
- දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම
  Awareness Programme
- සුභසාධන වැඩසටහන්
  Welfare Programme
- කෘතිම අත් හා පාද ලබාදීම
- වන්දි ප්‍රතිලාභ ලබාදීම
- කාර්මික අධ්‍යාපනය සඳහා ආධාර ලබාදීම
  Technical Education Aids
- කර්මාන්තශාලාවල සිදුවන අනතුරු සම්බන්ධයෙන් වෛද්‍ය සහය ලබාදීම.
- සේවය අවසන් කිරීම හෝ කාර්මික ආරවුල් සම්බන්ධයෙන් වන නඩු කටයුතු සඳහා නිතිමය සහය ලබා ගැනීමට ආදලව මූල්‍යාධාර සැපයීම
- සේවා නියුක්ත මව හෝ පියා මරණයට පත්වීම හෝ පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වූ පවුල් වෙත දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම
- දුෂ්කරතා සහිත පාසල් වල දරුවන්ට පාසල් උපකරණ ලබා දීම.

ඉහත දක්වා ඇති පරිදි සේවා නියුක්තිකයන් සහ ඔවුන්ගේ යැපෙන්නන් වෙනුවෙන් ආධාර සැපයීමට ශ්‍රම වාසනා අරමුදල සූදානම්ව සිටියද පසුගිය වර්ෂ කිහිපය පුරා සුබසාධන කටයුතු සඳහා අරමුදල අඩු දායකත්වයක් දක්වා ඇති බව පෙනීගොස් ඇත. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම අරමුදලේ සේවාවන් පිළිබඳව කම්කරු ජනතාව ප්‍රමාණවත් පරිදි දැනුවත්ව නොසිටීම නිසා මෙම ප්‍රතිලාභ ඉල්ලුම් කිරීම අවම මට්ටමක පැවතීමයි. නිදසුන් ලෙස අනතුරට පත් සේවා නියුක්තිකයන් වෙනුවෙන් කෘතීම අත් හා පාද ලබාදීම සඳහා 2017, 2018 සහ 2020 වර්ෂවල පිළිවෙලින් රු.මි 3, රු.මි.3.5 සහ රු.මි.4 ක් වෙන්කර තිබුණද ඒ සඳහා වැයවී ඇත්තේ පිළිවෙලින් රු.මි. 0.18, රු.මි.2.5 සහ රු.මි.0 ක් වශයෙන් වේ. එමෙන්ම පූර්ව දැනුම්දීමකින් තොරව ආයතන වසා දැමූ අවස්ථාවලදී සේවය අහිමි වන සේවකයන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට වෘත්තීය අධ්‍යාපනය සඳහා ආධාර ලබාදීම සඳහාද මුදල් වෙන්කර තිබුණද, මේ සඳහා ප්‍රතිලාභීන් ඉල්ලුම් නොකිරීම නිසා එම සුබසාධන කටයුත්ත ඉටුකිරීමට හැකියාව ලැබී තිබුනේ 2018 වර්ෂයේ සිට 2022 දක්වාම පුද්ලයන් දෙදෙනෙකු සඳහා පමණක් ගෙවීමට සිදුවීම ආදිය දැක්විය හැකිය. මේ ආකාරයට ප්‍රතිපාදන වෙන්කලද ප්‍රතිලාභ ඉල්ලුම් නොකිරීම නිසා මෙම සුබසාධන කටයුතු ඉටු කිරීමට අරමුදලට නොහැකිව පැවතිණි.

2018 වර්ෂය සිට ජාතික ලොතරැයි මණ්ඩලය මගින් ජාතික සම්පත ලොතරැයිය විකිණීම මගින් භාණ්ඩාගාරයට අදාල ලොතරැයි ආදායම යවා එයින් ශ්‍රම වාසනා අරමුදලට ලැබුණු ආදායම හා ශ්‍රම වාසනා අරමුදල මගින් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ආයෝජන පොලී

ආදායම හා සුබසාධනය සඳහා දරා ඇති වියදම් පහත පරිදි වේ.

| **වර්ෂය**<br>------- | **ශ්‍රම වාසනා අරමුදලට ලද ආදායම (රු.)**<br>------------------------ | **සුබසාධනය වියදම (රු.)**<br>--------------------- |
|---|---|---|
| 2018 | 63,241,723 | 28,071,637 |
| 2019 | 73,246,457 | 32,556,007 |
| 2020 | 37,302,624 | 8,131,553 |
| 2021 | 34,672,316 | 14,445,075 |

වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් අනුව සුබසාධන වැඩසටහන් සැලසුම් කර තිබුණද ඇතැම් දේශපාලන තීන්දු තීරණ හේතුවෙන් එම අරමුණු ඉටුකර ගැනීම සඳහා අරමුදල අවභාවිතා කරන ආකාරයන්ද පිළිබිඹු වේ. www.svf.gov.lk වෙබ් අඩවියට පිවිස මෙම අරමුදල පිළිබඳ ඔබට වැඩි තොරතුරු ලබාගත හැකිය.

# <u>තොරතුරු කළමනාකරණයේ වැදගත්කම</u>

**ගිවෝන් යානිකා නන්දසේන**

**හැඳින්වීම**

දැනුම යනු මා දන්නා දෙයයි (Knowledge is what I know). තොරතුරු යනු අප දන්නා දෙයයි (Information is what we know) දත්ත ඇසුරින් තොරතුරු ද තොරතුරු ඇසුරින් දැනුම ද බිහි වේ. තොරතුරු යනු සම්පතකි. තොරතුරු සම්පත භාවිතය නිසා අඩුවී නොයයි. තොරතුරු සම්පත වියැකීයන්නේ එය භාවිතයට නොගන්නා කල්හිය. ප්‍රයෝජනයට ගන්නා තරමට එය දළුලා වැඩෙයි. තොරතුරු නිරතුරුව සන්නිවේදනය විය යුතුයි. සන්නිවේදනය හෝ ප්‍රචාරණය වූ තොරතුරු පාදක කරගෙන පර්යේෂණ හා දැනුම හටගනී. නව දැනුම නිසා ලෝකය සංවර්ධනය වේ. තොරතුරු සන්නිවේදනය අඩුවූ විට පර්යේෂණ හා දැනුම ද හීන වී යයි. ආදී කාලීන සමාජයන්හි පැවති පර්යේෂණ හා දැනුම ඌනතාවට ප්‍රධාන හේතුව තොරතුරු සන්නිවේදනය ප්‍රමාණවත් නොවීමයි. අද්‍යතන සමාජ සංවර්ධනයට තුඩු දී ඇති ප්‍රධානතම හේතුව තොරතුරු සන්නිවේදනයේ සීඝ්‍රතාවයි. මේ නිසාම අප අද ජීවත්වන සමාජය දිනෙන් දින තොරතුරු මත යැපෙන හා තොරතුරු පාදක සමාජයක් බවට පත් වෙමින් පවතී.

දැනුම knowledge යන්න ‘epistemenology’ යන ග්‍රීක වචනයෙන් සෑදුනකි. දැනුම ක්‍රමවේදයක් වන අතර ප්‍රධාන කොටස් හතරක් යටතේ විග්‍රහ කෙරේ.

දත්ත → තොරතුරු → දැනුම → ප්‍රඥාව

Data Information knowledge wisdom




දත්ත (Data) යන්න ලතින් වචනයක් වන ‘Datum’ යන්නෙහි බහුවචනය වේ. එහි තේරුම facts යන්නයි. දැනුම යනු මා වටා ඇති දෙයයි. මා සතු දෙයයි (what I have). දත්ත ප්‍රධාන වශයෙන් උදව් කරනු ලබන්නේ දැන් අවශ්‍ය තොරතුරු දැන් ලබා ගැනීම සඳහායි. උදාහරණ ලෙස අද



දිනය කුමක්ද? දැන් වේලාව කීයද? ආදී ලෙසය. දත්ත මගින් facts නියෝජනය කෙරේ.

තොරතුරු (Information) නොඑසේනම් ද්‍රව්‍ය ලෙස ගැනේ. පුද්ගල, ස්ථාන සහ ද්‍රව්‍ය මේ සියල්ල තොරතුරුය. තොරතුරු තුළ දත්ත ගැබ්වී ඇත. දත්ත ද්‍රව්‍යවලටත්, ද්‍රව්‍යවලින් දැනුමත් ලබා දේ. තොරතුරු දැනුම බවට පත් කිරීම සඳහා බුද්ධිය මෙහෙයවා අධ්‍යාපනික කාර්යයන් සිදු කළ යුතුවේ. මෙය ප්‍රායෝගික කර්තව්‍යයකි. මුලු ලෝකයේම ආර්ථිකය හසුරුවනු ලබන්නේ දැනුම කේන්ද්‍රකොට ගෙනය. දැනුම තොරතුරු විප්ලවයේ ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරයි. මෙහිදී ප්‍රයෝජනවත් දැනුමක් ලබා ගැනීම සඳහා බොහෝ මූලාශ්‍ර අතුරෙන් 'නිවැරදි' තොරතුරු තෝරා ගැනීම ප්‍රධාන අභියෝගයක් වේ.

නව දැනුම සොයා ගැනීමත් සමගම එය බෙදා හදා ගැනීම ද (share) කළ යුතු ම වේ. මුලු ලෝකයේ ම ආර්ථිකය හසුරුවන්නේ දැනුම යි. නිදසුනක් ලෙස මෙම වසරේ පෙබරවාරි මාසයේ මැද භාගය දක්වා ම කෝටිපතියන් දහ දෙනෙක් ම ඇමරිකාවේ නිව්යෝක් නගරයේ විසූ අතර පෙබරවාරි තෙවැනි සතිය වන විට එය චීනයේ බීජිං නුවර වී ඇත. මෙයට බලපෑ ප්‍රධාන ත ම හේතුව වූයේ දැනුම් පාදක සමාජයයි (knowledge society).

දැනුම ප්‍රධාන කොටස් දෙකක් යටතේ විග්‍රහ කෙරේ. එනම් ස්පර්ශ කළ හැකි දැනුම (Tacit/Tangible Knowledge) සහ ස්පර්ශ කළ නොහැකි Explicit/Intangible Knowledge) දැනුම වේ. මෙම දැනුම් වර්ග දෙකෙහි ගුනාංග පිළිබඳව සාකච්ඡා කළහොත් ස්පර්ශ කළ හැකි දැනුම - නව සහ සුවිශේෂී තත්ත්වයන් සමග ගනුදෙනු කිරීමක් සහ අනුවර්තනය කිරීමේ හැකියාව තිබීම. එකමුතුව වැඩ කිරීම පලපුරුද්දෙන් දන්නවා. තිබෙන තැන සහ අපේක්ෂා කිරීම සහ ආරක්ෂා කිරීම කළ හැකියි. එසේම එක්මුතුව වැඩ කිරීම, අභ්‍යන්තර දැනුම තුළින් සංස්කෘතිය හැඩ ගැස්වීම, මෙන්ම පළපුරුද්දෙන් ලත් දැනුම මුහුණට මුහුණලා එකිනෙකා අතර බෙදා හදා ගනු ලැබීම, ලියා හෝ පවසා තවත් කෙනෙකුට මාරු කිරීමට අපහසුවීම තව ද මිනිසුන් තුළ ඇති අදහස් ලබා ඇති අත්දැකීම් විස්තර කිරීමට අපහසු ප්‍රකාශ කළ නොහැකි කුසලතා ද මෙහි ඇති ගුනාංගයි. මේ සඳහා නිදසුන් ලෙස බයිසිකල් පැදීම, මෝටර් රථ පැදවීම, පියානෝව වාදනය දැක්විය හැකිය.

ස්පර්ශ කළ නොහැකි දැනුමෙහි ගුනාංග ලෙස- හැකියාවක් තිබේනම් පුහුණු පුරුදු කළ හැකිවීම උදාහරණ ලෙසට බල්ලන් පුරුදු කිරීම. එසේම සංවිධානය පුරාවටම බෙදා හැරීමට නැවත නිපැයීමට සහ නැවත යොදා ගැනීමට ඇති හැකියාව, සංවිධානයේ දැක්ම සහ මෙහෙවර සඳහා හොඳ මෙහෙයුම් මාර්ගෝපදේශයක් කර ගැනීම සඳහා සංවිධානයට ක්‍රමෝපායකට පරිවර්තනය කිරීමේ හැකියාව තිබීම, එසේම යම් නිපැයුමක් ලේඛනයක් මගින් සේවාවන් දැනුම බෙදා හදා ගැනීම මේ අතර වැදගත් වේ. මෙම දැනුම් කොටස් දෙක අව්ධිමත් දැනුම සහ විධිමත් දැනුම ලෙස ද Nickls' පෙන්වා දේ. බුදුදහමෙහි මෙය යෝනිසෝමනසිකාරය සහ පරතෝගෝෂය නමින් ද විස්තර කර ඇත.

දැනුම පහත සඳහන් ලක්ෂණවලින් ද යුක්ත වේ.

- දැනුම භාවිත කරමින් එය පාරිභෝජනය නොකරයි.
- පැවරීම හෝ හුවමාරු කිරීම තුළින් එය අහිමිවන්නේ හෝ නැතිවන්නේ නැත.
- දැනුම බහුල වේ. එහෙත් භාවිත කිරීමේ හැකියාව හිඟවේ.
- බොහෝ සංවිධාන/ ආයතනවල වටිනා දැනුමෙන් වැඩි කොටසක් දවස අවසානයේදී අපතේ යයි.

මෙයට හේතුව දැනුම පිළිබඳව විගණනයක් නොකිරීම බව පැහැදිලිවේ.

අන්තර්ජාලය පැමිණීමත් සමග අසීමිත සම්පත් World Wide Web ($W^3$) දැනුම් සපිරි සම්පත් අපට බොහෝ ලැබී ඇත.දැනුම කලමනාකරණයේදී මනුෂ්‍යයා මූලික වන අතර, දැනුම නිතරම වර්ධනය කිරීම මෙන් ම එය බෙදා හැරීම ද නොඑසේනම් හුවමාරු කිරීම සහ බෙදා හදා ගැනීම ද කළ යුතු ම වේ. එසේ ම දැනුම තුළින්, දැනුම භාවිතය තුළින් සහ නිවැරදි පරිහරණය තුළින් තම ඉලක්කය (wisdom) කරා යාමට මග පාදයි.

### දත්ත කලමනාකරණය (Data management)

සංවිධානයක් තුළ අමුදත්ත (Row data) බොහෝ සෙයින් තම එදිනෙදා කටයුතු සඳහා ඒකරාශී කරනු ලබයි. එම දත්ත මගින් ප්‍රධාන වශයෙන් දැන් අවශ්‍ය තොරතුරු දැන් ලබා ගැනීම සඳහා උපයෝගී කර ගනු ලබයි. අප වටා ඇති දත්ත උපක්‍රමශීලීව සංවිධානය කිරීම දත්ත කලමනාකරණය වේ. දැනුම කලමනාකරණයෙහි ඉදිරි දර්ශනයවන්නේ මෙම දත්ත සංවිධානයෙහි දීර්ඝ කාලීනව භාවිත කිරීම සඳහා කෙසේ සංවිධානය කරන්නේ ද යන්න සෙවීමයි.

### තොරතුරු කලමනාකරණය (Information management)

දත්ත ගොනුවක එක අනු කොටසකි තොරතුරු. තොරතුරුවලට දත්ත convert කිරීම සඳහා දත්ත සාරාංශගත කළ යුතුවේ. ලබාගත් ප්‍රාථමික දත්තවලින් අත්‍යවශ්‍ය වූ තොරතුරු ලබා ගැනීම සඳහා කරනු ලබන උපක්‍රමශීලී ක්‍රමෝපායයකි. තොරතුරු කලමනාකරණය කරන විට නිතරම අපට උපක්‍රමශීලී ක්‍රමෝපාය අවශ්‍ය වේ. වඩා ඉක්මනින් හා වඩා හොඳ තීරණ ගැනීමට කලමනාකරුවන් සක්‍රීය කිරීමට තොරතුරු රැස්කිරීමට එම සංවිධානයේ ඇතුළත සහ පිටත සන්නිවේදන ක්‍රියාවලිය තොරතුරු කලමනාකරණය වේ. තොරතුරු මූලාශ්‍ර එකක් හෝ වැඩි ප්‍රමාණයක් ප්‍රතිග්‍රහනය කරමින් තොරතුරු ලබාගනිමින් අවශ්‍ය අය සඳහා එම තොරතුරු බෙදා හරිමින් සංවිධානයේ ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිල්ල ලක් කිරීම තොරතුරු කලමනාකරණයේ කාර්යයෙහි වැදගත් තැනක් ගනී.

### දැනුම කලමනාකරණය

දැනුම කලමනාකරණයට දීර්ඝ ඉතිහාසයක් ඇත. රැකියා පිළිබඳ සාකච්ඡා, සංසඳ, වෘත්තීය පුහුණුව, පුස්තකාල සහයෝගීතාව සහ ගුරුහරුකම් ලබාදීමට ද විවිධ වූ වැඩසටහන් ඇතුළත් කිරීම ආදිය 20වන සියවසේ මැද භාගයේදී පරිගණක භාවිතය ඉහලයාමත් සමග ම සිදුවී ඇත.

1999 දී පෞද්ගලික දැනුම කලමනාකරණය යන වචනය හඳුන්වා දී ඇත. එයින් අදහස්වන්නේ දැනුම කලමනාකරණය පුද්ගල මට්ටමින් සිදුවී ඇති බවයි. එසේ ම ව්‍යවසායයේදී සිද්ධි අධ්‍යයන ක්‍රියාදාමය සඳහා දැනුම කලමනාකරණයේ වැදගත්කම අවබෝධ වී ඇත. සාර්ථක දැනුම නිර්මාණය, බෙදා හැරීම, සමාජ සහ ආයතනික ඉගෙනුම් ක්‍රියාවලිය කලමනාකරණ උපාය සාර්ථක කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ .අධ්‍යයන ක්‍රියාවලිය වේගවත් කිරීමට සහ සංස්කෘතිය වේගවත්ව වෙනස් කිරීම සඳහා දැනුම කලමනාකරණය බෙහෙවින් බලපා ඇත. කෙටියෙන් කිවහොත් යම් අරමුණක් හා ක්‍රියාකාරී නැඹුරුවක ප්‍රතිලාභ පුද්ගලයින්ට මෙන් ම සංවිධානවලට ලබාදීම සඳහා දැනුම කලමනාකරණ වැඩසටහන්වලට හැකියාව තිබේ. දැනුම කලමනාකරණයේ සංවර්ධන අදියර (Development phases in KM history) පහත සඳහන් පරිදි වේ.

පුද්ගලීකරණය (Personalization) 2000 ++

අතත්‍යකරණය (Virtualization) 1980

පරිගණකගතකරණය (Computerization) 1950

සන්නිවේදනය (Communication) 1900

ප්‍රවාහනය (Traspotation) 1850

කාර්මීකකරණය (Industrialization) 1800

දැනුම යනු ක්‍රමවේදයක් වන අතර ම දැනුම උකහා ගන්නා අයුරු දැනුම කලමනාකරණය යනුවෙන් විග්‍රහ කළ හැකිය. තොරතුරු කලමනාකරණයේ දැනුම ලබා ගැනීමට නම් අතීත සිදුවීම් සමග තොරතුරු විශ්ලේෂණය කළ යුතුවේ.

**දැනුම කේන්ද්‍ර ගත සමාජයක දැනුම කලමනාකරණයේ වැදගත්කම**

මානව සමාජයේ වර්තමාන දියුණු තත්ත්වයට හේතු වී ඇත්තේ මිනිසාගේ බුද්ධිමය ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවන තොරතුරු එසේ නැතහොත් දැනුම පසු කාලීන පරපුරට භාවිතා කල හැකි අයුරින් වාර්තා ගත කිරීමට ඇති හැකියාවයි .අධ්‍යාපනය, පර්යේෂණය, ආර්ථික කටයුතු, දේශපාලන කටයුතු, සංස්කෘතික කටයුතු ඇදී විවධ කාර්යයන් නිසා මානව දැනුමට එකතුවන තොරතුරු මහා ප්‍රවාහයක් බවට පත්ව තිබේමානව සමා .ජයේ තොරතුරු හරහා එන දැනුම වැදගත් ලෙස නොසැලකෙන කිසිම ක්ෂේත්‍රයක් සෙවිය නොහැකපර්යේෂණ හා ප්‍රවර්ධන කටයුතු ., කර්මාන්ත, ව්‍යාපාර, රාජ්‍ය තාන්ත්‍රීය, අධ්‍යාපන හා පුහුණු කිරීම් ආදී මේ කිනම් ක්ෂේත්‍රයකදී හෝ තොරතුරු ලබා ගැනීම, සැකසීම, ගබඩා කිරීම, සමුද්ධරණය හා සන්නිවේදනය යන කාර්යයන් කිරීමට සිදුවේ . සංවර්ධිත රටවල ශීඝ්‍ර දියුණුවට මූලික හේතුවක් වී ඇත්තේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දක්වන විශේෂ සැලකිල්ලයිමේ සඳහා අත්‍යවශ්‍ය මූලික අංගයක් වී ඇත්තේ තොරතුරු හරහා එන . .දැනුමයිමේ නිසා කලක් භාණ්ඩ මූලිකව පැවති සමාජය දැන් ඥාන මූලික සමාජයක් බවට පත්ව ඇත).Knowledge Base Society) භාණ්ඩයක් ලෙස "තොරතුරු" ගතහොත් එහි අගය ක්ෂය වීමක් හෝ වටිනාකම අඩු වීමක් සිදු නොවේ .

නූතන දැනුම කේන්ද්‍ර ගත සමාජයේ සම්ප්‍රදායික පොත පත, සඟරා, පුවත්පත් හා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යවලින් දුන් තොරතුරු ප්‍රවාහය අභිභවමින් ඉලෙක්ට්‍රොනික හා පරිගණක ගත මාර්ගස්ථ මාධ්‍ය ඔස්සේ තොරතුරු උත්පාදනය වෙමින් ශීඝ්‍රයෙන් දසත ප්‍රචාරය වෙමින් පවත්නා බව දැකගත හැකිය . ලොව දසත රටවල්, මහද්වීප, ගම් නියම් ගම් වෙන් කෙරුණු කඩඉම්, දේශසීමා අතුරුදහන් වෙමින් එකම ලෝක ග්‍රාමයක්, විශ්ව ගම්මානයක් බවට පත්ව තිබෙනු පෙනේපරිගණකයත් ., විද්‍යුත් සන්නිවේදන ක්‍රමත්, චන්ද්‍රිකා තාක්ෂණයත් හා එකට අත්වැල් බැඳගනිමින් තොරතුරු තාක්ෂණය අප වසන නූතන දැනුම කේන්ද්‍රගත සමාජය වෙලා ගනිමින් පවතීනූතන තොරතුරු සමා .ජයේ අළුත්ම නැමියාව දැනුම කලමනාකරණය (Knowledge Management) පිළිබඳ සංකල්පය ක්‍රියාවට නැංවීමයිදැනුම නිපදවීම ., එක්රැස් කිරීම හා ගබඩා කිරීම හා සන්නිවේදනය මෙම ක්‍රියාදාමයේ ප්‍රධාන තැනක් ගනී.මෙය ඉතා ඈත අතීතයේ සිටම මානව ශිෂ්ටාචාරය හා බැදී පවතී.

නූතන යුගයේ විද්‍යුත් ජන සන්නිවේදනය මඟින් ලබා ඇති දියුණුවත්, පොත්පත් ප්‍රකාශනය සම්බන්ධයෙන් ලබා ඇති දියුණුවත්, ප්‍රවාහන සේවා අතින් ලබා ඇති දියුණුවත් නිසා විශ්ව දැනුම් සම්භාරය එක් රටකට හෝ එක් ජාතියකට සීමා නොවී සමස්ත මානව වර්ගයාටම අයත් විශ්ව දැනුම්

தேசிய கணக்காய்வுச் சட்டத்தில் பாகம் ஏஇல் குறித்துரைக்கப்பட்ட கணக்காய்வு சேவை ஆணைக்குழுவின் கடமைகள், பொறுப்புகள் தொடர்பாகக் காணப்படும் ஏற்பாடுகள் தொடர்பாக அதை நீக்கி அதற்குப் பதிலாக அவ் அதிகாரங்களை கணக்காய்வாளர் தலைமை அதிபதிக்கு வழங்குவதற்கான சட்ட திருத்தங்கள் இதுவரை மேற்கொள்ளப்படவில்லை. இதன் காரணத்தினால் இச் சட்டத்தின் பாகம் ஏ இல் காணப்படும் சட்ட ஏற்பாடுகள் ஒரு வெற்றுத் தாளில் காணப்படும் எழுத்தாகவே கருதப்பட முடியும்.

கணக்காய்வாளர் தலைமை அதிபதியின் நிதிசார் சுயாதீனத்தை வலுப்படுத்தும் நோக்குடன் கொண்டுவரப்பட ஏற்பாடாக தேசிய பாதீட்டில் சேர்ப்பதற்கு கணக்காய்வுச் சேவை ஆணைக்குழு வருடாந்த வரவு செலவுத் திட்ட மதிப்பீடுகளை குறித்த ஆண்டுக்கு தயாரித்து சபாநாயகருக்குச் சமர்ப்பித்தல் வேண்டும். இருந்த போதிலும், ஆணைக்குழு நீக்கப்பட்ட பின்பு நிதிசார் சுயாதீனம் மீண்டும் கட்டுப்படுத்தப்பட்டு பொதுத் திறைசேரியின் வருடாந்த வரவு செலவுத் திட்ட மதிப்பீட்டில் தங்கியிருக்க வேண்டிய நிலை ஏற்பட்டுள்ளது.

அத்துடன், தேசிய கணக்காய்வு அலுவலகமானது சுதந்திரமாக கணக்காய்வு செய்வதற்கு நியமிக்கப்பட்ட சுயாதீன, தகைமை பெற்ற கணக்காய்வாளர்களின் அறிக்கை தேசிய கணக்காய்வு ஆணைக்குழுவிற்கு சமர்ப்பிக்கப்படல் வேண்டும்.[24] எவ்வாறாயினும், அத்தகைய அறிக்கையை தற்போது யாரிடம் சமர்ப்பிக்க வேண்டும் என்ற விடயம் குழப்பமாக உள்ளது. இது தொடர்பாக சட்ட ஏற்பாடு திருத்தம் செய்யப்படல் வேண்டும்.

இலங்கை அரசியலமைப்பின் ஏற்பாடுகளின் பிரகாரம்[25] பாராளுமன்றமானது பொது நிதிகளின் மீது பூரண கட்டுப்பாடுகளை உடையதாகவிருத்தல் வேண்டும். எவ்வாறாயினும், 20ஆம் திருத்தத்தின் பின்னர் உள்ள தேசிய கணக்காய்வுச் சட்டத்தின் ஏற்பாடுகளில்

---

[23] gphpT 5(2)
[24] பிரிவு 36(3)
[25] அரசியலமைப்பு உறுப்புரை 148

காணப்படும் ஒரு தேங்கு நிலையைச் சீராக்குவதற்கு 20ஆம் திருத்தத்தின் பின்னர் இற்றைவரை பாராளுமன்றம் இச்சட்டத்தைத் திருத்த நடவடிக்கை எடுக்கவில்லை என்பது இங்கு கவனிக்கத்தக்கது.

உச்ச நீதிமன்றமானது தனது யீசழிசயைவழைெ டீடைட [26]தொடர்பான விசேட தீர்ப்பில் சட்டவாக்க அதிகாரம் என்பது, பொது நிதி மீதான முழுமையான கட்டுப்பாட்டையும் கொண்டுள்ளது எனக் கூறியது. அது மேலும் கூறியதாவது, நிறைவேற்றுத் துறையின் அதிகாரத்தைப் பிரயோகிப்பதில் உள்ள முக்கியமான கட்டுப்பாடாக பொது நிதி காணப்படுகின்றது என்றும், அந் நிதியைக் கட்டுப்படுத்தும் அதிகாரம் பாராளுமன்றத்திற்கே உள்ளது என்றும் கூறுகின்றது. அத்தகைய கட்டுப்பாடு 03 பிரதான விடயங்களைக் கொண்டுள்ளது என தனது தீர்ப்பில் கூறியது.

i. நிதிகளின் மூலங்களின் கட்டுப்பாடு – வரி, வீதவரி அல்லது ஏதேனும் அறவீடுகள் விதித்தல் ஊடாக
ii. தொடர்புடைய திணைக்களங்களுக்கும் அரசாங்கத்தின் முகவர்களுக்கும் பொது நிதியை ஒதுக்குதல் ஊடாக கட்டுப்படுத்தல் மற்றும் அத்தகைய செலவினத்திற்கு மட்டுப்பாடுகளை விதித்தல் ஊடாக
iii. மேலே கூறிய (ை) மற்றும் (ைை) விடயங்கள் தொடர்பாகவும் அத்தகைய செயற்பாட்டில் போதிய கவனம் (னரந னடைபைநஉந) தொடர்பில் தொடர்ச்சியான கணக்காய்வு ஊடாகக் கட்டுப்படுத்தல்.

ஆகவே, 20ஆம் திருத்தச் சட்டத்தின் பிற்பாடு உள்ள நிலைமையினைக் கருத்தில் கொண்டு 2018 ஆகஸ்ட் 01ஆம் திகதியிலிருந்து அமுலில் உள்ள தேசிய கணக்காய்வு சட்டத்திற்கு அவசியமானதும் அவசரமானதுமான சட்ட திருத்தங்களை மேற்கொள்வது பாராளுமன்றத்தின் கடமையாக காணப்படுகின்றது என்பது ஒரு வெளிப்படையான உண்மையாகும்.

[26] ளுஊ ளுனு 3 யனெ 4 புக 2008

# Enjoy Your Kopi Luwak

**D.M.J.P. Kumari**



"Kopi Luwak" is the world's most exclusive (and most expensive) type of coffee. This marvelous drink originates from Indonesia, and the main reason that it costs so high is due to its uncommon method of production.

It is produced from coffee beans which have been partially digested by the Asian Palm Civet, and then defecated. Yes, it does sound gross, but not to worry! After digestion, the outer layer of the coffee bean is removed and the beans are completely cleaned before being finely roasted and then distributed to you.

One cup of Kopi Luwak typically costs between $35 and $100 (20 to 60 times more expensive than average coffee). Go and enjoy your Kopi Luwak!





# පස් අවුරුදු නිවාඩුව

ඩයනා නිරෝෂනී



“සුලෝ ඉක්මනට යමු A.G.A සර් කීවෙ හරියටම තුනට රැස්වීම් ශාලාවට හැමෝටම එන්න කියලනෙ.” මිතුරිය වත්සලා දෙවන වරටත් මා හට පැවසුවේ මා මගේ මේස ලාච්චු අස්කර නිමවෙන විටදීමය.
“යමු යමු හදිසියේ මොකද දන්නෑ රැස්වීම. මම උදේ සර්ට කතා කරන්න ගිය වෙලේවත් විශේෂ කාරණයක් ගැන නම් මුකුත් කීවෙ නෑ” මම වත්සලා සමග රැස්වීමට යාමට නැගිටිමින් පැවසුයෙමි.
අප යන විටත් ප්‍රාදේශීය ලේකම්තුමා හැර අන් සියළු නිලධාරීන් රැස්වීම් ශාලාවට පැමිණ සිටියහ.
සංවර්ධන නිලධාරීන් ලෙස සේවය කල මාත්, වත්සලාත් ඇතුළු තවත් උපාධිධාරීන් අට දෙනෙකු රැස්වීම් ශාලාවේ අවසාන පේලියට ආසන්න පේලියක අසුන් ගෙන සිටියෙමු.
ස්වල්ප මොහොතකින් පැමිණි ප්‍රාදේශීය ලේකම්තුමා ගණකාධිකාරීතුමාට හා පරිපාලන නිලධාරිනියකට යමක් රහසින් මෙන් පවසනු අප දුටුවද ඒ පිළිබඳ සිතීමට ඉඩක් නොලැබුණේ මිතුරු කපිල විසින් “මීට පස්සේ ඉතිං සුලෝට මේ වගේ රැස්වීම් වලට නෙවෙයි දෙමාපිය රැස්වීම් වලට තමයි සහභාගී වෙන්න වෙන්නේ” කියා අපට පමණක් ඇසෙන සේ කියා සිනාසෙන්නට වූ බැවිණි.
මේ අතරින් පරිපාලන නිලධාරිනි ශ්‍රීමති මහත්මිය රැස්වීම් ශාලාවේ ඉදිරියට පැමිණ සභාව ඇමතීමට පටන්ගත් විගස මෙතෙක් වෙලා මුණු මුණු ගාමින් සිටි සැවොම නිහඬ වී අවධානය ඉදිරියට යොමු කළහ.
“ප්‍රාදේශීය ලේකම්තුමා, ගණකාධිකාරිතුමා ඇතුළු යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන සියළුම නිලධාරි මහත්ම මහත්මීන්ගෙන් අවසරයි. අද මේ මොහොතේ හදිසි කැඳවීමකට අනුව රැස්වීම් ශාලාවට පැමිණි ඔබ සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගනිමින් මෙම රැස්වීමේ අරමුණු පිළිබඳ තොරතුරු පැවසීමට අප ප්‍රාදේශීය ලේකම් සිසිර ගාමිණී අරඹේපොල මහතාට මා ඉතාම ගෞරවයෙන් වේදිකාවට ඇරයුම් කරනවා. ස්තුතියි” පවසමින් ශ්‍රීමති මහත්මිය ඇයගේ අසුනට ගියාය.
ඒ සමඟම අත් ඔරලෝසුව දෙස බලමින් වේදිකාවට පිවිසි ප්‍රාදේශීය ලේකම්තුමා සභාව ඇමතීමට පෙර රැස්වීම් ශාලාව සිසාරා සිය දෙනෙත යොමුකරන අයුරු සියළු දෙනාටම දර්ශනය විය.
“සුභ සන්ධ්‍යාවක් සියළු දෙනාටම ගණකාධිකාරී වසන්ත අත්තනායක මහතාත්, පරිපාලන නිලධාරිනි ශ්‍රීමති මහත්මියත් ඇතුළු සියලුම සහෝදර කාර්යමණ්ඩලයෙන් අවසරයි. අද විශේෂ හේතුවක් මත පවත්වන්නට යෙදුන මේ රැස්වීම සඳහා පැමිණි ඔබ සියළු දෙනා සාදරයෙන් පිළිගනිමින් මේ මොහොතේ වේදිකාවට පැමිණෙන්නැයි මා ගෞරවයෙන් ආරාධනා කරනවා අප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ

සමාජ සේවා නිලධාරී ලෙස වසර 4 කට ආසන්න කාලයක් සේවය කර අද සිට රජයේ සේවකයන්ට පිරිනැමෙන පස් අවුරුදු වැටුප් රහිත නිවාඩු ලබා සේවයෙන් තාවකාලිකව සමුගන්නා සංවර්ධන නිලධාරිනි සුලෝචනා දීප්ති මුදන්නායක මහත්මියට.''

එක් වරම මගේ නම කියවෙනවාත් සමග මුළු හදවතම ගැහෙන්නට පටන්ගත් අතර කිසිවක් සිතාගත නොහැකිව වත්සලාගේ අත තදකර අල්වාගත් මා දෙස රැස්වීම් ශාලාවේ ඉදිරිපස අසුන්වල වාඩි වී සිටි සියලු දෙනාම පාහේ පසුපස හැරී බලන අයුරු දුටුවිට තවත් ලැජ්ජාවට පත් වුයෙමි.

''යන්න සුලෝ ඔයාට සුභ පතන්න තමයි මේ රැස්වීම අද තියනවා ඇත්තේ'' කියමින් වත්සලා මා දිරිමත් කල අතර අනෙක් සංවර්ධන නිලධාරි මිතුරු මිතුරියන් සියල්ලෝම මා උනන්දු කලහ.

සාරිය සකසමින් වේදිකාව අසලට පැමිණි මා ශ්‍රීමති මහත්මිය පෙන්වූ අසුනේ වාඩිගත්තේ චකිතයෙනි. උදෑසන තේ පානය අවස්ථාවේදී සියලු දෙනාටම කේක් සංග්‍රහයක් පවත්වා මා හෙට දින සිට නිවාඩු ගන්නා බවත්, ඔවුන් සැමොම සුභ පැතුම් එක් කල බවත් හැර මෙවන් සමුගැනීමක් මා කිසිසෙත් අපේක්ෂා නොකෙරුවෙමි.

මා දෙස බලමින් උගුර පාදමින් ප්‍රාදේශීය ලේකම්තුමා නැවතත් කතාව ආරම්භ කරන ලදී.

''ඔව් ඇත්තටම අද අපට සුවිශේෂ දවසක්. මගේ තිස් වසරක රාජකාරි දිවියේ ප්‍රථම වතාවට තමයි මෙවර අතුරු අයවැයෙන් රජයේ සේවකයන්ට විදේශ ගත වීමට හෝ දේශීය වශයෙන් යම් කටයුත්තක නිරතවීම සඳහා පස් අවුරුදු නිවාඩුවක් ලැබෙන්නේ.''

''ඉතිං ඒ අවස්ථාව මුලින්ම ලබා ගන්නේ අපේ සමාජ සේවා නිලධාරිනි ලෙස සේවය කල මේ සුලෝචනා මහත්මියයි.''

''ඇය ඇගේ වසර දෙකක් වන නිවුන් දරුවන් දෙදෙනාද රැකබලා ගනිමින් ඇගේ මවගේ වියෝවෙන් පසු වසා දමන ලද මව විසින් පවත්වාගෙන ගිය පෙර පාසල දිවා සුරැකුම් මධ්‍යස්ථානයක්ද බවට නවීකරණය කරමින් ලබන සතියේ සිට ආරම්භ කිරීමට සියලු කටයුතු සංවිධානය කර ඇති බව අද උදෑසනත් මා හට පැවසුවා, ඒ වගේම ඒ මොහොතේ ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වන මෙන් මගෙන් ඉල්ලීමක්ද කලා.''

''ඒ වගේම අපේ පරිපාලන නිලධාරිනිය මා සමග කියා සිටියා සුලෝචනා මහත්මිය පූර්ව ළමාවිය අධ්‍යාපනය සම්බන්ධව සති අන්ත පාඨමාලාවක් විවෘත විශ්ව විද්‍යාලය මහනුවර ශාඛාවෙන් හැදෑරූ බව''

''තවත් කාරණයක් තමයි මට ගණකාධිකාරීතුමා පැවසුවා මේ පස් අවුරුදු නිවාඩුවේදි තමන්ගෙ විශ්‍රාම වැටුප් දායක මුදල්, ණය වාරික, සුදුසු පරිදි අදාල ආයතන සමග සාකච්ඡා කර වාරික ලෙස ගෙවිය හැකියාව තිබියදි සුලෝචනා ඉතිරි කරගත් මුදල් වලින් වර්ෂ පහක් සඳහා ඒ සියලු වාරික මුදල් බේරා නිරවුල් කරපු බව''

''ඉතිං මම මේ අවස්ථාවේ ඒ කාරණා සම්බන්ධව බොහොම සතුට පලකරනවා. එකක් සුලෝචනා තමන් කරන්න හදන කාර්යයට සාධාරණයක් කිරීමට ඒ පිළිබඳ සුදුසුකම් සපුරාගත් එකට''

''අනික් කාරණය තමන්ගෙන් අයවිය යුතු ණය වාරික දායක මුදල් සම්බන්ධව අනාගත ගැටලු ආයතනයටත්, ඇපකරුවන්ටවත් ඇති නොකර සියල්ල කළමනාකරණය කිරීම සම්බන්ධව''

''ඒ වගේම මේ අවස්ථාවේ මම ඉල්ලා සිටිනවා ඉදිරියේදීත් මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කවුරුන් හෝ මේ පස් අවුරුදු නිවාඩුව අරගෙන විදේශ ගත වීමට හෝ දේශීයව යම් කටයුත්තක නිරත වීමට බලාපොරොත්තු වෙනවා නම් ඒ සඳහා හොඳ සැලසුමක් සහිතව කටයුතු කරන්නය කියලා''

''අද මේ රැස්වීම පැවැත්වීමේ සුවිශේෂම කාරණය තමයි, අද දහවල් මට සමාජ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමිය කතා කලා. ඇය පැවසුවා විශේෂ අවශ්‍යතා සහිත අවුරුදු 18 ට අඩු ළමයින් සම්බන්ධව මහනුවර දිස්ත්‍රික්කයේ කරපු සංගණනයකින් අපේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සීමාව තුල සිටින සියළු ආබාධිත දරුවන් ඒ දරුවන්ට සුදුසු පාසල්වලට යොමුකර ඇති බවත්, පාසල් යන වයස් සීමාව පනින ලද සියලුම තරුණ දරුවන් විශේෂිත වෘත්තිය පුහුණු පාසල් වලට යොමුකර ඇති බවත්, ආබාධිත දරුවන් සිටින පවුල්වල මව්වරු හට ස්වයං රැකියා පාඨමාලා වලට යොමු කර ඇති බවත්.''

''ඉතිං මහනුවර දිස්ත්‍රික්කයෙන්ම මේ කාරණා සම්බන්ධයෙන් සියයට සියයක ප්‍රතිඵල අත්පත් කරගෙන තියෙන්නේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නිසා ඒ උදෙසා පිරිනැමෙන ඇගයීම් සහතික උත්සවයට මේ සිකුරාදා තියෙන බවත් ඒ සඳහා වන උත්සවයට සමාජ සේවා නිලධාරි සමග පැමිණෙන ලෙසටත් ආරාධනා කලා. ඉතිං ඇත්තටම මේ ගෞරවය අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මේ ගෞරවය ලබා දුන්නේ මේ සුලෝචනා මහත්මිය බව මම ඔබ සැම ඉදිරියේ ප්‍රකාශ කර සිටිනවා. ඇය කාර්යාලීය දිනය හැර අනිත් හැම දිනකම

ක්ෂේත්‍ර රාජකාරීවල නිරතවෙමින් අදාළ නිවෙස් කරා ගොසින් පුද්ගලිකව මහන්සි වී ඇගේ රාජකාරි ය හරියටම කරන නිලධාරිනියක් බව කීප දෙනෙක්ම මීට පෙරත් මට පවසා තිබෙනවා.''

මේ තොරතුරු ප්‍රාදේශීය ලේකම්තුමා පවසන විට මට සිහිවූයේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ සේවය කරන විශ්ව විද්‍යාලයේ මගේ හොඳම මිතුරිය කාංචනා පෙර දින හවස මා සමග මේ තොරතුරු පැවසූ බවය. එහෙත් මා කිසිවකුට ඒ බව ප්‍රකාශ නොකලේ කැපවීමෙන් මා සේවය කළේ කිසිඳු ප්‍රශංසාවක් බලාපොරොත්තුවෙන් නොවන බැවිනි.

මගේ සිතිවිලි දැහැන බිඳුනේ නැවතත් ප්‍රාදේශීය ලේකම්තුමා සභාව අමතන්නට වූ බැවිනි.

''ඉතිං මේ රැස්වීම නිමා කරමින් සුලෝචනා මහත්මිය කරන ලද සේවයට නැවතත් ප්‍රශංසා කිරීමටත්, හෙට දින සිට නිවාඩු ලැබුවත් සිකුරාදා දින අදාළ උත්සවයට පැමිණෙන ලෙසත් ආරාධනා කරමින් ඇයගේ පස් අවුරුදු නිවාඩුව නිම කර එන විට මා විශ්‍රාම සුවය විඳිමින් සිටියත් මේ වගේම ඉහල සේවයක් මහජනයාට ලබා දීමටත් හැකිවේවා යැයි මා ප්‍රාර්ථනා කරනවා. සියලු දෙනාටම ස්තූතියි.''

එක්වරම සියලු දෙනාම අත්පොලසන් නාදය පලකරන්නට වූ අතර මමද ඊට එකතු වූ නමුත් සංවේදී වූ මගේ හදවත සිහින් ඉකිබිඳුමක් බවට පත්වීම පාලනය කරගත නොහැකි විය.

''සුලෝ, සුලෝ...... මොකද මේ අත්පුඩි ගහ ගහ අඬන්නේ.... නැගිටින්න. උයන්නත් තියෙනවා අද ඔයා ඔෆිස් යන දවස නේද?''

ඒ මගේ සැමියා නලින්ය. ජාතික විගණන කාර්යාලයේ සේවය කරන ඔහු මේ දිනවල පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධි පාඨමාලාවකට පාන්දර තුනට පමණ අවදි වී පාඩම් කරන අතර මා අවදි කර ඇත්තේ මෙතෙක් වේලා මා දුටු සිහිනයෙන් මුදාලමිනි.

තෝන්තු වූ මනසින් හා ගතින් යුතුව දරුවන් දෙදෙනාට උණුසුමට කොට්ට තවත් ලංකරමින් පොරෝනාද සකසා මා ඇඳෙන් බැස්සේ සැමියා දෙස බැලීමට ලැජ්ජාවෙන් මෙනි.

මුහුණ කට සෝදා කුස්සියට පැමිණි තේ සාදන අතර කුස්සියට පැමිණි නලින් මගේ මුහුණ දෙස විපරමින් බලමින් ''මොකද සුලෝ උනේ, අත්පුඩි ගැහුවේ. සතුටකට උනාට, ඇඬුවේ දුකකටනේ මොකක්ද හීනෙන් දැක්කේ...'' ඇසුවේය.

''නෑ නෑ මොකුත් නෑ නලීන් කියා තේ කෝප්පය පිළියෙල කර දුන් මා දෙස නැවතත් බැලූ නලින් ''මේ දවස් ටිකේම ඔයා මොනවාහරි ලොකුවට කල්පනා කරනවා මොකක්ද ප්‍රශ්නේ, ඔෆිස් එකේ ප්‍රශ්නයක්ද,'' ඇසුවේ අමානාපයෙන් මෙනි.

''එහෙම මොකුත් නෑ අනේ'' කියූ මම ඔහු අතට තේ එක දෙන ගමන් පස් අවුරුදු නිවාඩුව ගැනීමට මෙතෙක් මනසින් කරන ලද සියලු සැලසුම් නලින්ගේ පශ්චාත් උපාධිය නිමවන ලබන සතියේම පැවසීමට සිත තද කරගත්තෙමි.

''ඔයා මොකක් හරි මට හංගනවා සුලෝ...... ලබන සතියේ ඔඩිට් එකකට යටිනුවර A.G. ඔෆිස් ආවාම මට කපිලව, වත්සලාව හමුවුනාම මම දැනගන්නම්කෝ....'' කියා නලීන් තේ එක රැගෙන පාඩම් මේසයට ගියේය.

උදෑසනම සිත් වල අසතුටත් සමග දවස ආරම්භ කිරීම හොඳ කටයුත්තක් නොවන බැවින් මම සහල් සෝදන අතර සැමියා දෙස බැලිමි.

''ඔයාගේ විභාගෙ ඉවරවෙනකම් නිහඬව හිටියේ. මම මේ දවස්වල හිතෙන් සැලසුම් කර කර හිටියෙ දැන් රාජ්‍ය සේවකයෝ රටට බරක් කිය කිය හැමතැනම කතා වෙන නිසා අර පස් අවුරුදු නිවාඩුව අරගෙන අම්මා වහපු මොන්ටිසෝරිය කරන්න.'' මම කීවෙමි.

''හයියෝ..... සුලෝ..... රාජ්‍ය සේවකයයෝ රටට බරක්! ඔයාට පිස්සුද, අන්න ඊයේ රෑ නිවුස් වලට කීවා 40 වෙනි රාජ්‍ය ඇමතිත් හෙට උදේ දිවුරුම් දෙනවා කියලා...'' කියමින් නලින් මහ හඬින් අත්පුඩි සලා සිනාසුනි.

''අම්මා.... අම්මා.... යයි නිවුන්නු දෙදෙනාගෙන් ඒ හඬන්නේ චූටි පුතාය. නලින්ගේ සිනාවට චූටිපුතා අවදි වී ඇති බවත්, ඊලගට ලොකු පුතාද අවදිව අඬන බවත්, තව පැයක් පමණ යනතුරු ඔවුන් දෙදෙනා සමග ඇඳේ ගතකර නැවත නිදිකරවීමට සිදුවන බවත් ඒ නිසා ආහාර පිසීම පමාවන බවත් හැගී මට දුක කේන්තිය සියල්ල උපන්නේ මගේ පස් අවුරුදු නිවාඩු සිහිනය බිඳුනාට වඩා දුකකිනි....

# කවි සිතුවිලි

## අත්තම්මාගේ කවිය

අවුරුද්දට මහගෙදරට නෑගම් ආ ලොකු දෝණී
අම්මා ගේ දෙපතුල වැඳ කීවා මේ ලෙස දුකෙනී
ළමයින්හට උගන්වන්න ගමේ ඉඳන් බැරි බැවිනී
මුළු පවුලම ගම හැරදා නගරෙට යනවා මව්නී

ළමයින්ගේ අනාගතය හැමදේටම ලොකු බැවිනි
අම්මා හිස සොලවා ඉන් කැමැත්ත දුන්නා සොවෙණී
නෙතේ කඳුළු සඟවා ගෙන කීවා ඇය මේ ලෙසිනි
අවුරුද්දට මා බලන්න ආවොත් ඒ ඇති දෝණී

කාටත් නොදැණෙන විලසට කාලය ඇත පියමං වී
මුණුබුරු මිනිබිරියන් මැද අත්තම්මා ඇත කුදුවී
අවුරුද්දට හැදූ ඇගේ රසමසවුළු විඳ තොස්වී
දෙපතුල ලඟ වැටී මෙලෙස කීවා හැමදෙන රැස්වී

ජීවත්වන්නට මෙරටෙහි තවදුරටත් බැරි බැවිනී
රට හැරදා වෙන රටකට යනවා අපි හෙට මව්නි
තාක්ෂණය හරි දියුණුයි නැත කිසිවක් දැන් දුරිනි
දුක සැප නිති විමසිය හැක දුක් ගන්නට නැත කරුණී

දරුවන් හට සිල්ප දෙන්ට විදි දුක් ගැන දුක සිතුනි
අක්මුල් සිඳි සිය පරපුර අහසේ පාවෙනු දැණුනි
දෙන්නට පිළිතුරක් නැතිව අම්මාගේ හිත තැවුනි
දැරිය නොහැකි තනිකම දුක් කඳුලක් වී බිම වැටුනි

**ජී.ඒ.එම්.අයි. ගුණරත්න**

**<u>තේ දල්ලෙ පිනි බිංදු</u>**

දළු අස්සෙ දිස්නෙ ගහමින් තිබුණු දිය බිංදු
දැක්කාම හිතුනෙ පිනි කියලමයි
ලෙච්චමිගෙ ඇස් අස්ස ඉදිමුනේ කලුවෙලා
පිනි වගේ කඳුළු බිඳු වැටිලමයි
අම්මටයි, අප්පටයි පෙනෙන්නට තිබුණාට
අසරණයි උන්, පිහිට නැතිවමයි
හැමදාම හිරු අරං ආව දින ගෙවෙනකම්
එලිපත්ත රත්වුනේ ඒකමයි

කංකානි වගෙම ඔච්චම් කරන තරුණයෝ
වත්තෙ තව කොයි තරම් හිටියමුත්
ඒ හැමෝටම හීන විතරමයි තිබුණෙ නම්
හරි ගියේ නැති කවමදාකවත්
ලැයිම් පේලියෙ හිටපු පොඩි එවුන් ඉඳ හිටක
වත්තෙ ඉස්කෝලෙ පස් පැගුවත්
එකෙක්වත් නැහැ නේද දොස්තරෙක් තියා කොන්-
දොස්තරෙක් වෙන්න තව හිතලවත්

රෑ තිස්සෙ සීතලේ ගුලිවෙලා ඇලවුනත්
නින්ද යනවා හොඳට එච්චරයි
කර පාන් වාටියයි, කහට තේ කෝප්පෙයි
බඩ පිරෙනකං බොන්නෙ වතුරමයි
තේ කූඩෙ පිට බැදං දළු ටිකට ඇස් යොමං
හවස් වෙනකම් පිරුණෙ කූඩයයි
පාරෙ පියඹන එකෙක් රවට්ටල විරිත්තා
ගත්තෙ පිංතූරයක් විතරමයි

කන් දෙකම හිල්වෙලා රත්තරං ගුලි දෙකක්
එල්ලිලා තිබ්බදෝ ඇහුවනේ
කඩන දල්ලෙන් හදන වතුරවත් බොන්න නැති
අපිට එල්ලන්න රන් නැතුවනේ
අම්මටයි අප්පටයි කන්නවත් නැතුවාට
අවුරුද්ද ගානෙ අපි එල්ලුනේ
දෙලොවටම වැඩක් නැති මෙහෙව් පව් කාර උං
පොලොවටත් බරද මගෙ දෙයියනේ

**රම්‍යා ලාලනී**

## <u>රිලාහාමි කී කවි</u>

අඹ දඹ නොයෙක් ගහකොළ පිරුණු මේ රට
දමායන්න වෙනවලු හෙට දින අපට
පෙර කල අපේ මීමුත්තෙක් කල ලෙසට
වලිගෙට ගිණි තබා ගමු? මොළ පෑදෙන්ට

වනරජ දහනෙ අපි මතකද සැප වින්දා
එය නැතිවුනේ මුන් කැළයට ආ හින්දා
කන්ට බොන්ට දී ගේ ළඟටම කැන්දා
හොර නාමයක් අපගේ පිට පට බැන්දා

අගහිග කලට වෙන රටකට පනින්නට
අපහට බැරි මොකද එය හැකිනම් උන්ට
වෙන යම් දෙයක් නැතිදෝ මෙහි විකුණන්ට
හුරුවෙමු අපිත් දේසේ හැටියට ඉන්ට

මුහුදු සේද මාවතෙ යමු නැව් නැගලා
බැරිනම් ඉන්ට ආපසු අපි එමු හැරිලා
ටිබැටය, නේපාලේ අතරින් රිංගාලා
හිමාලෙට පනිමු පරපුර ගැන දුර හිතලා

**ජී.ඒ.එම්.අයි. ගුණරත්න**

**ජනහද තුළ අපි ඉන්නා තැන**

එක් දවසක
නඩු කටයුත්තකට
ගියා මම උපරිමාධිකරණයට
අහවර වී නඩු කටයුතු
පැමිණෙන්නට ඔපීසියට
ගොඩ වීමට වාහනයට
ආවා බෝගහ යටට
එන විට ඉදිරියට
කාර්යාලයේ වාහනය
තිබුණා ඉදිරියෙන් ප්‍රදර්ශනය කොට
"ජාතික විගණන කාර්යාලය"
ගොඩ වන විට වාහනයට
ඇසුණා හඬක්
"most important department"
ඇය ජ්‍යෙෂ්ඨ නීතිඥවරියක්
"thank you mam"
පෙරලා තුති පුද කළා ඇයට
දැනුනා සියුම් ආඩම්බරයක්

**කාංචනා ලියනආරච්චි**

**<u>පොත්පත් කියවීමේ අගය</u>**

කියවීම පොත්පත්
අහරකි සිතට රසවත්
ගොඩ නඟන්නට රටක් යහපත්
පොතයි අවියට වඩා බලවත්

අත රුදුණු පොත්පත්
තනයි මතු පරපුරක් දැනුවත්
සිතිවිලි වලින් පොහොසත්
අයට නැත දුක් පෙතිවලින් මත්

අළුත් දේ ගැන දැනුවත්
නොවුනහොත් හෙට නොවේ යහපත්
ධනය රුස්කර වුවත් පොහොසත්
පලක් නැහැ හුරු නොමැතිනම් පොත්

පොතට නැඹුරුවූ නෙත්
කථා කර කර ඉන්ඩ නොකැමැත්
වචනයෙන් වන විපත්
වලක්වයි කියවීම යහපත්

පොතක පිටු අතරත්
එහි ඇති පේළි අතරත්
මෙතෙක් හමු නොවූ තවත්
චරිත ඇත එය ඔබට වැදගත්

පෙර කල විසූ සතිමත්
අය ලියූ ඒ පොත්පත්
නොකියුවේ නම් තවත්
ගල්යුගෙයි අප තවමත්

කියවනු පිණිස පොත් පත්
යුතුය ඒ දෙය බොහෝ රසවත්
වඩවා රැචිය මන් මත්
රුදේවා! හැම අතම පොත්පත්

**ජී.ඒ.එම්.අයි. ගුණරත්න**

**<u>මට බයම දේ දූවේ</u>**

හඳ වටේ චලිත වන පෘථිවිය ඉලිප්සාකාර කක්ෂය
නෑ මමය පරිධිය දූවේ නුඹ මධ්‍ය ලක්ෂය
තුරු පත්‍ර එකින් එක හෙළුවාට අනවරත කැලැන්ඩර් වෘක්ශය
කවකටු බෙදුම් කටු ප්‍රස්ථාර අදත් මා අතීතේ තබන්නට දක්ෂය

පසු කර යා යුතුය නුඹ, මා සිටින මේ ශුන්‍ය අක්ෂය

බංකුවෙන් බංකුවට මාරු වෙන පෙම් කතා,මල්කතා රොත්තය
අපි වුණත් ගත්තේම හැමදාම සුගත් ගේ ධනුක ගේ පැත්ත ය
අත්දැකීමෙන් කියමි දූවේ මේ කවුරුවත් නොකියනා ඇත්ත ය
දම්මිලා කෑ වෙරළු ඇත්තටම පෙනෙනවා වගේ නොව තිත්ත ය

වැඩියෙන්ම වටින්නේ අතු අගක නෙළන්නට අමාරුම ඉත්ත ය

දනිමි නුඹ යන දෙපස මලෙවිගේ මිහිරි ඉඟි පෑමය
අවවාද දුන්නාට බිඳිනු යුතු නෑ ගෙදර සාමය
එලිපත්ත ඉඹිද්දී නැති කමේ බැරි කමේ දාමය
පැල දොර කඩා යයි මහා පොදු සාධකය,ප්‍රේමය

මට බයම දේ දූවේ අතීතය යළිත් ලියැවීම ය

**මේඛලා උදාරි ලියනගේ**

**<u>හිතුවක්කාර සුළඟ</u>**

කඳු මුදුන් වල දැවටෙමින් හිඳ
සීත පින්නට සිත තෙමාගෙන
ජීවිතය කළකිරුණු ගානට
පාවෙලා යයි මුදු සුළං පොද

ගිරි දුර්ග මැද හැපී වැටෙමින්
අපමණවූ දුක් ගැහැට විඳ විඳ
චණ්ඩ වෙස් ගත්තාට මොහොතින්
නිසල වේ දැහැනකට සම වැද

වසන්තයෙ පිපි සොඳුරු මල් දැක
සම වැදී උන් දැහැන බිඳුනම
තුරුලු කර ආදරෙන් සනසා
යන්න යනවා මල් සුවඳ ගෙන

**ගිවෝන් යානිකා නන්දසේන**

**මුම්ටාස් මම - 2022**

හිතේ හංගං කොහොම ඉවසං
හිටියාද මට සැකත් හිතුනා
නුඹෙ හිතේ මට ආලයක් නං
තිබුනෙ නැති බව හුඟක් දැනුනා

පුරාජේරුව ලොවට පෙන්නපු
නුඹෙ හිතම රවටාන තිබුනා
ටජ්මහල් වට බිත්ති තාමත්
පුදුමෙ පුපුරා නොවැටි තිබුනා

නිමක් නැති කරදරද කෙනෙහිලි
වලිනි මගෙ මුළු කාලෙ ගෙවුනේ
හිතේ නැති ආලයක් ගැන මම
කොහොම පවසමි, නුඹේ වරුනේ

ගැහැණු හැමදා මුළු හිතින්මයි
ආදරෙන් පිරිමින්ට බැඳුනේ
රුවයි සුවඳයි කියා නෙලුවට
මලක ගුණ ටික දොහයි රැඳුනේ

නුඹගෙ ආලෙට මිලක් දීලා
ලෝක පූජිත වැඩක් හැදුවට
සාජහන් නුඹ පැරදුනා මේ
මුම්ටාස්ගේ ප්‍රථම ප්‍රේමෙට

සත්‍ය දිනනා දිනක් ඒවිද
පේන්නෙම පරකාසෙ ලෝකෙට
සුන්දරම ආදර කතන්දර
තිබුනෙ ගීවල, ලියපු කවියට

**රම්‍යා ලාලනී**

**<u>ගව් යොදුන් දුර පැමිණි මව් සෙනේ</u>**

කසාවත දරන්නට "මදි" වීම
දැවුණු කළු වැදිරියට සම වුනැයි
පෙම් වදන් දෙසූ මුවින් පැවසීම
කව් කියා සී මැදුරු කවුළුවෙන්, හිමි බලා කඳුළු සැඟවීම
ඔව් එදා සිට අපිට හිමි වුණේ ඉවසීම තවත් ඉවසීම

මතු සැපය මිරිඟුවකි, දැන දැනම
අද කතර ඇවිදීම
ළැම ඔලුව දැවි දැවී ගැල් සියක
බර තනිව ඉහිලීම
කුල ගෙයක් නොබිඳවා, මඟ නොහැර දරු පැටව් ඉගෙනීම
සබඳ,නුඹ පහසු යැයි හිතුවාද?
සැහැසි රතු ඉරක් සැනසීම??

වෙදැඟිල්ලෙ විලංගුව ලා තුටින්
පියාපත් සිඳලීම
වැටි වැටී ගත් අකුරු වත්කමම
අල්මාරියේ සැඟවීම
හැඳිමිටේ නුවණ ගැන හැමදාම
අවලාද ඉසිලීම
සබඳ ,නුඹ පහසු යැයි හිතුවාද,
ඉදිකටුවටත් අත පෑම

ගින්දරෙන් පණ පෙවුණු යකඩ පෙති තිබුණත් ,
මලක් නම් මෙලෙක ය
උන්ට වුව වැරදුණේ හැමදාම
බඹර තුඩු දැලකය,
නැතිනම් ලැගුම් හලක ය
කළල් දිය බදාගෙන සොඳුරු මල් පුබුදුවන කුලකය
නුඹ වුනත් උපදින්න ඇත්තේම
"වැඩි පංගුවක් පුතුට" පැලක ය

**මේබලා උදාරි ලියනගේ**

**<u>හඬන අහස</u>**

පුරා හඳම වසාගත්තු
සේද වලා ඉරාගත්තු
තරු එළියත් නිවාගත්තු
අහසකි අද හඬාගත්තු

අඳුරු වලා ගටාගත්තු
විජ්ජුලතා මවාගත්තු
රුදුරු වෙසක් වෙලාගත්තු
අහසකි අද හඬාගත්තු

දුකටම හිත රිද්දගත්තු
සුසුම් හෙලා ඇවිලගත්තු
මොර සූරණ කඳුළුගත්තු
අහසකි අද හඬාගත්තු

ගහ කොල වැල් අඹරගත්තු
සුළි කුණාටු වැතිරගත්තු
හිවුඩු සීත තවරගත්තු
අහසකි අද හඬාගත්තු

**ගිවෝන් යානිකා නන්දසේන**

**විරාගය**

පිදුවත් සෙනේ බාලේ සිට දයාවෙන්
හිටියත් පතිනි කරගන්නට මුලාවෙන්
හිතවත් සරෝජිණී මට වාසනාවන්
පැතුවත් එලක් නෑ ඈ හැර ගියාදෙන්

හැදුවේ කුඩා කල සිට දැඩි වෙනා තුරු
බැලුවේ නුඹේ ලෝකය බබලනා තුරු
පැතුවේ සෙනේ මගෙ ඇස් පියවෙනා තුරු
සිතුවේ නුඹ මගෙයි දිවි පවතිනා තුරු

කාලය විරාගය සොයමින් ලුහුබැන්ද
යාමය සොඳුරු ආයෙත් ඒවිද මන්ද
ආලය නිසා දහසක් කරදර වින්ද
ප්‍රේමය මම බතී, වියපත් අරවින්ද

**රම්‍යා ලාලනී**

**<u>අසම්මතයක් නොවෙයි නුබ මට........</u>**

සොඳුරු දවසක දෙනෙත බැඳිලා විඩාබර සුසුමක්
හෙලා අවසන් කළ හැකිද දුක ගැළු නෙතු කඳුළක්
බදාගෙන මට රස විඳින්නට එපා එක මොහොතක්
අනේ හැකිනම් හෙළනු මැන පෙර සේම හසරැල්ලක්...........

කියූ වදනක සැනසුනා හිත පෙර සේම දවසක්
අදත් නුබෙ හඬ අසන්නට මට නොමැත ඉවසිල්ලක්
හිතේ දහසක් පැතුම් සඟවා නොකීවට රහසක්
සොඳුර කෙලෙසක වුවත් දෛවය නුබව මට මැණිකක්........

නුබත් තැනකය මමත් තැනකය ගෙවෙන මුත් දවසක්
විඩෙන් විඩයට නුබව සිහිවෙයි නැහැනෙ සැනසිල්ලක්
හිතින් තුරුළුව නුබේ තොල් පෙති සැණසුවත් මොහොතක්
අසම්මතයක් නොවේ නුබ මට හදවතේ පැතුමක්............

**අසංක උදය කුමාර**

## නිල් කටරොළු

දිනයක පෙර ඔබ දුටු විට
දැනුනේ හුරු පුරුදු විලස....
ආගන්තුක මගේ සිතට
ඔබ ආවේ හෙමි හෙමිහිට....

නිල් කටරොළු මලක පැහැය...
ගත් නුඹෙ ඔය දිලෙන දෑස...
වඩවයි මගෙ මියුරු සිහින...

මැදි කර නුඹෙ සුමුදු නයන...

මගේ සිහින නුඹ මැදිකර
ඇන්දා මං නෙක හැඩයට...
සීගිරි බිතු සිතුවම් මැද
ඔබ සිටියා හරි පැහැයට...

දිනයක නුඹ සමග එකට.....
දුව පැන ඇවිදින පුතු දැක...
දැනුනා මට වැටුණු විලස
උස් බිමකින් මහ පොළවට....

නුඹ ගැන මැවු සොඳුරු සිහින
සිහිගිරි ගල මුදුනට නැග...
ගුලි කරලා අහස් ගැබට...
දෑස පියා ගතිමි තදට .....

**කේ. කේ. එල්. රසංගිකා**

**පාරමිතාවක්.......!**

වෙහෙසයි ජීවිතය... මෙතෙක් ආ ගමන් මග..
හතිවැටුණ ගතට,  කළකිරුණ සිතට... එකම පිළිසරණ ඔබයි !
ඇවසියි නිමා කරන්නට මේ විඩාබර දිවි මග... ඇත් වී අකාරුණික හදවත්වලින්,
විරාමය ලද සැණින්, අසන්නෙමි ඔබේ දෙසුමක්..
නිවී යයි සිත මෙන්ම ගතත් මොහොතකට..
ඇසෙනවිට එ සුමිහිරි දම් දෙසුම.....නැගෙයි නෙතට කඳුළක්..
අසමින් පැණයක් මසිතින්ම..
එදවස... කොහිද සිටියෙ මා ? දම් දෙසද්දී ඔබ බරණැස මිගදායෙ..
නොඇසුණිද.. මට  එකදු බණ පදයක්..
මග ඇරුණෙ ඇයි ..මට ..එ ගෞතම බුදු සසුණ ?
කම් නැත...පුරනෙමි පාරමිතාවක් ..මෙත් බෝ සමිඳුණේ...!

ලබන්නට උතුම් මිනිසත්බව ..ඔබගෙ සසුනෙදිත්.......
මිදී මෙඅසත්පුරුෂ ඇසුරින්.....කරන්නට පින් දහම් මට අවැසි අයුරින්..
බිහි කරන්නට පුත් රුවනක් ඔබගෙ සාසනයට...
අසන්නට.. සුමිහිරි බණ පදයක් ඔබගෙ සසුනෙදිවත්...
අවසන....
පුරන්නට මහණදම්... එතෙර වන්නට මෙසසරින්...
බලා හිඳිමි මම කල්පයක් වුව..
වඩිනු මැන මෙත් බෝ සමිඳුණේ.....
විවර කර දෙන්නට අමා මහ නිවන් දොරටුව.

**පද්මි බාලසූරිය**

**<u>මතක සිහින සහ ප්‍රාර්ථනා</u>**

රෑ මැදියෙම පාලු කපන කණාමැදිරි සකි
නිවාදමාපන් නුබලගෙ දැල්වෙන ඔය එළි
මුහුණ වසා දෑත් වලින් වලකාලනු බැරි
සඟවාලන්නට ගලාහැලෙන නෙතගේ කඳුලැලි

සඳ නැති රෑ තනි යහනෙහි ඇගෙ රුව සිහිවී
හද නැවතී  කම්පිත වී නැගුනු  සුසුම් පොදි
අන් සවනක ගැටෙන බවින් වලකාලනු රිසි
තලාපන් නුබේ අත්පුඩි මිතුරු රෑහැයියනි

නුදුරු දිනක ඈ නිදිගත් බිම්කඩ අයිනක
මගෙ යහනත් ඉදිවනු ඇත සුන්දර සවසක
පෙම්වත් සඳ නැගෙන එවන් අරුමැසි යාමෙට
නොවරදවා පැමිණෙනු මැන එදින සාදයට

**පී. සී. සඳමාලි**

**Feelings of Mother Lanka**

Love will ooze from my heart
As I cared from the start
Towards all my children dear
Be they brown, black or queer

With a heart that bleeds
And eyes that feed
On my unlucky sons and daughters
Who enjoy my gradual slaughter

Colour, caste or creed
Love is all you need
So, save your beloved mother from gloom
Before she falls into her tomb

**Samanthi Bandara**

## <u>නොකී කථාව</u>

පිපී තම හිස වැනී හිනැහෙන
නොබෝ දිනකදී වැටී පරවෙන
මලක් පිලිබඳ කතාවක් ඇති
කියාගන්නට බැරුව ගහකට

බලාගෙන ඉඳ බැරිම විටකදි
හඬාගෙන බිම වැටුන තරුවක්
පෙම් කරපු හැටි හඳේ හාවට
කවද හරි සඳ කියා දේවිද

ගෙවාගෙන දස දහස් ගව් දුර
සොයාගෙන සිත නිවන වැලිබිම
බිජු දමා යන කැස්බෑ දිවියක
සිතේ ආලය වෙරළ දුටුවෙද

හිතේ ගුලිකල මතක පොකුරක
නවාතැන වුන පුංචි කවියක
යටින් සැඟවුනු කඳුලු කැටියක
උණුසුමේ බර තව නෙතක ගැටෙවිද

**පී. සී. සඳමාලි**

**<u>සුබ අනාගතයක්...</u>**

යදම් බිඳලා යන්න - සිහින සපුරාලන්න
බැරිද අපහට ලොවේ - සිතැඟි ලෙස ඉගිලෙන්න
අප මැවූ ලෝකයේ - සොම්නසින් හිනහෙන්න
කෝ ඉඩක් ලැබුනාද? - හදවතින් විමසන්න

විදින විදවන මිනිස් - බැමි පවුරු අතරමඟ
කොටු වෙච්ච රාමුවෙන් - එලි බහින්නේ කෙලෙස
නැවුම් අදහස්වලින් - පිබිදෙන්නෙ නැතිද සිත
මෙලොව දිවි තිබෙන තෙක් - ඉවසමුද සියලු දුක

ජීවිතේ මංපෙතේ - අඩුලුහුඩුකම් ඇතේ
ආදරේ මිතුදමේ - බලය එකලෙස සිතේ
වීර්යක් නොගෙන මුත්- පැතුමකින් සිතු ලෙසේ
සියලු දේ වෙනවනම් - අපි අංක එක ලොවේ....

**දිනේෂි හෙට්ටිආරච්චි**

**<u>කඳුකර දියණිය</u>**

තුංග කන්දෙන් උදා වී ආ හිරු කිරණ
දවයි හිමපිණි රැඳී වුන් තුරුපත් අතර
මීදුම කපාගෙන වැටෙනා රැස් දහර
මවයි පියකරු දසුන් නෙත තුටු කරන

නේක තුරු වැල් පලඳා මල් තම සිරස
නිවා සරතැස කැන්දාගෙන එයි මදහාස
ගලා යයි දියවැල් ලබමින් ලක්මව පහස
ගෙන දී සිසිල් පැන් කරමින් වතු සශ්‍රීක

නීල හරිත පැහැයෙන් පිරි නුබගේ ගත
මනමත් කරයි දුටු දන මන දැහැන් බිඳ
කඳුකර දියණි නුබ සුන්දර ලක්මවගෙ දුව
පණ මෙන් රකිමු ඇය වෙයි අප ගත පණ නහර

**පී. සී. සඳමාලි**

**<u>වග්ගුඩු සංගමය.......</u>**

වග්ගුඩු සංගම් - සෙල්ලම් සංගම්
අලුත් නිලදරුවෝ පැමිණෙනවා
අලුත් උනත් ඒ තනතුර පමණයි
ගියවර වෙන තනතුරු දැරුවා....

පිටරට වල සිට ලැබෙනා මෙරටට
ඩොලර් ටිකට කෙල හල සිටිනා
පිටරට වල ඇති තරග මුවාවෙන්
රට යන ආසාවන් බොහොමා ......

වග්ගුඩු ගසනා මේ ළමුන් හට
ඉඳ සිට තරග දෙකක් තබලා
ඒ වෙනුවෙන් ලොකු මුදලක් වැය වූ
බව පෙන්වා කොටසක් හංගා .....

අව් වැසි පින්නේ සිටින පුහුණුකරු
සැමට කිසිත් කිසිවක් නොබෙදා
සීත කාමරේ වක්ගුඩු ඔපිසියෙ
සිටින අයම වලදති සැමදා......

වග්ගුඩු ගසනා ගමේ දරුවො ටික
පෙන්වා පිටරට තරග වෙතා
හිතවත් නගරේ කවුරු කවුරු හෝ
ගෙනයති පිටරට දිනුම නැතා.....

වග්ගුඩු සංගම් - සෙල්ලම් සංගම්
සමගින් සෙල්ලම් නිරන්තරේ
ලොකු පුටුවල අය දිවි රැක ගන්නා
තැනක් පමණි ක්‍රීඩා වතුරේ....

**ඩයනා නිරෝෂනී**

**අහඹු හමුවීම........**

ගණකාධිකාරි ලෙස
යොදා නිල මුද්‍රාව
ඔබේ නම අත්සනද
යෙදූ ලිපි ඇතුලත් වූ
ලිපිගොනුව තුල දෙනෙත්
රදවමින් සිටියාට
මගේ සිත අතීතේ
සරසවියෙ දුවනවා.....

රීඩ් මාවත පුරා දම් පාට මල් විසුල
මාර ගස් වියන යට
ඇවිදිමින් ඇතැම් දින
තුම්මුල්ල හංදියට
පැමිණෙනා තුරාවට
දෙඩූ බස් ලිපිගොනුව
මැදින් මට ඇසෙනවා.....

සිහිනෙකින් වත් නොසිතූ
වැරදි පවසා එකල
සරසවියේ නිම වෙත්ම
දුරස් වී මගේ සිත
දවා හලුකර දමා
ඇගේ පෙම්වතා වූ
දවස් යලි පෙනෙනවා.....

ටොරින්ටන් පෙදෙසේම
මේ අමාත්‍යාංශයේ
තෙවැනි මහලේ සිටින
ඔබගේ වැඩ නිරන්තර
ස්ථාන මාරු ලැබ නොබෝදා පැමිණි මම
පළමු මහලේ ඉදන්
විගණනය කරන බව
ඔබ තාම දන්නෙ නෑ
ලිපිගොනුව කියනවා.....

**ඩයනා නිරෝෂනී**

**සංසාර ගමන**

ආයේ ආයෙත්
හමුවේවි අපි
යනතුරා මේ
සංසාර ගමනේ

හිනැහි හිනැහි
ළංවේවි අපි
බැඳී සෙනෙහෙන්
පෙරදාක වාගේ

කඳුළ ඒවි
ඒ සතුට සමගින්
අත් බැඳන්
සුමිතුරන් ලෙසිනේ

හමුවීම එක්කම
සමුගැනීමත්
පිපුණු පෙති අග
ලියැවී තිබේ...

**පියුමි නිසංසලා පෙරේරා**

## <u>“එල්ලීලා” යන්නම ගිය හදාගත් පුතුට</u>

සඳත් හෙමිහිට බැස ගිහිංවද
ගණ අඳුර රජයන රැයේ
රැහැයියන්ගේ කයෝර ගී නද
බෙර හඬක් නැතිවම ගැයේ
හිතේ හංගං තියෙන පාළුව
නිදිවරයි තුන් තිස් පැයේ
මතක අතරින් හෙමින් සක්මන්
කලා නොගැඹුරු සඳ දියේ.....

පාලු සොහොනේ අලුත් වලකට
හිටවලා වතු සුදු අතූ
සොහොන්පල්ලට කියන්නට ඇති
වලේ සැතපෙන්නගෙ ගතූ
කෙනෙක් හිටියද මෙහෙන් යනකොට
අරං ගිය කිසිවක් හිතූ
නිමා වූයේ කාලයයි ඔබ
ලඟම දැවටෙන්නට පැතූ....

පැතුම් ගොන්නක් කර තබාගෙන
උස් මහත් වෙන තුරු හිටී
ඇද්ද දර දිය දවා අළුකර
දරු ගින්න ඇවිළු හැටී
ගියේ තනිකර දමා ඔබෙ ලොව
බබලවන්නයි හරි හැටී
කිසිත් නැතිවත් පුතේ හුස්මක්
ලඟින් තිබුණානම් වටී....

ඇඳේ අද්දර කොණක තනිවී
ගොතන්නට බැරි කටකතා
කොට්ට මෙට්ටත් හඬා වැටුනා
උඩුබැලිව නොකරම කතා
කඹය හයියට නොමැති හින්දද
වටේ ඇඳ රෙද්දක් ඔතා
ඔහොම දිරියක් කොහේ තිබුණද
කතා කරපන් මගෙ පුතා.....

අරං ආවේ හරි හැඩට බුමු-
තුරුණු පාවඩ අතුරලා
සියුමැලිම මල් පෙති වගෙයි රැක-
ගත්තෙ ඇකයෙහි රඳවලා
පාට රතු ලේ නොහැකි වූවත්
දෙන්න කිරකට හරවලා
බැරිවුනා මට හංගගන්නට
වැදූවෙ නැති මගෙ කුස පලා....

**රම්‍යා ලාලනී**

## <u>මිලින මල</u>

මොණරපිළ මෙන් තිබුණ වරලස - දකින අය හැරි හැරී බැලුවා
මුවැත්තිය මෙන් නීල දෙනයන - නිහඬ මොහෙතේ කතා කෙරුවා
මගදී හමු වී කතාබහ කළ - කොල්ලෙකුට බහදෙන්න හිතුණා
මහගෙදර හැර පලා එද්දී - යන්තමින් දහසයක් පිරුණා...

ඉන්න හරියට ගෙයක් නෑ - කුළියට ගත්තගෙයි ලයිට් නෑ
වහලෙ හිල් ටික වහලා නෑ - පොඩි වැස්සටත් නොතෙමෙන තැනක් නෑ
කුලී වැඩ හැමදාම නෑ - දවසක් වැඩ කලොත් දෙකක් නෑ
අඩුපාඩු මැද වුව කමක් නෑ - ආදරේ තිබ්බනෙ කාරී නෑ...

කාලයක් ගතවෙලා යනකොට - දරුවො තිදෙනෙක් හම්බෙලා
ගෙවල් දහපහළොවක හිටියා - දෙන්න කුළියක් නැති නිසා
හම්බකරනා හැම සතය මදි - බොන්න මිනිහා හුරු වෙලා
පැටවුන්ගෙ කුසගින්න වෙනුවෙන් - මහපාරෙ මං සිඟමන් කළා...

දරුවො දැක්කම පාරෙ යන එන - සැවොම අනුකම්පා කළා
දුන්නු හැම සත එකතු කරලා - උන්ගෙ බඩකට පිරෙව්වා
සීදේවි නෝනෙක් ඇවිත් දවසක් - වාහනෙන් බැස ලංවෙලා
ලොකු එකී ඉල්ලුවා දරුකමට - එක්කන් යන්න දෙන්නෙ'යි කියා...

ඒක අහලා පපුව මගෙ - හත්කඩට පැලිලා වගෙ ගියා
මොන ගින්න දැරුවත් දරුවො - විකුණන්නෑ කියා අදිටන් කලා
ඉස්කෝලෙ යන්නත් ඇහැක් වෙයි - පින්කාරී මගෙ ලොක්කී කියා
තළු මරණ මුදලට මහළුකා - අතහැරලා මං රෑ පිටවුණා...

ගැහැණියක දුක වටහගන්නට  - ඇහැකි ගැහැණිය ඇයයි අම්මා
ළඟට ගොස් පා නමැද අයදිමි - සමා, ඇය ගත හැකිය නම්මා
අහෝ! සුදු කොඩි වැටකඩොළු ළඟ - වැටෙන කඳුලැළි නැහැනෙ නිම්මා
ඇයත් හැරගොස් කරුමෙ මාගේ - හැරෙනවා මිස කොහේ යම්මා...

**ජී.කෞශල්‍යා මධුෂාණි**

**<u>දුව යන මුවකුට ලොබව</u>**

දුව යන මුවකු

දුටු සඳ

අත රැඳි පලා

විසි කර

අල්ලා ගතිමි සිර කර

ටික කලක්

    හිඳ

රහසේම පැන ගොසිනි

    ඌ

දුක් වූයෙමි.

දුව ගිය මුවා ගැන

සිහි කර නොව

    විසිකල

පලා ගැන සිහිකර..........

**දීපාල් නිශාන්ත**

## ළඟ නොමැති පළමු රැය

නොනිදනා හැම රැක - සොඳුරු කවි කතා කියන
අනේ නුඹෙ බෝල ඇස් - කෝලමින් ඉඟිපාන
නොදැක ඉන්නට තරම් - දූවේ වාවනු කොහොම
සත්තමයි හුරතලියෙ  - සිතින් නුඹෙ ළඟම මම...

එරෙන කිරි තද කරන් - තබා ආච්චිගෙ අතේ
මට වඩා සුරපුරක - නුඹව තැබුවා අගේ
මාස හත පිරෙන කොට - අම්මා ඔෆිස් ගිය දිනේ
උගත්තේ නුඹ මුල්ම පාඩම - දරාගැන්මයි මගෙ දූවේ...

හිමි හිමින් ලොකු වෙලා - පුංචි කුමරිය මගේ
තාත්තගෙ රුව ඇතිලූ - කෙනෙක් කියනා ඇසේ
අම්මා වාගෙම  කඳුලු හංගන් - හිණාවුණිදෝ දියණියේ
තවත් නම් බෑ ඉන්න මැණිකේ - දුවලා එන්නටමයි හිතේ...

ලෝකයක් නුඹෙ දෙපා - ළඟට ගෙනවිත් තබන
තාත්තිව හිනාවෙන් - හැඩ කළත් මගේ පණ
අම්මා ළඟ නෑ කියා - හිතින් දුක් වෙන තරම
සාක්කියි මගෙ දූවේ - බිත්තියේ ඇඳි සිත්තම...

කරුමයක් තමයි මේ - ලෙඩවීම සංසාරේ
තවත් දින දෙක තුනක් - ඉන්න වෙයි වාට්ටුවේ
තාත්තට වාරු වී - නිදියන්න පැංචියේ
හීනයක් වෙලාවිත් - නුඹව සනසමි රැයේ...

**ජී.කෞශල්‍යා මධුෂාණි පෙරේරා**

**<u>அன்பு….!</u>**

பூமியில் நாம் அவதரிக்க
பூரிப்புடன் ஈன்றெடுத்த அன்னையின்
முதல் அன்பு

அன்போடு அறிவையும் ஊட்டி வளர்த்து
அடிதவறி நிற்கையிலே அறிவுரை
நமக்களித்த தந்தையின் அன்பு

பள்ளிப் பருவம் முதல் பிரிந்திடா
சிந்தையுடன்
ஆறுதல் நமக்களித்த ஆறுயிர் நண்பன் மீது
நாம் கொண்ட அன்பு

இறைவன் அளித்த வரமென எண்ணி
இயற்கையை ரசித்திடவே இயற்கை மீது
நாம் கொண்ட அன்பு

கரம்பிடித்த தாரம் அதை – என்றும்
கைவிடவே மாட்டேன் என்ற தாரம் மீது
கொண்ட அன்பு

தந்தை என்றழைக்க தவமிருந்து
பெற்றெடுத்த தம் பிள்ளை மீது
நாம் கொண்ட அன்பு

செல்லமாய் கொஞ்சிட நாம் வளர்த்த
செல்லப்பிராணி மீது
நாம் கொண்ட அன்பு

நம்பிக்கையுடன் புரிந்துணர்வும் ஓங்கி நிற்க
எண்ணங்கள் அலைபாய எம்மனம்
இணைந்திருக்க

நாம் கொண்ட நேசமும்
நாம் ரசிக்கும் ஒவ்வொன்றும் ஒரு வகை
அன்பே…..

**T.L. Floriya**

**<u>පෙරනිමිත්ත</u>**

දහවලේ හැම දවන හිරුමඬල
වැඩ මුරය නිමාකොට නික්මෙද්දි…
විඩාබර දෙනුවන් ක්ෂණයකින් සනසවන
කඩුපුල් සේපාලිකාවෝ විකසිත වන්ට
අතවනන ඇරඹුමම එළඹෙද්දි…
ඝන සීත වළාකුළු පටල සිපගෙන
හමා ඒන මදනලක පැටලෙද්දි…
ගුවන මවිත කරමින්  පවසන්නේ
රන්සේද සළු දරා සඳරාජනිය
තරු වරා පැමිණෙන බවට සලකුණකි

**එච්.එම්. ගනේෂා දිල්හානි විජේරත්න**

**<u>මම තාමත් හොයනව</u>**

ජීවිතේ ගොඩක් තැන් තිබුන
හුගක් රිදුණු...
ඉස්සරහටවත් ආපස්සටවත් එක අඩියක්වත් තියන්න බැරුව ගල් වුණු.....
ඒත් මං මුකුත් නොවුනු ගානට
මගේ හිත ගිලගත්ත...
ලේසියෙන් නෙමෙයි මහ අමාරුවෙන්......
ඒ හැම තැනකදිම මට හිතුන ඇයි මටම මෙහෙම වෙන්නෙ කියල...
හිත හදාගත්ත ආයිත් එහෙම වෙන එකක් නෑ කියල...

ජීවිතේ තිබුණ අතහරින්න ඕනිම බැදීම්
ඒත් කවමදාවත් බැරි වුනා අතහරින්න....

ජීවිතේ තිබුණ සමහර තැන්
කිසිම වරදක් නොකරම නොසෑහෙන්න දඬුවම් විදපු..
ඉවසුව හැමදේම හරියයි කියල දවසක.....
බලන් ඉන්නව මම තාමත් එනකන් ඒ දවස....

නොකිවුවට ...
නොදන්නව උනාට..
සමහර අය තාමත් අපේ හිත් අස්සෙ හරි පරිස්සමට ඉන්නව...
හිත අස්සෙ ඉන්නකොට අහන්න හිතෙනව..
"නවතින්න හිතුනාද ආයෙමත් ආදරෙන් " කියල

මේ හැම හැඟිමක් අස්සෙම
මම තාමත් හොයනව.
ඉස්සර හිටපු මාව.........

**කේ. කේ. එල් රසාංගිකා**

## බඹර සන්දේශය

**01.** හරිත තුරු හිස් පිරී දිදුලන සිංහරාජේ නිවහනේ
සියල් සුමිතුරු ඥාති පිරිසම එකම පොකුරක වසමිනේ
සොයා මල්පැණි පිරී රොන්සුනු තුඩග තුඩගින් , තබමිනේ
සිටින තර මේ සංදේශෙ කියවා බලන් සැම’ බඹරාණනේ

**02.** ඉපදි කිරිකැටි බිළින්දාටත්, ඉපදෙන්න සිටිනා බිළිඳටත්
පුදන්නට මේ උතුම් භූමිය යුතුකමකි රැකගැනීමත්
සිතා එනු මැන කෙටි කලක් තුල හැකිය නැවතත් යාමටත්
බඹර මල් පැණි සමඟ විස තුඩු රැගෙන එනු මැන වී පිටත්

**03.** විසම දළ ඇති බඹර පිරිසේ සැවොම ආ යුතු පුරවරේ
කෝට්ටේ දියවන්නාව මැද ඇති නීති සකසන මන්දිරේ
ඇන කොටාගෙන දශක හතකම ,නිදි කිරාගෙන , මන්තරේ
තාම මතුරන රටම විකුණන අයට විසතුඩු , තබන්නේ

**04.** මෙපිරිසේ මැද එක් අයකු හෝ රටට ආදර හැඟීමෙන්
සිටීනම් ඒ උතුම් මුව මත තබන් මල් පැණි සීරුවෙන්
පියාඹා දියවන්නාව මැද්දෙන් නැවත එහි යන අදිටනින්
ඉසුරුපායද පායවල් වෙත ,සුහුරුපායද , පියාඹන්

**05.** රාජකාරී වේලාවේදී නොකර එම වැඩ කල් මරන්
අල්ලසක් ඉවකරන නැතිනම් තලා පෙලනා , මහජනන්
දුටුවොතින් නිලදරුවො බඹරිඳු ඔබේ විස තුඩු තබාපන්
උන්ගේ මුහුණත නැවත කිසිදින ඒ වරද නොම වන ලෙසින්

**06.** මෙවන් තැන්වල කුසපොත්ත ඇලි වේලකුදු බත නැති ලෙසින්
සේවේ කරමින් ඇතැම් අය ඇති පංච සීලෙම රැකීමෙන්
අනේ උන් මුව තබා මල්පැණි බිඳක් හෝ බඹරිඳු තුඩින්
පියාඹා යනු මැනවි රැනම මෙසිරිලක රෝහල් සොයන්

**07.** වැනල් සේවේට හිනාවී ගොස් රවා ඔරවන රෝහලේ
වෙදදුරන් ඇති සේවේ පැහැරන අනිනු විස උන්ගේ තොලේ
ගේන බේතට කොමිස් ගසමින් කපුටො ඇත නිලදරු තලේ
සත් වරක් විද එවන් පිරිසට තබනු මැන නයි විස දලේ

**08.** බෙහෙත් පෙත්තක්, ඇඳක් වත් නැති බංකුවේ බිම රෝහලේ
රෝගී ජනයා කෙඳිරිගාමින් යදියි පණ නල රෝහලේ
එවන් මුව මත තබා මල් පැණි රකිනු ජීවිත වාතලේ
ඉතින් යනු මැන බඹර රැනම රටේ හැම තැන සිප්හලේ

09. පාසලේදී නොකර නිසිලෙස සේවේ ටියුෂන් උපරිමේ
තලා පෙලනා නොඑන ටියුෂන් සිසුන් හට දී දඬුවමේ
දුටුවොතින් ඒ වගේ ගුරුහොරු තබා විෂ උන්ගේ සමේ
දෙවිවරුන් වැනි ගුරුවරුන් මත තබන් සුවඳැති මල් මුවේ

10. මහන්සියි නම් පියාඹා දුර, විවේකය ගෙන එනු යලී
පොලීසියඅධිකරනෙ වැනි තැන් වලත් පි ,යඹනු නොම මැලී
බලවතුන් දෙස් පාලුවන් හට ඇති සමා නැත පොඩි වන , තැලී
අසරනුන් හට රිදවනා නිලදරුවො හට විස තබනු යලී

11. පියාඹා යලි මල් උයන් වතු සොයා මල්පැණි තුඩු පුරා
රුස්කරන් විත් එන්න බත්තරමුල්ල පෙදෙසට පිරි වරා
හැරී පොල්දූවේ හංදියෙන් ජාතික විගණන කාර්යාලය කරා
බලන් සැඟවී එකාවන් නිලදරුවො වෙහෙසන අයුරු හොඳහැටි සිත් පුරා

12. මිලියනද බිලියනද පරදා වංචා දූෂණ පිරුණු තැන්
පීරමින් සොයලා සකස් වන වාර්තා මත ඇස් තබන්
පලක් වුවද නොසිතා සිත තබා අරමුණු ,නැතත් , වෙතින්
සිටින විගණන නිලදරුවො මුව මත තබන් මල් පැණි සීරුවෙන්

**ඩයනා නිරෝෂනී**



## <u>නැවතුමක් නැති මංසලේ</u>

සමහරක් තැන් දිවිමගේ...
විඩාවයි හරි පාළුවේ......
නැවතුමක් නැති මංසලේ....
ඇති හිතෙයි දැන් ජීවිතේ....

බැඳුණු තැන් සිත මගෙ ලොවේ....
හරි බරයි, මට දැන් දැනේ....
අරන් යන්නට හිත මගේ...
එන්නෙ කවදද  හිමියනේ..

**කේ. කේ. එල් රසාංගිකා**

## සිකුරාදා හැන්දෑව

නිමක් නැති දිවි සැරිය - විඩා නිවනා මෙහොත
ආදරෙයි හැමදාම - සිකුරාදා හැන්දෑව
සතියේ මුළු දින හතම - එක දිගට වැඩ අතර
හිත ඇසිල්ලක් ගෙනෙන - සිකුරාදා හැන්දෑව....
“කොණ්ඩයක් අද බදිමු” - චූටි දූ සුරතල්ය
නොදුටු මුත් මුව පොඩිය - තව වැඩක් වැඩි වුණිය
දෙවෙනියගෙ බෝතලය - මේස් දෙක දෙතැනකය
අත් දෙකත් මට මදිය - හැමෝටම කඩිමුඩිය .....
හයට ලොකු දුව දුවයි - ඇගෙ කෑම දිය යුතුය
හතට පොඩි දෙන්නාම - රැගෙන පිට විය යුතුය
දූලාගෙ තාත්තට - උදේ හරියට වැඩය
පණස් නවයයි හයයි - දුවන්නේ එතකොටය ....
මේ දුවන වේගයට - හැපුනොතින් විසි වේය
තවත් අත් දෙකක්වත් - තිබුණොතින් සෑහේය
හැඳි වළන් මගෙ යාළු - කුස්සියේ පෝලිමය
බේසමේ කිළුටු රෙදි - ඔච්චමට ඔරවාය
කමක් නෑ මට ඉතින් - දුකක් නම් නොදැනේය
දැන් හොඳම අම්මාය - සිකුරාදා ආවාය .....

බී.එල්. කළුආරච්චි

**වීපීයේ දියණියනි**

කටු අකුල් මැද ඇවිද යන විට
පතුල් කැපුණත් දියණියේ
ඉවසපන් නුඹ හිතට දිරිගෙන
නොහෙලා කඳුලක් ඔය නෙතේ

වීපී කොන ලැග වේල් ගානක්
ඉන්න වුවත් හාමතේ
ගලක් කරගන් සුසුමකට ඉඩ
නොතියා නුඹගේ හදවතේ

ගෝනි බිල්ලන් ඉදී හැංගී
අඳුරු ගොම්මන් කලුවරේ
ඩැහැ ගන්න ඉඩකඩක් නොතබන්
නුඹ යනෙන විට මාවතේ

කානු පල්ලට විසි කෙරුවත්
කඩමාලු දවටා ගතේ
වැටුනු තැන නුඹ පිපී දිලියන්
සුවඳ විහිදා දස අතේ

**ගිවෝන් යානිකා නන්දසේන**

## ☺ඇමුණුම්

## <u>ජාතික විගණන කාර්යාලයේ ඉතිහාසය</u>

අතීතයේ "සිලෝන්" නමින් හඳුන්වනු ලැබූ ශ්‍රී ලංකාවේ වර්තමාන ජාතික විගණන කාර්යාලයේ ආරම්භය බ්‍රිතාන්‍ය පාලන සමය තරම් ඈතට දිවයයි. පවතින වාර්තාවලට අනුව වර්ෂ 1796 දී දිවයිනේ මුහුදුබඩ පළාත් බ්‍රිතාන්‍යයින්ගේ ආධිපත්‍යයට යටත් වීමෙන් වර්ෂ තුනකට පසු 1799 වසර වන විට සෙසිල් ස්මිත් නම් වූ පුද්ගලයෙක් විගණකාධිපති වශයෙන් සේවය කොට ඇත. ඔහුගේ තනතුරු නාමය ගණකාධිකාරී සහ විගණකාධිපති වශයෙන් හඳුන්වනු ලද නමුත් ඔහු ඉටුකළ රාජකාරියේ ස්වභාවය පිළිබඳ නිශ්චිත තොරතුරු හමුවී නොමැත. ඔහුගේ තනතුරු නාමයට අනුව ඇතැම්විට ඔහු නමින් භාණ්ඩාගාරයේ ගණකාධිකාරීවරයා ලෙස ද භාණ්ඩාගාරයේ ගිණුම් ද ඇතුළුව රජයේ ගිණුම් සම්බන්ධයෙන් වගකීම දරන විගණකාධිපති ලෙස ද ද්විත්ව රාජකාරියක් ඉටුකරන්නට ඇති බවට අනුමාන කළ හැකිය. වත්මන් තත්ත්වයට අනුව එවැනි සැලැස්මක් ස්වාධීන සහ ඵලදායී විගණන ක්‍රියාවලියක් සඳහා උර දෙන්නන් වශයෙන් සැලකිය නොහැකිය.

වර්ෂ 1806 දී ගිණුම් කටයුතු විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ රාජකාරියෙන් ඉවත් කිරීමෙන් පසු තනතුරු නාමයේ වැදගත් වෙනසක් ඇතිකරනු ලැබීය. එහිදී තනතුරු නාමය සිවිල් විගණකාධිපති වශයෙන් වෙනස් කරනු ලැබීය.

බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් රාජකාරියේ විෂය පථය පුළුල් කිරීම සම්බන්ධයෙන් තීරණය ගන්නා තුරුම විගණන කාර්යාලය අඛණ්ඩව වසර 35 ක කාලයක් පුරා වෙනම ඒකකයක් වශයෙන් පැවතුණි. පසුව වර්ෂ 1841 දී එය භාණ්ඩාගාරයේ අංශයක් සමග ඒකාබද්ධ කර එය රජයේ ඉහළ නිලධාරියෙකුගේ යටතට පත් කරනු ලැබීය. ඒ වන විට ඔහු විගණකාධිපති, ගණකාධිකාරී ජනරාල් හා ආදායම් පාලක යන ඉහළ තනතුරු 3 ක් හොබවමින් සිටියේ ය. ආදායම් පාලක වශයෙන් මෙකී නිලධාරියා දරන ලද ඉහළ තනතුර හේතුවෙන් ඔහුට ඒ වන විට රාජ්‍ය පාලනය කරනු ලැබූ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලකයින්ගේ විධායක සභාවේ සාමාජිකත්වය ද හිමි විය. නිසැකයෙන් ම මෙය විගණකාධිපති තනතුරේ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ඉවහල් වී ඇති අතර විගණන ක්‍රියාවලියේ ඵලදායීතාවය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී එය ප්‍රතිගාමී තත්ත්වයක් ලෙස සැලකිය නොහැකිය.

වර්ෂ 1907 දී විගණන කාර්යාලය භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් වෙන්කිරීමට උචිත පියවර ගන්නා තුරු ම වර්ෂ 66 ක කාලයක් පුරා විගණන දෙපාර්තමේන්තුව අඛණ්ඩව මෙකී සැලසුම අනුව ක්‍රියාත්මක විය . මෙම දූරදර්ශී තීරණය වැඩබලන යටත්විජිත ලේකම් විසින් පහත දැක්වෙන පරිද්දෙන් ප්‍රකාශයට පත් කරන ලදී. "අති උතුම් ආණ්ඩුකාරතුමා විසින් යටත්විජිත රාජ්‍ය ලේකම්ගේ අවසරය මත 1907 මාර්තු මස සිට විගණකාධිපති, ගණකාධිකාරී ජනරාල් සහ ආදායම් පාලක යන තනතුරු තනි නිලධාරියෙකු විසින් දරනු ලැබීම නැවත්වීමටත් ඉදිරියේ දී (අ) ආදායම් පාලක (ආ) යටත්විජිත විගණක යනුවෙන් හැඳින්වෙන වෙනම තනතුරු දෙකක් ඇතිකිරීමටත් ගණකාධිකාරී ජනරාල්ගේ රාජකාරී භාණ්ඩාගාරය විසින් ඉටු කළ යුතු බවටත් සතුටින් නියෝග කරනු ලැබේ."

විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ තනතුරු නාමය ද යටත්විජිත විගණන වශයෙන් වෙනස් කරන ලද බව ද සඳහන් කළ යුතු ය.

එතැන් සිට මෙම දෙපාර්තමේන්තුව වෙනම ම ක්‍රියාත්මක වූ අතර 1931 දී ඩොනමෝර් ව්‍යවස්ථාව හඳුන්වා දීමත් සමග මෙහි ප්‍රධානියාගේ තනතුරු නාමය විගණකාධිපති වශයෙන් වෙනස් විය. මෙම තනතුරු නාමය අද වන විටත් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ. ඒ දක්වා විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුර දරනු ලැබුවේ බ්‍රිතාන්‍ය ජාතික නිලධාරියෙකු විසිනි. ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ පත්වුණ ප්‍රථම විගණකාධිපති මෙන්ම මෙරටේ එම තනතුර දැරූ ප්‍රථම ජාතිකයා වූයේ ඕ.ඊ. ගුණතිලක මහතා ය. (පසුව ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක විය) එමෙන්ම ඔහු 1948 දී බ්‍රිතාන්‍ය ජාතිකයන්ගෙන් නිදහස දිනාගත් මෙම දිවයිනේ ප්‍රථම අග්‍රාණ්ඩුකාරවරයා ද විය.

ගණකාධිකාරී සිට විගණකාධිපති මෙන්ම යටත්විජිත විගණක තනතුර දක්වා විවිධ වූ තනතුරු දරන සියලුම පුද්ගලයන් මෙරටේ ව්‍යවස්ථාපිත ආයතනවලට වගකිව යුතු නොමැති වූ නමුත් මෙරටේ සිටින බ්‍රිතාන්‍ය නියෝජිතයන් හරහා බ්‍රිතාන්‍ය ආණ්ඩුවට වගකිව යුතු විය. කෙසේ වෙතත්, 1931 දී ඩොනමෝර් ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමත් සමග ප්‍රථම වතාවට විගණකාධිපති බ්‍රිතාන්‍ය ආණ්ඩුවට නොව මෙරටේ ව්‍යවස්ථාදායකයට වගකිව යුතු පුද්ගලයා බවට පත් කරනු ලැබීය.

1931 ඩොනමෝර් ව්‍යවස්ථාව මගින් විගණන කාර්යය සම්බන්ධයෙන් යම් ප්‍රමාණයක විස්තර ඇතිව අර්ථකතනය කොට ඇති අතර 1947 දී ඩොනමෝර් ව්‍යවස්ථාව වෙනුවට ගෙන ආ සෝල්බරි ව්‍යවස්ථාව මගින් විගණන කාර්යභාරය සහ එහි බලතල වඩා පොදු ස්වරූපයකින් ඉදිරිපත් කොට

ඇත. නිශ්චිත ප්‍රකාශනයක් වශයෙන් එමගින් විගණකාධිපතිවරයා වෙත විශාල ප්‍රමාණයක විෂය පථයක වගකීම පැවරීම පිළිබඳව සලකා බලා ඇත. මෙම ව්‍යවස්ථා දෙක මගින් විගණකාධිපතිවරයා විසින් රජයේ දෙපාර්තමේන්තුවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා ඇති නමුත් පළාත් පාලන ආයතනවල සහ රජයේ සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සඳහා එසේ විධිවිධාන සලසා නොමැත. 1972 දී එතෙක් සිලෝන් නමින් හැඳින් වූ මෙරට ශ්‍රී ලංකා ජනරජය වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන තුරු මෙම ආයතන පළාත් පාලන ආයතන හා රජයේ සංස්ථාවලට අදාළ නීති විධිවිධාන යටතේ විගණකාධිපති විසින් විගණනය කරන ලදී.

**ජාතික විගණන කාර්යාලයේ දැක්ම**

"ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ප්‍රතිලාභය උදෙසා රාජ්‍ය ගණන්දීමේ වගකීම සහ යහපාලනය පෙරදැරි කරගත් රාජ්‍ය අංශයේ මඟ පෙන්වන්නා වීම."

**ජාතික විගණන කාර්යාලයේ මෙහෙවර**

"ප්‍රශස්ත ගුණාත්මක විගණනයක් මෙහෙයවීම සහ පාර්ලිමේන්තුවට කාලීන හා නිරවද්‍ය වාර්තා ලබාදීම මඟින් යහපාලනය ප්‍රවර්ධනය කිරීම "

**ප්‍රධාන අගයන්**

| | |
|---|---|
| Graduation | විශිෂ්ටත්වය |
| Innovative | නවෝත්පාදනය |
| Leadership | නායකත්වය |
| Crosshairs | අවංකභාවය |

ISSN 2961-5224